# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2020-21


**මහින්ද රාජපක්ෂ, පා.ම.**
**මුදල් අමාත්‍ය**


**2020 නොවැම්බර් 17**

*2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2021 (4, 5 සහ 6 වගන්තිවලට අනුකූලව) සහ අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021 (7, 8 සහ 9 වගන්තිවලට අනුකූලව) ගරු මුදල් අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.*

**ISBN 978-955-0814-32-9**

කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල් අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

## පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාවය - 2020 | ix |
| **I කොටස** | |
| **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2021** | |
| **01. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය** | 1 |
| 1.1 සමාලෝචනය | 3 |
| 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් | 4 |
| 1.3 ප්‍රතිසංස්කරන ක්‍රියාමාර්ග | 6 |
| 1.4 ගෝලීය ආර්ථික තත්ත්වය සහ ශ්‍රී ලංකාව කෙරෙහි එහි බලපෑම | 10 |
| **II කොටස** | |
| **අයවැය, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021** | |
| **01. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය** | 17 |
| 1.1 සමාලෝචනය | 19 |
| 1.2 රජයේ ආදායම | 22 |
| 1.3 රජයේ වියදම | 38 |
| 1.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 41 |
| 1.5 විදේශ මූල්‍යයනය | 42 |
| **02. ආර්ථික උපනතීන්** | 49 |
| 2.1 සමාලෝචනය | 51 |
| 2.2 ආර්ථික වර්ධනය | 51 |
| 2.3 මුදල් අංශයේ වර්ධනයන් | 60 |
| 2.4 කොටස් වෙළෙඳපොළ | 62 |
| 2.5 විදේශ අංශයේ වර්ධනයන් | 62 |
| 2.6 ලෝක ආර්ථික සන්දර්භය | 65 |
| **03. රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය** | 67 |
| 3.1 සමාලෝචනය | 69 |
| 3.2 ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය දහය පිළිබඳ කෙටි හැඳින්වීම | 69 |
| **04. 2020-21 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක** | 77 |

## වගු


| | | පිටු අංකය |
|---|---|---|
| **I කොටස** | | |
| වගුව 1.1 | මධ්‍යකාලීන සාර්ව-මූල්‍ය රාමුව 2020 සිට 2025 | 5 |
| **II කොටස** | | |
| වගුව 1.1 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 19 |
| වගුව 1.2 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2020 | 20 |
| වගුව 1.3 | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සංක්ෂිප්තය | 23 |
| වගුව 1.4 | ආදායම් බදු කාර්යසාධනය | 24 |
| වගුව 1.5 | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 24 |
| වගුව 1.6 | නිෂ්පාදන බදු/සුරා බදු කාර්යසාධනය | 25 |
| වගුව 1.7 | මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම් | 26 |
| වගුව 1.8 | නිදහස් වෙළඳ ගිවිසුම් අනුව ලබාදෙන ලද තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම හා ආවරණය | 27 |
| වගුව 1.9 | ජාතිය ගොඩනැගීමේ බදු, මුද්දර බදු සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු කාර්යසාධනය | 28 |
| වගුව 1.10 | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු කාර්යසාධනය | 28 |
| වගුව 1.11 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2020 ජනවාරි සිට අගෝස්තු | 29 |
| වගුව 1.12 | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 38 |
| වගුව 1.13 | රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන්හි හැසිරීම (%) - 2019 සිට 2020 | 39 |
| වගුව 1.14 | සුබසාධන වියදම් | 40 |
| වගුව 1.15 | රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 41 |
| වගුව 1.16 | දළ දේශීය ණය මූලාශ්‍ර අනුව | 42 |
| වගුව 1.17 | විදේශ මූල්‍යයන එකඟතා සහ අදාළ මූල්‍ය කොන්දේසි - 2020 ජනවාරි සිට අගෝස්තු | 43 |
| වගුව 1.18 | විදේශ ණය හා ප්‍රදාන ප්‍රතිලබ්ධි - 2020 ජනවාරි සිට අගෝස්තු | 46 |
| වගුව 2.1 | ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි. ආංශික සංයුතිය | 52 |
| වගුව 2.2 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 56 |
| වගුව 2.3 | සංචාරක අංශයේ කාර්යසාධනය | 58 |
| වගුව 2.4 | ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 59 |
| වගුව 2.5 | මතුපිට, මූලික සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය: 2013 = 100) | 61 |
| වගුව 2.6 | ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම් | 62 |
| වගුව 2.7 | විදේශීය වෙළඳාම | 63 |
| වගුව 2.8 | තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2020 (පුරෝකථන) | 66 |
| වගුව 3.1 | විදුලි ජනන ධාරිතාවයේ සංයුතිය | 71 |
| වගුව 3.2 | රජය සතු ව්‍යවසායයන්හි ලාභදායීත්වය | 72 |
| වගුව 3.3 | රජය සතු ආදායම ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම | 74 |

## රූපසටහන්

පිටු අංකය

### II කොටස


| | |
|---|---|
| රූපසටහන 1.1 මුළු ආදායම් සංයුතිය - 2020 ජනවාරි සිට අගෝස්තු | 22 |
| රූපසටහන 1.2 මූලාශ්‍ර අනුව බදු ආදායම - 2020 ජනවාරි සිට අගෝස්තු | 22 |
| රූපසටහන 1.3 නිෂ්පාදන බදු/සුරා බදු කාර්යසාධනය - 2020 ජනවාරි සිට අගෝස්තු | 25 |
| රූපසටහන 1.4 මූලාශ්‍ර අනුව දළ දේශීය ණය - 2020 ජනවාරි සිට අගෝස්තු | 42 |
| රූපසටහන 1.5 අංශ අනුව ප්‍රතිලබ්ධීන් - 2020 අගෝස්තු | 47 |
| රූපසටහන 1.6 ණය ප්‍රදානකරුවන් අනුව සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල එකඟ වූ උපයෝජනය නොවූ ශේෂයන් - 2020 අගෝස්තු | 47 |
| රූපසටහන 1.7 අංශ අණුව සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල එකඟ වූ උපයෝජනය නොවූ ශේෂය - 2020 අගෝස්තු | 47 |
| රූපසටහන 2.1 දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 51 |
| රූපසටහන 2.2 දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2020 පළමු කාර්තුව | 51 |
| රූපසටහන 2.3 කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2020 පළමු කාර්තුව | 54 |
| රූපසටහන 2.4 කර්මාන්ත අංශයේ සංයුතිය - 2020 පළමු කාර්තුව | 55 |
| රූපසටහන 2.5 නිෂ්පාදන අංශයේ සංයුතිය - 2020 පළමු කාර්තුව | 55 |
| රූපසටහන 2.6 සේවා අංශයේ සංයුතිය - 2020 පළමු කාර්තුව | 56 |
| රූපසටහන 2.7 සේවා වියුක්තිය | 60 |
| රූපසටහන 2.8 පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 60 |
| රූපසටහන 2.9 මතුපිට, මූලික හා ආහාර උද්ධමනයේ විචලතා (පදනම : 2013 = 100) | 61 |
| රූපසටහන 2.10 වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම් | 64 |
| රූපසටහන 2.11 අපනයන සංයුතිය | 64 |
| රූපසටහන 2.12 ආනයන සංයුතිය | 65 |


## සටහන්


| | | |
|---|---|---|
| සටහන 1 | ආදායම් බදු ව්‍යුහය - 2020 සැප්තැම්බර් මස අවසානයේදී | 7 |
| සටහන 2 | කොවිඩ්-19 හමුවෙහි හඳුන්වාදුන් ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග | 11 |
| සටහන 3 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර් | 32 |


## ඇමුණුම්


| | | |
|---|---|---|
| ඇමුණුම I | භාණ්ඩාගාරය විසින් නිකුත් කළභාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව - සැප්තැම්බර් 2020 | 83 |
| ඇමුණුම II | සාර්ව ආර්ථික දර්ශක | 85 |
| ඇමුණුම III | ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන - 2021 | 93 |

# මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | 2019 | 2020 |
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු භාගය | % | 3.7 | -1.6 |
| කෘෂිකර්මාන්ත | පළමු භාගය | % | -3.5 | -5.6 |
| කර්මාන්ත | පළමු භාගය | % | 3.9 | -7.8 |
| සේවා | පළමු භාගය | % | 3.7 | 3.1 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) | සැප්. අවසානයට | % | 5.0 | 4.0 |
| උද්ධමනය (සාමාන්‍ය) | සැප්. අවසානයට | % | 3.9 | 4.7 |
| සේවා වියුක්ති අනුපාතය | පළමු භාගය | % | 4.7 | 5.7 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | පළමු භාගය | % | 52.6 | 51.0 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-අගෝ. | රු.බිලි. | -721 | -975 |
| මුළු ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 1,205 | 906 |
| බදු ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 1,105 | 801 |
| බදු නොවන ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 100 | 105 |
| මුළු වියදම | ජන-අගෝ. | රු.බිලි. | 1,927 | 1,884 |
| වර්තන වියදම් | ජන-අගෝ. | රු.බිලි. | 1,500 | 1,670 |
| රාජ්‍ය ආයෝජන | ජන-අගෝ. | රු.බිලි. | 435 | 228 |
| රාජ්‍ය ණය | ජුනි අවසානයට | රු.බිලි. | 12,646 | 14,261 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 8,030 | 6,445 |
| කෘෂි අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,667 | 1,516 |
| කාර්මික අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 6,330 | 4,906 |
| රෙදිපිළි හා ඇගළුම් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,737 | 2,853 |
| අනෙකුත් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,594 | 2,053 |
| ආනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 12,886 | 10,257 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,499 | 2,300 |
| අන්තර් භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 7,380 | 5,692 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,577 | 1,691 |
| ආයෝජන භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,002 | 2,253 |
| වෙළඳ ශේෂය | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | -4,855 | -3,812 |
| සංචාරක පැමිණීම් | ජන-සැප් | සංඛ්‍යාව | 1,376,312 | 507,311 |
| සංචාරක ඉපයීම් | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 2,594 | 956 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | ජන-අගෝ | ඇ.ඩො.මිලි. | 4,414 | 4,346 |
| කොටස් වෙළඳපොල විවිධ ආයෝජනය (ශුද්ධ) | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 15 | - |
| සමස්ත ගෙවුම් ශේෂය (BOP) | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,451 | -722 |
| දළ නිල සංචිත | ජූලි. අවසානයට | ඇ.ඩො.මිලි. | 8,347 | 7,096 |
| විනිමය අනුපාතය (මාසය අග) | සැප්. අවසානයට | ඇ.ඩො./රු. | 181.92 | 185.52 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය ) | ජන-සැප් | ඇ.ඩො./රු. | 180.77 | 185.03 |
| **මුදල් අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සැප්. අවසානයට | % | 7.00 | 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සැප්. අවසානයට | % | 8.00 | 5.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සැප්. අවසානයට | % | 5.00 | 2.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | සැප්. අවසානයට | % | 10.49 | 6.19 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ප්‍රදාන අනුපාතය (SLIBOR) (මාස 01) | සැප්. අවසානයට | % | 8.52 | 6.05 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | සැප්. අවසානයට | % | 7.62 | 4.51 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | සැප්. අවසානයට | % | 8.41 | 4.88 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | 2019 අගෝ./2020 අගෝ. | % | 7.7 | 17.5 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 2019 අගෝ./2020 අගෝ. | % | 7.0 | 5.2 |

| වගන්තිය | වගන්තිය | අවශ්‍ය අන්තර්ගතය | අනුකූලතාවය |
|---|---|---|---|
| 4, 5 සහ 6 වගන්ති | රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ භාවිතය ඇගයීමසඳහා සම්මතයක් ඇති කර ගැනීම සඳහාවන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 7, 8 සහ 9 වගන්ති | අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ඇගයීම සඳහා අවශ්‍ය අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | මහජනතාවට සහ විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 10, 11 සහ 12 වගන්ති | වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | වසරේ පළමු මාස හතරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | අදාල වර්ෂයේ ජූනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, මහජනතාවට නිකුත් කළයුතුය. එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 13, 14 සහ 15 වගන්ති | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව)* | පවත්නා වසරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍යක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැන ගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂිකවාර්තාව) | මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට පෙර මහජනතාවට නිකුත් කර එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 16, 17, 18 සහ 19 වගන්ති | පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සඳහා වන පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කිරීමේ ප්‍රකාශයෙන් සති තුනක් ඇතුළත රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරුඇතුළත් මැතිවරණ පූර්ව තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. නව පාර්ලිමේන්තුව රැස් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

* මුදල් ඇමතිවරයා විසින්
** මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින්

- **පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව** - 2020 වසරේ මාර්තු මස 23 වැනි දින මහජනතාවට නිකුත් කර ඉන්පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව** - මුදල් අමාත්‍යාංශයේ 2019 වාර්ෂික වාර්තාව, එම වසරේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2020 මැයි මස අවසන් වන විට මහජනතාවට නිකුත් කර, ඉන් අනතුරුව එය පාර්ලිමේන්තුව වෙත නිකුත් කරන ලදී.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව** - 2020 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2020 ජුනි මස අවසන් වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර ඉන්පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**මෙම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2020-21** හි පහත සඳහන් වාර්තා අන්තර්ගත වේ.

- **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2021**, මුදල් අමාත්‍යාංශය ඉදිරිපත් කරන මෙම වාර්තාවේ, සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී වැදගත් ලෙස සළකනු ලබන පුළුල් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් දක්වමින් රජයේ ප්‍රධාන ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

- **අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021**, මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මෙම වාර්තාවේ රජයේ ආදායම, වියදම සහ රජයේ ණය ගැනීම් යනාදියේ ඇස්තමේන්තු ඇතුලත් වන අතර, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ඇගයීමට පදනම් වන කරුණු ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

# 1 කොටස

## රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශන - 2021

### 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වර කියවන දිනයේ දී මුදල් අමාත්‍යවරයා විසින් රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන අතර ඒ අනුව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

අයවැය සඳහා පදනම් වූ පුළුල් ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් විය හැකි යැයි රජය විසින් සලකනු ලබන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාව මඟින් පැහැදිලි කරනු ලබයි.

# මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

# 01

### 1.1 සමාලෝචනය

2019 වසරේ අග භාගයේදී කොවිඩ්-19 වසංගතය ප්‍රථම වරට පැන නැගීමෙන් පසුව, මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාව වනවිට මෙම වසංගතයෙහි දෙවන රැල්ල මතු වී ඇත. මෙම පෙර නොවූ විරූ ගෝලීය සෞඛ්‍ය වසංගතය හේතුවෙන් 'අගුළු ලා දැමීම', 'සමූහ නිරෝධායනය' සහ 'සමාජ දුරස්ථභාවය' වැනි චර්යාත්මක වෙනසකට ලෝකය තල්ලු වී ඇත. 2020 වසරේ ඔක්තෝබර් මස අවසානය වනවිට රටවල්/කලාප 189 ක් පුරා ආසාදිතයින් මිලියන 51.4 ක් වාර්තා වී ඇති අතර, ජීවිත මිලියන 1.2 ක් අහිමිවී ඇත[1]. මෙම කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවට මිදීමට නොහැකි වී ඇති අතර, ජීවනෝපාය හා ව්‍යාපාර වෙත සහය වෙමින් ඒවා පවත්වා ගැනීමට මෙන්ම, සැපයුම් ජාල ක්‍රියාකාරිත්වය මනාව පවත්වා ගැනීම තහවුරු කරමින්, වෛද්‍ය හා සෞඛ්‍ය අංශ ආවරණය වන පරිදි බහුවිධ ප්‍රවේශයකින් යුක්තව ඊට පූර්ව ප්‍රතිචාර දක්වන ලදී.

මාර්තු මස අවසානයේ දී ශ්‍රී ලංකාව පූර්ණ අගුළු ලා දැමීමේ ක්‍රියාමාර්ග වෙත අවතීර්ණ වූ අතර, එම තත්ත්වය මැයි මාසය වන විට ක්‍රමයෙන් ඉවත් කෙරුණි. ඉන් අනතුරුව රට 'නව සාමාන්‍ය' තත්ත්වය යටතේ ක්‍රියාත්මක වෙමින් 2020 වසරේ අගෝස්තු මස දී සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ මහ මැතිවරණයක් පවත්වා නව රජයක් බලයට පත් විය. කෙසේ වුවද, 2020 වසරේ ඔක්තෝබර් මස අගභාගයේ දී මිනුවන්ගොඩ සහ පෑලියගොඩ ප්‍රධාන පොකුරු හඳුනා ගන්නා ලද අතර, ඒ හේතුවෙන් සීමා කිරීම් යළි පැන වුවද බොහෝ සීමාකිරීම් ප්‍රාදේශීයව ක්‍රියාත්මක විය.

අගුළු ලා දැමීම හා සමූහ නිරෝධායන ක්‍රියාමාර්ග යන්හි බලපෑම් හේතුවෙන් සැපයුම් දාම කෙරෙහි දැඩි බාධා එල්ල වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ සෑම ආර්ථිකයක්ම දැඩි කැලඹීමකට ලක් විය. මෙම තත්ත්වය දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු මෙතෙක් පැවති දරුණුතම අවපාතයට හේතු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය 2008/09 වසරවල පැවති මූල්‍ය අර්බුදයට වඩා දරුණු විය. ඉල්ලුම් සහ සැපයුම් දෙඅංශයේම කම්පන පිළිබිඹු කරමින්, 2020 වසරේ ලෝක ආර්ථිකය සියයට 4.4 කින් කඩා වැටෙනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2020 ඔක්තෝබර් මස "ලෝක ආර්ථික ඉදිරි දැක්ම" මගින් අවධාරණය කර ඇත. ඒ අනුව, එක්සත් ජනපද ආර්ථිකය සියයට 4.3 කින්ද, යුරෝපා ආර්ථිකය සියයට 8.3 කින්ද, එහි විශාලතම ආර්ථිකය වන ජර්මනිය සියයට 6.0 කින්ද සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන්දියාව සියයට 10.3 කින්ද, ජපානය සියයට 5.3 කින්ද සංකෝචනය වනු ඇතැයි පුරෝකථනය කළ ද චීනය සියයට 1.9 ධනාත්මක වර්ධනයක් අපේක්ෂා කෙරේ.

2020 වසර ආරම්භයේ දී ආර්ථිකය සියයට 4.5 ඉක්මවන වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කළ ද, කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමත් සමගින් 2015 වසරේ සිට 2019 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ දී පැවති මන්දගාමී වර්ධනයත් හේතුවෙන් 2021 වසර සඳහා වන වර්ධන අපේක්ෂාවන් නැවත සමාලෝචනය කර ඇති අතර, එය 2021 දී ආර්ථික වර්ධනය සියයට 5.0 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ආර්ථික දර්ශක අනුව 2020 වසරේ ජූලි මස සිට සැප්තැම්බර් දක්වා 'වී-හැඩැති'ව ආර්ථිකය යළි පිබිදීමක් පෙන්නුම් කර ඇත.

2019 වසරේ අයවැය හිඟය, දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස සියයට 6.8 ක් වුවද, ද.දේ.නි. යෙන් සියයට 2.8 ක් වූ සුවිශාල නොපිය වූ ගෙවීම් ද ඇතුළත් ව තත්‍ය ලෙස සමස්ත අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 9.6 ද ඉක්මවා ඇත. අතුරු සම්මත ගිණුම මගින් පනවන ලද සීමාවන් තුළ වුවද 2019 වසර දක්වා පැවති නොපිය වූ ගෙවීම් 2020 වසරේ දී පියවන ලදී. 2019 වසර අවසානය වන විට මධ්‍යම රජයේ ණය, ද.දේ.නි. යෙන් සියයට 86.8 දක්වා ඉහළ ගොස් ඇති අතර, ඉන් අඩක්ම විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගත් ණය විය.

සමස්ත ඉල්ලුම ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාව විසින් රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති උත්තේජන පැකේජ ක්‍රියාවට නංවන ලදී. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතය රට තුළට පැමිණීමට පෙර මසකට වඩා අඩු කාලයක් තුළ දී ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා 2019 වසරේ නොවැම්බර් බලයට පත් වූ රජය විසින් අඩු බදු අනුපාතික හා බදු කිහිපයකින් සමන්විත සරල බදු ක්‍රමවේදයක් සමගින් විශාල ප්‍රතිසංස්කරණ රාශියක් හඳුන්වා දෙන ලදී. සෞඛ්‍ය සහ ජීවනෝපාය සහන ක්‍රියාමාර්ග වලට අමතරව කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාවට බලපෑමෙන් පසු පැනනැගිව හැකිව තිබූ සුවිශාල රාජ්‍ය මූල්‍ය උත්තේජන පැකේජයන්හි අවශ්‍යතාව ද.දේ.නි. යෙන් සියයට 1.5 ක් පමණ වූ මුල් කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග හේතුවෙන් පැන නොනැගිණි.

2020 වසරේ මාර්තු මස සිට මේ දක්වා ප්‍රතිපත්ති අනුපාතික පදනම් අංක 250 කින් පහත හෙලීම මගින් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය සැපයීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 දක්වා අඩු කිරීම සහ විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඇතුළු ව්‍යාපාර සඳහා ණය සහන කාල ලබා දීම තුළින් අවශ්‍ය මුදල් ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාවට නංවන ලදී. 2020 වසරේ දී උද්ධමනය සියයට 4 සිට 6 දක්වා වූ ඉලක්කගත පරාසයක මැනවින් ස්ථානගත වනු ඇත.

පාර්ලිමේන්තුවෙහි තුනෙන් දෙකක බහුතර බලයක් හිමිවීම සහ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීමත් සමඟ රට තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ දී ජනාධිපතිවරයා වෙත සුවිශාල අධිකාරිත්වයක් පැවරීමත් සමඟ දේශපාලන ස්ථාවරත්වය තහවුරු වීමෙන් ව්‍යාපාරික විශ්වාසය තවදුරටත් ඉහළ නැංවී ඇත.

1. ජෝන් හොප්කින්ස් කොරෝනා වෛරස් පිළිබඳ සම්පත් මධ්‍යස්ථානය (John Hopkins Corona Virus Resource Center), 2020 ඔක්තෝබර් 25 වන දින ලබා ගන්නා ලදී.

ගෝලීය හා දේශීය වෙළෙඳපොළ තුළ වර්තමානයේ පවත්නා ගතිකත්වය රජයේ ආදායම් හා වියදම් තුලනය කිරීම කෙරෙහි මෙන්ම සමස්ත රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කෙරෙහි දැඩි අභියෝග එල්ල කර ඇත. තේරී පත් වූ නිලධාරීන් සඳහා නව වාහන සහ කාර්යාල පහසුකම් අලුතින් සපයා නොදීමත් සමග යථාර්ථවාදී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා සරල මෙන්ම පහසුවෙන් ක්‍රියාවට නැගිය හැකි බදු ක්‍රමයක් නිර්මාණය කිරීමෙන් ඉහළ සිට පහළට ගලායන ප්‍රවේශය තුළ වියදම තාර්කීකරණය ප්‍රධාන ප්‍රතිපත්තිමය අංගයක් වී ඇත. රටෙහි ව්‍යාපාර කටයුතු කිරීමේ දී මෙන්ම අගය එකතු කිරීම, කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීම කෙරෙහි බලපානු ලබන පවත්නා මුදල් රෙගුලාසි හා ඉඩම් ප්‍රතිසංස්කරණ නැවත සලකා බලන අතරම, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ දේශීය ප්‍රමුඛත්වය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශවල සිට විද්‍යුත් ප්‍රසම්පාදනය දක්වා ප්‍රතිසංස්කරණ දැනටමත් රජය විසින් ප්‍රකාශයට පත් කර ඇත. මේ අතර, 2019 වසර අවසානයේ දී අපේක්ෂා කළ ඉදිරි ප්‍රතිසංස්කරණයන්හි පවත්නා රාජ්‍ය මූල්‍ය භාවිතයන් ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා වැදගත් මෙවලම් වනු ඇති අතර, එය 2020 වසරෙන් ඔබ්බට පසු යහපත් බලපෑම් ඇති කරනු ඇත.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතට අනුකූලව සකස්කරන ලද 2021-2025 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව මෑත කාලීන වර්ධනයන් සැලකිල්ලට ගෙන සංශෝධනය කර ඇත. 2020 වසරේ දී නොපියවූ ගෙවීම් හැර අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.9 දක්වා ලඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යෙන් සියයට 2.6 සිට සියයට 5.4 දක්වා වැඩි කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය අවකාශයක් ලබාදීම සඳහා 2021 වසරේ දී අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 8.8 ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකතනය කර ඇත. වියදම් තාර්කීකරණය ඒකාග්‍රතාවත් සමඟ 2025 වසරේ දී අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 4.0 දක්වා සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම පසුබිම තුළ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති මාලාවේ ප්‍රතිපත්ති වලට අනුකූලව ආර්ථික පුනර්ජීවනයක් ලඟා කර ගනිමින් ඉහළ සහ ඒකාබද්ධ ආර්ථික වර්ධනයක් ඇතිකිරීම සඳහා රජය විසින් මධ්‍යකාලීන සාර්ව ආර්ථික ක්‍රමෝපායයන් සැලසුම් කරන ලදී. ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම, ජාතික සම්පත්හි ජනතා හිමිකාරීත්වය තහවුරු කිරීම සමගින් දේශීය ව්‍යවසායයන් ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම ප්‍රතිපත්තිය කේන්ද්‍රගතව ඇත. අගය එකතු කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන්වලට (SOEs) පහසුකම් සලසන අතරම, ඒවායෙහි ඵලදායීතාව ඉහළ නැංවීම ද ඊට ඇතුළත් කර ඇත.

## 1.2 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන්

රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතට අනුකූලව සකස්කර ඇති අතර එමගින් මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි පුළුල් සංවර්ධන අරමුණු වලට සහායදීම සඳහා අයවැය හිඟය සහ ඒ ආශ්‍රිත ණය ක්‍රමිකව අඩු කිරීමට අවශ්‍ය නීතිමය රාමුව සපයනු ලබයි. රජයේ ප්‍රධාන මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය අරමුණු අතර, 2025 වසර අවසානය වන විට අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 4 ක් දක්වා පහත හෙලීමත්, රාජ්‍ය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 75.5 ක මට්ටමක් දක්වා ගෙන ඒමත් ප්‍රධාන වේ.

මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව අනුව 2021-2025 සඳහා රජයේ ප්‍රමුඛතා වනුයේ:

- සියයට 6.0 කට වැඩි ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම.
- සේවා වියුක්තිය සියයට 4 ට අඩු මට්ටමක පවත්වා ගැනීම.
- උද්ධමනය සියයට 5 නොඉක්මවීම.
- 2025 දී රාජ්‍ය ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14 ට වඩා ඉක්මවීම.
- වියදම් තාර්කීකරණය කිරීම මගින් ඵලදායී නොවන වියදම් අවම කිරීමෙන් අයවැය තිරසාර මාවතකට යොමු කිරීම.
- අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 4 කට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.
- 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීම.
- 2025 දී රාජ්‍ය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 75.5 දක්වා පහත හෙලීම.
- තනි ඉලක්කමක පොලී අනුපාතයක් සහතික කිරීම.
- රුපියලේ විනිමය හුවමාරු වටිනාකම ස්ථාවරව පවත්වා ගැනීම.

ආර්ථිකයක වර්ධනයට අවැසි අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය සැලසුම් කරන ලදී. ඒ අනුව, පෞද්ගලික අංශයේ ආයෝජනයන් පූරණය කිරීමට යටිතල පහසුකම් හා බැඳි දිගුකාලීන ආයෝජනවල අවශ්‍යතාවක් පවතින පසුබිමක් තුළ රාජ්‍ය ආයෝජන වාර්ෂිකව ද.දේ.නි. යෙන් සියයට 5.0-6.0 කට වඩා වැඩි මට්ටමක පවත්වාගනු ඇත.

ග්‍රාමීය හා නාගරික මාර්ග සහ අධිවේගී මාර්ග ඇතුළත් කිලෝමීටර් 100,000 ක මාර්ග ව්‍යාපෘති ඒකාබද්ධ කිරීම, නල ජල සැපයුම් සියයට 75 දක්වා දෙගුණ කිරීම, කෘෂිකර්මාන්තය සඳහා ජලය සහ කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සැපයීම කෙරෙහි රාජ්‍ය ආයෝජන අවධානය යොමු කර ඇත. එමගින් කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ ඵලදායිතාවය කෙරෙහි සෘජු බලපෑමක් ඇතිවනු ඇති අතර එමගින් ආයෝජකයාගේ පළමු කාර්යභාරය රජය විසින් ගනු

වගුව 1.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අරමුණු - මධ්‍යකාලීන සාර්ව මූල්‍ය රාමුව - 2020 සිට 2025 දක්වා

ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස

| අයිතමය | 2019 තාවකාලික | 2020 ඇස්තමේන්තු | 2021 ඇස්තමේන්තු | 2022 පුරෝකථන | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|
| **මුළු ආදායම හා ප්‍රදාන** | **12.6** | **9.5** | **10.7** | **12.1** | **12.5** | **13.3** | **14.2** |
| **මුළු ආදායම** | **12.6** | **9.5** | **10.6** | **12.0** | **12.5** | **13.3** | **14.2** |
| **බදු ආදායම** | **11.6** | **8.5** | **9.4** | **10.5** | **10.9** | **11.6** | **12.5** |
| ආදායම් බදු | 2.8 | 1.9 | 2.1 | 2.2 | 2.4 | 2.6 | 3.0 |
| භාණ්ඩ හා සේවා මත බදු | 6.5 | 4.0 | 4.5 | 5.3 | 5.5 | 5.9 | 6.3 |
| විදේශීය වෙළඳාම මත බදු | 2.2 | 2.5 | 2.8 | 2.9 | 3.0 | 3.1 | 3.2 |
| **බදු නොවන ආදායම** | **1.0** | **1.0** | **1.3** | **1.5** | **1.6** | **1.7** | **1.7** |
| **ප්‍රදාන** | **0.1** | **0.0** | **0.1** | **0.1** | **0.05** | **0.04** | **0.04** |
| **මුළු වියදම** | **22.2** | **17.5** | **19.5** | **18.4** | **18.0** | **17.9** | **18.3** |
| **වර්තන වියදම** | **16.1** | **14.9** | **14.2** | **13.5** | **12.9** | **12.5** | **12.3** |
| වැටුප් හා වේතන | 4.6 | 5.0 | 4.9 | 4.7 | 4.4 | 4.3 | 4.1 |
| භාණ්ඩ හා සේවා | 1.2 | 1.0 | 1.1 | 0.8 | 0.7 | 0.7 | 0.8 |
| පොලී ගෙවීම් | 6.0 | 5.4 | 4.9 | 4.9 | 4.7 | 4.7 | 4.7 |
| සහනාධාර සහ පැවරුම් | 4.4 | 3.5 | 3.3 | 3.2 | 3.0 | 2.8 | 2.8 |
| **ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්** | **6.1** | **2.6** | **5.3** | **4.9** | **5.1** | **5.4** | **5.9** |
| රාජ්‍ය ආයෝජන | 6.2 | 2.6 | 5.4 | 5.0 | 5.2 | 5.5 | 6.0 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-3.6** | **-5.4** | **-3.6** | **-1.5** | **-0.4** | **0.8** | **1.9** |
| **ප්‍රාථමික ශේෂය** | **-3.6** | **-2.5** | **-3.9** | **-1.4** | **-0.7** | **0.0** | **0.6** |
| **අයවැය හිඟය** | **-9.6** | **-7.9** | **-8.8** | **-6.4** | **-5.4** | **-4.6** | **-4.0** |
| **අයවැය හිඟය මූල්‍යනය** | **9.6** | **7.9** | **8.8** | **6.4** | **5.4** | **4.6** | **4.0** |
| විදේශීය මූල්‍යනය (ශුද්ධ) | 3.6 | -1.4 | 0.5 | -0.2 | 0.1 | -0.1 | -0.1 |
| දේශීය මූල්‍යනය (ශුද්ධ) | 6.0 | 9.3 | 8.3 | 6.5 | 5.4 | 4.8 | 4.1 |
| **මධ්‍යම රජයේ ණය (ද.දේ.නි. % ලෙස)** | **86.8** | **95.1** | **96.3** | **92.4** | **88.1** | **82.3** | **75.5** |

*මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

* ඉහත ඇස්තමේන්තු සහ පුරෝකථනයන් 2020 සැප්තැම්බර් මස අවසාන තොරතුරු මත පදනම් වේ

ලැබීමත් සමඟ ජීවන තත්ත්වය ඉහළ නංවනු ඇත. රාජ්‍ය ආයෝජන මූල්‍යයනයේ දී සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් දේශීයව මූල්‍යයනය වනු ඇත.

පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීමේ රජයේ ක්‍රමෝපායයන් මධ්‍යකාලීනව ද.දේ.නි. යෙන් සියයට 14.2 සිට 2025 වන විට අවම වශයෙන් සියයට 12.3 දක්වා පහත හෙළීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ. විද්‍යුත් ප්‍රසම්පාදනය සහ විද්‍යුත් ජාතික හැඳුනුම්පත ඇතුළු ප්‍රධාන පද්ධති හා ක්‍රියාවලීන් ඩිජිටල්කරණය, වාහන හා අනෙකුත් වත්කම් මිලදීගැනීම සඳහා වැයවන වියදම් කපාදැමීම් මෙම ක්‍රමෝපායයන්වලට ඇතුළත් වීම තුළින් වියදම් තාර්කිකකරණයට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම පසුබිම තුළ, 2021 වසරේ දී රාජ්‍ය ආදායම ද.දේ.නි. යෙන් සියයට 9.5 ක් පමණ වනු ඇතැයි ද, බදු ධාරිතාව ඉහළ නැංවීම තුළින් අපේක්ෂිත වර්ධන විභවතාවයන් තුළ, 2025 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 14.2 දක්වා ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. එවැනි ක්‍රමෝපායයන් සපුරාලීම සඳහා, ආදායම් රැස් කිරීමේ දී පැන නගින ගැටළු විසඳීමට දැනටමත් පියවර ගෙන ඇත. වසර ගණනාවක් හුදකලාව ක්‍රියාත්මක වූ බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ එකිනෙකට සම්බන්ධ කරන පුළුල් ක්‍රමෝපායයන් තුළින් ආදායම පුළුල් වී ඇත. මේ සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT), උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) සහ රඳවාගැනීමේ බද්ද (WHT) වැනි ගෙවිය යුතු බදු ගණන අඩු කිරීමෙන් බදු ක්‍රමය සරල කිරීම, බදු උපකරණ කිහිපයක් ඒකාබද්ධ කිරීම (උදා: PAL අනුපාතය වැඩි කිරීම සහ NBT අනුපාතය ඉවත් කිරීම), ඇතුළත් වේ. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි විශාල බදු ගෙවන්නන්ගේ ඒකකය (LTU) පිහිටුවීම, අවදානම් පාදක කරගත් විගණනය හඳුන්වාදීම, කළමනාකරණය, පාලනය සහ මානව සම්පත් සංවර්ධනය සහ ආදායම් පාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ස්ථාපිත කිරීම ඇතුළුව ආදායම් පරිපාලනයේ ධාරිතා වර්ධන ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා රේගුව විසින් "තනි කවුළු පද්ධතිය" හඳුන්වා දී ඇති අතර, එය පද්ධතිය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. භාණ්ඩාගාරයේ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) ආයතන 45 ක් සඳහා ආරම්භ කර ඇති අතර, එය තවදුරටත් ආයතන 200 ක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ. මෙමගින් බදු උදෙය්ගීතාවය (Buoyancy) මධ්‍යකාලීනව ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ව්‍යවසායයන්හි ප්‍රතිසංස්කරණ (SOEs) රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන්හි ප්‍රමුඛ අංගයක් වේ. රාජ්‍ය ව්‍යවසායයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසුකම්ලත් වෘත්තිකයන් පත් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය තුළින් දැනටමත් ප්‍රතිලාභ ලබා ඇත. ඵලදායීතාවය

ඉහළ නැංවීම, උපායමාර්ගික නොවන වාණිජ ව්‍යවසායයන්හි හිමිකාරිත්වය පුළුල් කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ වියදම් අඩුවනු ඇතැයි ද එමගින් බදු නොවන ආදායමට සහ රජයේ වියදම් සඳහා ණය නොවන මූල්‍යකරණයට සහාය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

කෙසේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි (MTMFF) අපේක්ෂාවන් හා ඉලක්කවලට අවදානම් සහගත හා අවිනිශ්චිතතාවන් ඇති කරන ගෝලීය ආර්ථික පුරෝකථන මධ්‍යයයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී, කොවිඩ්-19 වසංගතයෙහි බලපෑම ප්‍රධාන අභියෝගයක් වී ඇත.

## 1.3 ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග

රජය විසින් බදුකරණය, වියදම් කළමනාකරණය, රාජ්‍ය ව්‍යාපාර, ප්‍රසම්පාදන හා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යන් යන අංශ ආවරණය කරමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ වර්තමාන ඉල්ලුමට සරිලන පරිදි ධාරිතා වර්ධනය සමඟින් ආයතනික, පරිපාලනමය, ව්‍යවස්ථාමය ඇතුළත් පුළුල් ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇත.

### බදු ප්‍රතිසංස්කරණ

බදු අනුකූලතාවය ඉහළ නංවන අතරම දූෂණයට එරෙහිව සටන් කිරීමට සහ ආර්ථික පුනර්ජීවයක් ඇතිකිරීම සඳහා නව රජයට බලයක් ලබාදුන් 2019 ජනාධිපතිවරණයෙන් පසු ශ්‍රී ලංකාවේ දිගුකාලීන බදු ප්‍රතිසංස්කරණ සිදු කිරීමට හැකි විය බදු ක්‍රමය සරල කිරීම, බදු අනුපාත අඩුකිරීම, සහ ආන්තිකව ආදායමක් උත්පාදනය කළ ඇතැම් බදු ඉවත් කිරීම අනෙකුත් ප්‍රතිසංස්කරණ අතර ප්‍රධාන වේ. මේ තුළින් බදු පරිපාලනය අභියෝගාත්මකභාවය අඩු කෙරුණි.

බදු ගෙවීම පහසු කරවීම සඳහා විද්‍යුත් බදු ගොනුකරණ පද්ධතිය (Electronic Tax Filing System) වැනි ක්‍රියාමාර්ග හඳුන්වාදෙන ලදී. බදු පද්ධතියට තාක්ෂණය මුසුකිරීම තුළින් කාර්යක්ෂමතාවය වර්ධනය වූ අතරම දූෂණය සඳහා වූ අවස්ථා ද අවම විය.

බදු ව්‍යුහය සරල කිරීම සඳහා ආර්ථික සේවා ගාස්තුව, ණය ආපසු ගෙවීමේ බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද වැනි බදු වර්ග කිහිපයක් ඉවත් කරන ලදී. පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව වසරකට රු. 500,000 සිට වසරකට රු. මිලියන 3 දක්වා වැඩි කරන ලදී. අනුක්‍රමික බදු අනුපාතය සියයට 6, සියයට 12 සමඟින් උපරිමය සියයට 18 ලෙස සංශෝධනය කර ලද අතර ආදායම් බදු ස්ථරය වසරකට රු. 600,000 සිට වසරකට රු. මිලියන 3 ක් දක්වා පුළුල් කරන ලදී.

සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාතික ව්‍යුහය සියයට 28 සිට සියයට 24 දක්වා අඩු කර ඇත. අපනයන, සංචාරක, අධ්‍යාපන, සෞඛ්‍ය සේවා, ඉදිකිරීම් සහ කෘෂි සැකසුම් යන අංශ සඳහා සහනදායී ආදායම් බදු අනුපාතය සියයට 14 ක් වන අතර නිෂ්පාදන කර්මාන්ත සඳහා අදාළ වන ආදායම් බදු අනුපාතය සියයට 18 ක් වේ. ඔට්ටු සහ සූදු, මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන සඳහා තවදුරටත් සියයට 40 ඉහළ බදු අනුපාතය ක්‍රියාත්මක වේ. ආර්ථික කටයුතු පුනර්ජීවනය සඳහා කෘෂිකර්ම, තොරතුරු තාක්ෂණය විදේශීය මූලාශ්‍ර වලින් උපයනු ලබන ආදායම් සහ අනේවාසික (NRFC) සහ නේවාසික (RFC) විදේශ ව්‍යවහාර ගිණුම් වෙතින් උපයන ලද පොලී ආදායම ඇතුළු ප්‍රධාන විභව අංශ ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

මත්පැන් සහ දුම්වැටිවල සිල්ලර මිල වෙනස් නොවන පරිදි, එකතු කළ අගය මත බදු අනුපාතිකය අඩුකිරීම සමඟින් ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම නිසා අහිමිවන ආදායමෙහි බලපෑම ගැලපුම් කිරීම සඳහා වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු අනුපාතිකය සියයට 7.5 සිට සියයට 10 දක්වා ඉහළ නංවන ලදී. කෙසේ වුවද, අමු ද්‍රව්‍ය, බොරතෙල් හා ඉන්ධන වැනි අන්තර් භාණ්ඩ මෙන්ම අයෝජන භාණ්ඩ යනාදී ආනයන මත සියයට 2.5, සියයට 5.0 සහ සියයට 7.5 ක් ලෙස ස්ථර 3 කින් යුත් සහනදායී බදු අනුපාතික ප්‍රදානය කරන ලදී.

2019 වසර අවසානයේ ජනාධිපතිවරණයෙන් පසු ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය උත්තේජන පැකේජයට අමතරව කොවිඩ්-19 වසංගතයට ගොදුරු වූ සැමට කඩිනම් සහන ලබා දීම සඳහා රජය විසින් කටයුතු කරන ලදී. කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයක් ලෙස 2020 වසරේ අප්‍රේල් මස 16 දින සිට බලපැවැත්වෙන පරිදි සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය වෙත ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂිත මෙවලම්, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. මේ අතර, ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත සමාගම් විසින් නිෂ්පාදනය කරනු ලබන පුද්ගල ආරක්ෂක මෙවලම් සහ සමාන උපකරණ, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව සහ කෝවිඩ් මධ්‍යස්ථානය වෙත සපයනු ලබයි නම් එම උපකරණ 2020 වසරේ අප්‍රේල් මස 29 දින සිට බලපැවැත්වෙන පරිදි රේගු බද්ද, එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සෙස් බද්ද ඇතුළු සියලු ආනයන බදු වලින් නිදහස් කරන ලදී. ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන්වල අඩුවීමේ ප්‍රවණතාවය සලකමින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය මත රේගු ආනයන බද්ද වැඩි වන පරිදි සංශෝධනය කරන ලද අතර ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය මත රේගු අධිභාරය වැඩි කරන ලදී. රේගු අධිභාරය තුළින් ජනිත වන ආදායම ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් අඩු වීම තුළින් වන ප්‍රතිලාභය ලබා ගැනීමට ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලට බැර කර ඇත.

සටහන 1 : ආදායම් බදු ව්‍යුහය - 2020 ඔක්තෝබර් මස අවසානය දී

| විස්තරය | බදු අනුපාතය (%) |
| --- | --- |
| **පුද්ගල ආදායම් බදු** | |
| ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන හෝ නොවන අය සඳහා බදු නිදහස් දීමනාව | රු. 3,000,000 |
| බදු අය කළ හැකි ආදායම | |
| පළමු රු. 3,000,000 | 6 |
| ඊළඟ රු. 3,000,000 | 12 |
| ඉතිරිය මත | 18 |
| **2020.04.01 සිට බලපැවැත්වෙන පරිදි අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හඳුන්වා දීම (ප්‍රාථමික හා ද්විතීය සේවා නියුක්තිකයන් සඳහා)** | |
| පුද්ගල බදු නිදහස් දීමනාව (වාසිකයන් නොවන පුරවැසියන් නොවන අය හැර) | රු. 250,000 |
| බදු අය කළ හැකි ආදායම | |
| පළමු රු. 250,000 | 6 |
| ඊළඟ රු. 250,000 | 12 |
| ඉතිරිය මත | 18 |
| **සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන සේවාස්ථ ප්‍රතිලාභ (විශ්‍රාමික, විශ්‍රාමික පාරිතෝෂික, සේ.නි.භා.අ. හෝ අනුමත වන්දි)** | |
| සහනදායී අනුපාත | |
| පළමු රු. මිලියන 10 | 0 |
| ඊළඟ රු. මිලියන 10 | 6 |
| ඉතිරිය රු. මත | 12 |
| **සම්මත අනුපාත**<br>සේවා අහිමි වීම සම්බන්ධයෙන් දේ.ආ.කො.ජනරාල් විසින් අනුමත කරනොමැති වන්දියක්, අර්ථසාධක අරමුදලෙන් ගෙවීමක් (පරිපාලිත නොවන) අනෙකුත් ගෙවීම් හෝ ඕනෑම මූල්‍යමය නොවන විශ්‍රාමික ප්‍රතිලාභයක් සඳහා අදාළ වේ. | |
| **ඔට්ටු ඇල්ලීම හා සූදු ව්‍යාපාර , ඕනෑම මත්පැන් හා දුම්කොළ නිෂ්පාදනය කර විකිණීම හා ආනයනය කර විකිණීම** | 40 |
| **සංස්ථාපිත ආදායම් බදු** | |
| **සම්මත අනුපාතයන්** | |
| සියළු සමාගම් (විශේෂ අනුපාතයන් යටතේ බදු අයකරනු ලබන සමාගම් හැර) | 24 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, භාණ්ඩ අපනයනය හා නිශ්චිත ව්‍යාපාර, සංචාරක ප්‍රවර්ධනය, ඉදිකිරීම් සේවා, කෘෂි සැකසුම්, සෞඛ්‍ය සේවා හා අධ්‍යාපන සේවා | 14 |
| නිෂ්පාදන කර්මාන්ත | 18 |
| කෘෂිකාර්මික ධීවර සත්ව පාලන තොරතුරු, තාක්ෂණ හා සක්‍රීය සේවා | නිදහස් |
| වෙළඳාම, බැංකු, මූල්‍ය, රක්ෂණ (සම්මත අනුපාතය) | 24 |
| ඔට්ටු ඇල්ලීම හා සූදු | 40 |
| ඕනෑම මත්ද්‍රව්‍ය හෝ දුම් කොළ නිෂ්පාදනය කර විකිණීම හා ආනයනය කර විකිණීම | 40 |
| **හවුල් ව්‍යාපාර** | |
| ඉතිරි බදු අයකල හැකි ආදායම (රු. 1,000,000 වැඩි නොවන) | 0 |
| රු. 1,000,000 ඉක්මවන (වැඩිවන රු. 1,000,000 මත) | 6 |
| **ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල්** | |
| ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ආදායම හැර | 24 |
| **පුණ්‍ය ආයතන** | |

සටහන 1 : ආදායම් බදු ව්‍යුහය - 2020 ඔක්තෝබර් මස අවසානය දී *(සම්බන්ධිතයි...)*

| විස්තරය | බදු අනුපාතය (%) |
|---|---|
| ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ආදායම හැර | 14 |
| **රාජ්‍ය නොවන සංවිධාන** | |
| ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ආදායම හැර | 24 |
| ප්‍රදානවලින් සියයට 3ක්, පරිත්‍යාග හෝ දායක මුදල් | 24 |
| **සේවා නි.භාර අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල් හෝ සමාපන අරමුදල්** | 14 |
| **ප්‍රාග්ධන වත්කම් මත ආදායම** | 10 |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී*

### බදු පරිපාලනය සඳහා ප්‍රතිසංස්කරණ

බදු ආදායම් පුළුල් කිරීම, බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය ඉහළ නැංවීම සහ වඩාත් කාර්යක්ෂම සේවා සැපයීම සඳහා වන ආයතනික ප්‍රතිසංස්කරණ රජය විසින් දැනටමත් හඳුනාගෙන ඇත. බදු පරිපාලනය නවීකරණය කිරීම, බදු ක්‍රමයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත. බදු පරිපාලනයට තොරතුරු තාක්ෂණය භාවිතය "බදු පරතරය" නොහොත් බදු ගෙවන්නන්ගේ අනුකූල නොවීම් අවම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. බදු අනුපාත අඩු කිරීම සහ බදු ක්‍රමයේ සංකීර්ණතාව අඩු කිරීම සමඟ ස්වේච්ඡාවෙන් අනුකූලවීම දිරිගැන්වීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි විශාල බදු ගෙවන්නන්ගේ අංශය වැනි බදු ගෙවන්නාගේ ආදායම් විභවයන් මත පදනම් වූ බදු ප්‍රතිකර්ම, දැනටමත් හඳුන්වා දී ඇත. බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, බදු ගෙවීම සහ ආපසු ගෙවීම ක්‍රියාවලිය, හිඟ බදු එකතු කිරීම, බදු විගණන හා දඩ මුදල්, බදු ගෙවන්නන්ගේ සේවා සහ මානව සම්පත් සංවර්ධනය දියුණු කළ යුතු අංශ ලෙස හඳුනාගෙන ඇත. ලියාපදිංචි කිරීම, ගොනු කිරීම සහ බදු ගෙවීම සහ අවදානම් පාදක විගණනය සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පද්ධති යොදා ගැනීම තුළින් සේවා සැපයීම ඉහළ නංවා ස්වේච්ඡාවෙන් බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙයට අමතරව, විශාල බදු පරිපාලන ඒකකය (LTA), ඉහළ ආයතනික ඒකකය (UCU), මධ්‍යම ආයතනික ඒකකය (MCU) සහ ප්‍රාදේශීය ආයතනික ඒකකය (RCU) ලෙස බදු ගෙවන්නන් කාණ්ඩගත කිරීම, ප්‍රධාන ප්‍රතිසංස්කරණවල අංගයක් ලෙස හඳුන්වා දිය හැක. එසේම, බදු පද්ධතිය වේගවත් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදායම් පාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) දෙවන අදියර ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ((EDSL) විභව ආදායම සුරක්ෂිත කර ගැනීම සඳහා ආදායම් අවදානම් කළමනාකරණ පද්ධතිය සහ සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතිය (ERMS) හඳුන්වා දීමට කටයුතු කරමින් සිටී. ශ්‍රී ලංකා රේගුව (SLC) ආයෝජන මණ්ඩලයේ සමාගම් වෙත ඔවුන්ගේ නැව්ගත කිරීම වේගවත් කිරීම සඳහා මාර්ගගත භාණ්ඩ නිෂ්කාශන ක්‍රමයක් හඳුන්වා දී ඇත. නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා සියළු අපනයන හා ආනයන බහාලුම් පරිලෝකනය කිරීම 2020 සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කර ඇති අතර මෙමගින් අහඹු පරීක්ෂණවල ප්‍රමාණය අඩු කර ඇත. රජය විසින් කෙරවළපිටියේ පූර්ණ පහසුකම් සහිත ඉඩමක් රේගු පරීක්ෂා අංගනයක් සඳහා වෙන් කර ඇති අතර භාණ්ඩ නිෂ්කාශනයන් කඩිනම් කිරීම සඳහා ස්වයංක්‍රීය බහාලුම් පරීක්ෂා කිරීමේ ක්‍රමයක් ආරම්භ කිරීමට නියමිතය. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (WTO TFA) ක්‍රියාත්මක කිරීමට සමගාමීව, ශ්‍රී ලංකා රේගුව "තනි කවුළු" (SW) පද්ධතිය ක්‍රියාත්මක කරමින් සිටී. එසේම මහා භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාරයේ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) 2020 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

### රාජ්‍ය වියදම් කළමනාකරණය

රාජ්‍ය වියදම් සහ ආදායම උපායමාර්ගික ප්‍රමුඛතා සමඟ සමතුලිත කිරීමට රජය කැපවී සිටී. වියදම් ඒකකවල වියදම් තාර්කිකකරණ ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කරන අතරම තෝරාපත් කරගත් නිලධාරීන් සඳහා නව වාහන මිලදී ගැනීම උපකරණ, හා ගොඩනැගිලි කුලියට ගැනීම හෝ මිලදී ගැනීම ඇතුළු වියදම් සීමා කිරීම ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංගයක් ලෙස හඳුනාගෙන ඇත. මේ සම්බන්ධව, රජය දැනටමත් ඩොලර් බිලියන 9 කට ආසන්න ණය මුදලක් යෙදවූ රාජ්‍ය ආයෝජන නැවත පරීක්ෂා කර හදිසි ප්‍රමුඛතා ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමටත් මූල්‍යමය හෝ ආර්ථිකමය වශයෙන් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් නොලැබෙන ව්‍යාපෘතීන් අවලංගු කරන අතරම ඇතැම් ව්‍යාපෘති පසුව ක්‍රියාත්මක කිරීම සඳහා කල්දමා ඇත. ව්‍යාපෘති සඳහා වැයවන පිරිවැය සහ සේවා කාලය ඇතුළු විදේශ මුදල් සහ ණය කොන්දේසි ද රජය විසින් සැලකිල්ලට ගනු ඇත. එමෙන්ම, මෙම ව්‍යාපෘති වලින් ඇතැම් ව්‍යාපෘති, ණය මූල්‍ය හරහා නොව කොටස් ආයෝජන හරහා ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙමගින් රජයට තම ණය තොගය තාර්කික කිරීමට සහාය වනු ඇති අතරම ඉහළ මට්ටමේ ණයගැතිභාවයකින් තොරව වත්කම් අත්පත්කර ගැනීම සහතික කරනු ඇත. මෙම සන්දර්භය තුළ, වසර 2 ක් සඳහා රාජ්‍ය ආයතන සඳහා නව

ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ නොකිරීමට ද රජය පියවර ගෙන තිබේ.

විශේෂයෙන්ම, රාජ්‍ය ව්‍යවසායයන් ද ඇතුළුව වැයදරන ආයතන සඳහා අයවැය ප්‍රතිපාදන අඩුවීමත් සමඟ මුදල් ප්‍රවාහය වැඩි කිරීමට ඉවහල් වූ බදු අඩුකිරීමෙන් වූ ඉතුරුම් මගින් වියදම් තාර්කීකරණ ප්‍රයත්නයන් තවදුරටත් ප්‍රතිලාභ ලබා ඇත.

### රාජ්‍ය මුදල් කළමනාකරණය

මහජනතාවට ප්‍රවේශවීමට හැකිවන පරිදි සරල හා විධිමත් ක්‍රමවේදයක් තුළින් රාජ්‍ය සේවය වඩාත් ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් වඩාත් කාර්යක්ෂම සේවාවක් කිරීම උදෙසා වන රාජ්‍ය වත්කම් කළමනාකරණය, ප්‍රසම්පාදන වැනි ක්‍රියාවලීන් විනිවිදභාවයෙන් හා වගවීමෙන් සිදුකිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියට එකතුකිරීමේ වැදගත්කම රජය විසින් අවධාරණය කර ඇත.

දේශීය සහ විදේශීය සම්පත් ඵලදායීව කළමනාකරණය කිරීමෙහිලා වැදගත්වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම, වර්තමාන මහජන ප්‍රසම්පාදන අවශ්‍යතා, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ගැලපෙන කුසලතා සහ ක්‍රියාවලීන් විධිමත් කෙරෙනු ඇත.

වර්තමානයේ මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සම්බන්ධයෙන් නිකුත්කරන ලද බොහොමයක් රෙගුලාසි පැරණි හා යල් පැනගිය ඒවා වන අතර, එවැනි රෙගුලාසි සරල සහ කාලීන අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස යාවත්කාලීන කිරීම සිදුවිය යුතු වේ. තවද කොවිඩ්-19 වසංගතය මගින් නිවසේ සිට දුරස්ථව රාජකාරි කිරීමේ සංකල්පය හරහා තාක්ෂණය භාවිතය තවදුරටත් තහවුරු කර ඇති බැවින් ඊට සහයවන නියාමන රාමුව හා ගැලපෙන උසස් අභ්‍යන්තර පාලන පද්ධති සහ විගණන ක්‍රියාවලීන් ඇතිකිරීම වැදගත් වේ.

කොවිඩ්-19 වසංගතයෙන් මතු වූ නව අවශ්‍යතාවයන් සමඟ කටයුතු කිරීමේදී රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන (e-GP) ක්‍රමය උත්ප්‍රේරකයක් වන අතර එය ප්‍රසම්පාදන දැන්වීම්, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ ලංසු ඉදිරිපත් කිරීම වැනි අංශයන්හි ඉතා ලාභදායී පියවරකි. හදිසි භාණ්ඩ හා සේවා විනිවිදභාවයෙන් හා කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල අතරතුර මෙය හඳුන්වා දී ඇත.

### රජය සතු ව්‍යවසායයන්

ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේදී රාජ්‍ය ව්‍යවසායයන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බැවින්, රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම එම ආයතනවල පවතින උප ප්‍රශස්ත මට්ටමේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම රජයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළ අත්‍යවශ්‍ය කරුණකි. පැහැදිලි මිලකරණ ප්‍රතිපත්තියක් නොමැතිකම, අඩු තරඟකාරිත්වය, ප්‍රාග්ධන මුදල් ප්‍රමාණවත් නොවීම, විශේෂයෙන් අකාර්යක්ෂම හෝ අඩු බලතල සහිත අධ්‍යක්ෂ මණ්ඩල මෙම උප ප්‍රශස්ත කාර්යසාධනයට හේතු වූ ප්‍රධාන සාධක ලෙස හඳුනාගෙන ඇත. මේ හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා සුදුසුකම් මත පදනම් ව වෘත්තිකයන් බඳවා ගැනීමේ ක්‍රමවේද හඳුන්වාදී ඇති අතර එමගින් රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය විනය සහ වගවීම වැඩිදියුණු කෙරෙනු ඇත.

රජය සතු ව්‍යවසායයන් සඳහා හඳුන්වා දී ඇති නව ප්‍රතිසංස්කරණ මගින් ඵලදායිතාවය ඉහළ නැංවීම සහ වඩා හොඳ කොටස්හිමියන්ගේ වටිනාකම් වැඩිකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මේ සඳහා, රාජ්‍යය ව්‍යවසායයන් හි ශක්තිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සමගාමීව ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) ස්ථාපිත කරනු ලබන උපාය මාර්ගික ව්‍යාපාරික සැලසුම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වනු ඇත. ස්ථාපිත කර ඇති ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) ළඟාකර ගැනීමට හැකි වන අයුරින් රාජ්‍යය ව්‍යවසායයන්ගේ බඳවා ගැනීමේ පටිපාටි සමාලෝචනය කිරීමට ද පියවර ගනු ලැබේ. ඉදිරි මධ්‍යකාලීන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට මූල්‍ය විනිවිදභාවය, තරඟකාරී වෙළෙඳපොළ ව්‍යුහයන් සහ නියාමන රාමුව ඇතුළත් කිරීම අවශ්‍ය වේ.

### රාජ්‍ය ආයෝජන

කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා රජය විසින් දැඩි ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, කොවිඩ්-19 යෙන් පසු ආර්ථික සංවර්ධනය සඳහා රට සූදානම් කිරීමේ අවශ්‍යතාව රජය විසින් හඳුනාගෙන ඇත. මේ සඳහා රාජ්‍ය ආයෝජන ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන අතර, එය මන්දගාමී වූ ආර්ථික ක්‍රියාකාරකම් සහ සේවා නියුක්තිය ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, ජලය, ප්‍රවාහන හා තොරතුරු තාක්ෂණ යන අංශ සම්බන්ධයෙන් රාජ්‍ය ආයෝජන අවශ්‍යතාවය වඩාත් තීරණාත්මක වේ. පොලී අනුපාත පහත දැමීම මගින් පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ නංවන අතරම, රැකියා උත්පාදනය වැඩි කිරීම සඳහා රාජ්‍ය ආයෝජන වැඩි කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් රටේ ආර්ථික වර්ධනයට රුකුල් දීම සඳහා මධ්‍යකාලීනව රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීමට රජය අපේක්ෂා කෙරේ.

### ණය කළමනාකරණය

මධ්‍යකාලීනව වර්ධන හිතකාමී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා කිරීමේ ක්‍රියාමාර්ග තුළින් අවදානම් රහිත සහ කළමනාකරණය කළ හැකි මට්ටමකට ණය පවත්වා ගැනීමට රජය කැපවී සිටී. මෑත කාලීනව රාජ්‍ය ණය ඉහළ ගොස් ඇති අතර, 2014 වසර අවසානයේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 71.3 ක මට්ටමක පැවතුණු රාජ්‍ය ණය ප්‍රමාණය දුර්වල මූල්‍ය තත්ත්වයන් හමුවේ 2019 වසර අවසානයේ දී ද.දේ.නි. යෙන් සියයට 86.8 ක් දක්වා එනම් රු. බිලියන 13,031 දක්වා ඉහළ ගොස් ඇත. 2015 - 2019 කාලපරිච්ඡේදය තුළ වූ පසුගාමී ආර්ථික වර්ධනය සහ කොවිඩ්-19 වසංගතය මගින් සාර්ව ආර්ථික තත්ත්වයන්ට ඇති වූ බලපෑම ද සමඟ 2020 වසර අවසානයේ රාජ්‍ය ණය

ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 94.3 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ශ්‍රී ලංකාව කිසි විටෙකත් සිය ණය ගෙවීම් පැහැර හැර නොමැත. විදේශ ව්‍යවහාර මුදලෙන් ලබාගත් ණය තොගය 2020 වසරේ දී සමස්ත ණය තොගයෙන් සියයට 47 ක් පමණ වන අතර, එය විදේශ විනිමය සහ ප්‍රතිමූල්‍ය අවදානම උග්‍ර කර ඇත. ඇ.ඩො. බිලියන 35.3 ක් වන විදේශ ව්‍යවහාරික මුදල් ණය තොගයෙන්, සියයට 42.6 ක් එනම් ඇ.ඩො. බිලියන 15.0 ක් සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මගින් මූල්‍යනය වී ඇත. කෙසේ වුවද, අපේක්ෂිත අඩු අයවැය හිඟය සහ ඉහළ ආර්ථික වර්ධනයක් සමඟ සමපාත වෙමින් 2025 වසර වන විට රාජ්‍ය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 75.5 ට වඩා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පවත්වාගෙන යාමට රජය කැපවී සිටින අතර, ප්‍රාථමික ගිණුමේ ශේෂය මධ්‍යකාලීනව අතිරික්තයක් බවට පත්වීම තුළින් ණය ප්‍රමාණය අඩු වී රාජ්‍ය ණය සීමා කිරීමේ වඩාත් විධිමත් ක්‍රියාමාර්ග යකට යොමුවනු ඇත.

### මූල්‍ය අංශය

මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ යහපත් තත්ත්වය, මධ්‍යකාලීන ආර්ථික වර්ධනය තවදුරටත් උත්තේජනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 වසංගතයෙහි බලපෑම හේතුවෙන් අක්‍රීය ණය අනුපාතිකය ඉහළ ගියද, ලාභ මට්ටම් ඉහළ නංවා ගනිමින් අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා අනුපාතය අවම මට්ටමට වඩා ඉහළ නැංවීමත් සමඟ බැංකු අංශයේ ක්‍රියාකාරිත්වය වර්ධනය විය. කොටස් වෙළෙඳපොළ හා ව්‍යාපාර ප්‍රාග්ධන කර්මාන්තයට ප්‍රතිලාභ ලබා දෙමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර බැංකු ආකර්ෂණය කර ගැනීම සඳහා 'කොළඹ වරාය නගර ව්‍යාපෘතිය' ඇතුළු ප්‍රමුඛතා ව්‍යාපෘති පිහිටුවීමත් සමඟ මූල්‍ය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

### විදේශීය අංශය

නිෂ්පාදන විවිධාංගීකරණය, අගය එකතු කිරීම, අපනයනාභිමුඛ විදේශ සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ නව සංවර්ධනයන් සමඟ තරඟකාරී යටිතල පහසුකම් ඇති කිරීම තුළින් අපනයන අංශය ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව විසින් දැනටමත් පියවර ගෙන තිබේ. අපනයන අංශය උත්තේජනය කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම සඳහා බදු සහ තීරුබදු ප්‍රතිපත්ති ද නවීකරණය කරමින් පවතී.

ඒ අනුව, කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ ගෝලීය අවිනිශ්චිතතාවයන් මධ්‍යයයේ වුවද විදේශීය අංශය ස්ථාවරත්වයක් පෙන්නුම් කළේය. අපනයන ඉපැයීම් ඉහළයාමත්, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීමත් සමඟ බොරතෙල් මිල පහත වැටීම හේතුවෙන් 2020 වසරේ පළමු මාස නවය තුළ දී වෙළඳ හිඟය පටු විය. සංචාරක අංශයේ ඉපැයීම් අඩු වුවද, පරිගණක හා සැපයුම් සේවාවන්හි අපේක්ෂිත වර්ධනයත් සමඟ සේවා අපනයන ඉහළ ගියේය. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අපේක්ෂිත මට්ටමට වඩා වැඩි විය. මේ අතර, රටෙහි ණය සේවා කිසි විටෙකත් පැහැර නොහැරීමේ වාර්තාව පවත්වා ගනිමින්, ඇ.ඩො. බිලියනයක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය 2020 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී පියවන ලදී. විනිමය අනුපාතිකය ස්ථාවරව පැවති අතර 2020 වසරේ සැප්තැම්බර් අවසන් වන විට දළ නිල සංචිත ඇ.ඩො. බිලියන 6.7 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## 1.4 ගෝලීය ආර්ථික තත්ත්වයන් හා ශ්‍රී ලංකාව කෙරෙහි එහි බලපෑම

ඇමෙරිකා-චීන වෙළඳ යුද්ධය සහ "බ්‍රෙක්සිට්" තුළින් ලෝක ආර්ථිකයට ඇතිකරන ලද බලපෑමෙන් වූ අවිනිශ්චිතතාවය හේතුවෙන් 2019 වසරේ සිට ගෝලීය ආර්ථිකය දැඩි සංකෝචනයක් පෙන්නුම් කරමින් පවතී. එබැවින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගෝලීය ආර්ථික වර්ධනය සියයට 3.4 ක් ලෙස පුරෝකථනය කරන ලදී. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් අනපේක්ෂිත ලෙස ගෝලීය ආර්ථික පුරෝකථනය වෙනස් කර ඇත. කොවිඩ්-19 දේශසීමා හරහා ව්‍යාප්ත වීමත් සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ගෝලීය ආර්ථික වර්ධනය සියයට 4.4 කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වසංගතය මගින් සංචාරක කර්මාන්තයට බලපෑම් එල්ල වූ අතර, ගෝලීය සැපයුම් දාම හරහා භාණ්ඩ ප්‍රවාහනය ද විශාල ලෙස අඩු විය. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා සංවර්ධිත රටවල් විසින් 'නිවසේ රැඳී සිටීම' යන සංකල්පය ක්‍රියාත්මක කරන ලදී. කොවිඩ්-19 මගින් බොහෝ අංශ වලට ඇති කරන පීඩනය ශ්‍රී ලංකාවට ද බලපා ඇති අතර, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පුළුල්ව ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයන් මේ සඳහා අවශ්‍ය වනු ඇත.

**සටහන 2 : කොවිඩ්-19 හමුවේ හඳුන්වාදුන් ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග**

**රාජ්‍ය මූල්‍ය අංශය**

- ජනාධිපති අරමුදලෙන් රු. බිලියන 100 ක දායකත්වයක් සමඟින් කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කිරීම.
- කොවිඩ්-19 වසංගතයට පිළියමක් ලෙස සෞඛ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය හා දන්ත උපකරණ, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ, රසායනික ද්‍රව්‍ය සහ උපකරණ ඇතුළු යන්ත්‍ර සූත්‍ර, ආනයනය කර සැපයීම හෝ ආනයනය කර පරිත්‍යාග කිරීම සඳහා බදු සහන ලබා දීම.
- සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, කොවිඩ් මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අපනයනාභිමුඛ ව්‍යවසායයන් විසින් සෞඛ්‍ය ආරක්ෂක උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සැපයීම හෝ පරිත්‍යාග කිරීම සඳහා බදු සහන ලබා දීම.
- ඖෂධ නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය කරන අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය සඳහා බදු සහන ලබාදීම.
- විදේශීය චිත්‍රපට සහ ටෙලි නාට්‍ය මත පැනවූ ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද ඉවත් කිරීම.
- රු. බිලියන 50 ක ආරම්භක ප්‍රාග්ධනයක් සහිතව ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල (FPSF) පිහිටුවීම. ඉන්ධන ආනයන මත වූ රේගු බදු අධිභාරය එම අරමුදලට බැර කිරීම.
- අප්‍රේල් හා මැයි මාසයන් සඳහා වැඩිහිටියන්, විශේෂ හැකියා ඇති අයවලුන්, වකුගඩු රෝගීන්, ගොවියන් සහ කොවිඩ්-19 හේතුවෙන් අවතැන් වූ දෛනික වැටුප් ලබන්නන් සඳහා රු. 5,000 ක මාසික දීමනාවක් ලබාදීම.
- වසංගතය මැඩලීමේ ක්‍රියාදාමය වෙනුවෙන් රු. බිලියන 65 ක ප්‍රතිපාදනයක් වෙන්කිරීම.
- සමෘද්ධි ප්‍රතිලාභීන්ට සියළුම සමෘද්ධි බැංකු හරහා රු. 10,000 ක පොලී රහිත අත්තිකාරම් මුදලක් ලබාදීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇපකර මත වාණිජ බැංකු හරහා ණය සහන පමා කාලයක් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම.
- උපයෝගිතා බිල්පත් සහ රු. 50,000 ට අඩු මාසික ණයපත් බිල්පත් ගෙවීම් සඳහා මාසයක සහන කාලයක් ලබා දීම.
- කොවිඩ්-19 වසංගතය මර්ධන කටයුතුවල නිරත වන සෞඛ්‍ය සේවකයින්, පොලීසිය, ත්‍රිවිධ හමුදා නිලධාරීන් ඇතුළු අනෙකුත් රාජ්‍ය සේවකයන්ගේ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභය දෙගුණ කිරීම.
- තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය (උදාඃ ටින් මාළු, පරිප්පු) සහ ඖෂධ වර්ගවල මිල අඩු කිරීම.
- සියළුම රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගැනීම් මත වූ ණය වාරික නැවත දැනුම් දෙනතුරු වැටුපෙන් අය නොකිරීම.
- රඳවා ගැනීමේ බදු සහ එකතු කළ අගය මත බදු සඳහා ගෙවීම් කාල සීමාව දීර්ඝ කිරීම.
- මුඛ ආවරණ සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීම.
- මාස හයක කාලයක් සඳහා තේ ප්‍රවර්ධන බද්ද අත්හිටුවීම
- කොවිඩ්-19 ඇඳිරි නීති සමයේ නොගෙවන ලද සියලුම බදු දඩ මුදල් වලින් නිදහස් කිරීම සහ ප්‍රමාද වී ගෙවීම් සඳහා වූ දඩ මුදල් 2020 ජූලි මස සිට අය කිරීමට උපදෙස් දීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන සහන ක්‍රියාමර්ග, එනම් 2018/2019 වසර සඳහා නිකුත් කරන ලද තක්සේරු කිරීම් මත ආදායම් බදු හිඟ මුදල් අය කිරීම, 2019/2020 සඳහා අතිරේක ඇගයීම් නිකුත් නොකිරීම, හිඟ/පැහැර හැරීම් වලින් බදු පියවීම් සඳහා සහන කාලයක් ලබාදීම, අත්පත්කර ගැනීමේ දැන්වීම් දීර්ඝ කිරීම් සහ බදු වාර්තා පිරවීම සඳහා වූ දින දීර්ඝ කිරීම.

සටහන 2 : කොවිඩ්-19 හමුවේ හඳුන්වාදුන් ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග *(සම්බන්ධිතයි...)*

**විදේශ අංශය**

- ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි කරනු ලබන ඕනෑම ආයෝජන, බැහැරගත ප්‍රේෂණ සහ විගමනිකයින් මෙරට මුදල් ගෙන්වා ගැනීම යනාදී විදේශ මුදල් ගලායාම් මාස තුනක කාලයක් සඳහා අත්හිටුවීම.
- තෝරාගත් මෝටර් රථ සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීමේ දී ණයවර ලිපි නිකුත් කිරීම, පිළිගැනුම් මත ලේඛන සහ අත්තිකාරම් ණය පහසුකම් ලබාදීම මාස තුනකට අත්හිටුවීම.
- යම් යම් කොන්දේසි මත සියලුම අත්‍යවශ්‍ය නොවන ආනයනයන් සඳහා සීමා පැනවීම.
- සංචාරකයින් ලෙස විදෙස් ගතවන ලාංකිකයන් හට ලබාගත හැකි ඇ.ඩො. 10,000 සංචාරක දීමනා මුදල (හෝ වෙනත් විදේශ මුදල් වලට සමාන) ඇ.ඩො. 5,000 දක්වා පහත හෙලීමට බලයලත් විදේශ මුදල් නෝට්ටු නිකුත් කරන්නන් හට උපදෙස් දීම.
- විදේශ සංචිත ක්ෂය නොවන ලෙස කාලීන පදනමින් විදේශ මුදල් ද්‍රවශීලතාවය සැපයීම සඳහා වාණිජ බැංකු සඳහා විකුණුම්-මිලදී ගැනීම් විදේශ විනිමය හුවමාරු වෙන්දේසි හඳුන්වා දීම.
- ඉන්දීය සංචිත බැංකුව සමග ඇ.ඩො. මිලියන 400 ක ද්විපාර්ශවික මුදල් හුවමාරු ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා ගැනීම. ගිවිසුම අත්සන් කිරීම සඳහා අවශ්‍ය සියලුම පූර්ව අවශ්‍යතාවයන් මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව විසින් ඉටු කොට ඇත.
- වාණිජ බැංකු මගින් සිදුවන විදේශ විනිමය වෙළෙඳපොළෙහි සමපේක්ෂණ ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා තෝරාගත් පදනමක් මත ශුද්ධ විවෘත ස්ථාන (NOP) සීමා කිරීම.
- රජයේ අඛණ්ඩ ද්‍රවශීලතා සැපයුම සඳහා ඇමරිකානු ෆෙඩරල් සංචිත බැංකුව සමඟ ඇ.ඩො. මිලියන 1,000 ක නැවත මිලදී ගැනීමේ පහසුකමක් ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගැනීම.

**මූදල් අංශය**

- ත්‍රීරෝද රථ, ට්‍රක් රථ, පාසැල් වෑන් සහ බස්රථ සහ ස්වයං රැකියා නියුක්ත වාහන රියදුරන් ඇතුළුව ස්වයං රැකියා නියුක්තිකයන් මිලියන 1.5 ක් සඳහා මාස 6 කට කල්බදු ණය වාරික අයකිරීම අත්හිටුවීම.
- රටේ ආර්ථික ක්‍රියාවලියට උත්තේජනයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිය (SRR) සියයට 2.00 දක්වා පහත හෙළීම මගින් රු. බිලියන 150 ක ද්‍රවශීලතාවයක් ආර්ථිකයට මුදා හැරීම.
- ව්‍යාපාර සහ ආර්ථික කටයුතුවලට සහය වීම සඳහා රු. බිලියන 50 ක ප්‍රතිමූල්‍යකරණ පහසුකම් හඳුන්වා දීම.
- කොවිඩ්-19 නිසා හෝ මුහුණපාන අභියෝග කළමනාකරණයේ ජාතික කර්තව්‍යයට සහයවීම සඳහා විශේෂ තැන්පත් ගිණුමක් (SDA) හඳුන්වා දීම.
- වෙළෙඳපොළ ණය අනුපාතික අඩුකිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් ඒකක 250 කින් 4.50 සහ 5.50 දක්වා ජනවාරි-ජූලි කාලය තුළ පහත හෙළීම.
- ණය කාඩ්පත් සඳහා තිබූ පොලී අනුපාතිකය රු. 50,000 දක්වා වූ දේශීය ගණුදෙනු සඳහා සියයට 15 දක්වා අඩු කිරීම හා අවම මාසික ගෙවීම් සියයට 50 කින් අඩු කිරීම.
- ඇඳිරි නීතිය පනවා නොමැති කාලය තුළ සියලු බැංකු ශාඛා විවෘත කිරීම තුළින් ජනතාව වෙත අඛණ්ඩව බැංකු සේවා සැපයීමට කටයුතු කිරීම.
- අභිමත පරිදි ගෙවීම් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් කපාහැරීම මගින් අඛණ්ඩව ණය ප්‍රවාහයන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රලාභී බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම.

**පරිපාලනමය මෙහෙයුම්**

- ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය සඳහා සහාය වීමට නව ණය යෝජනා ක්‍රම 3 ක් ක්‍රියාත්මක කිරීම. මේ අනුව බලපෑමට ලක් වූ ක්ෂේත්‍රවල (ඉදිකිරීම් සහ වෙනත්) තෝරාගත් ව්‍යාපාර සඳහා 4% ක වාර්ෂික පොලියකට ණය ලබාදීම.කොවිඩ්-19 උවදුර මර්ධනය සඳහා වූ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම කොවිඩ්-19 සෞඛ්‍ය සත්කාර, අධ්‍යාපනය, ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායන් ස්ථාපිත කිරීම හා සෞඛ්‍ය අවදානම් සහ ආර්ථික ලිහිල් කිරීමේ උපාය මාර්ග කළමනාකරණය කිරීම සඳහා ඉහළ මට්ටමේ සම්බන්ධීකරණ සභාවක් පිහිටුවීම.
- ජාතික බෝවන රෝග විද්‍යායතනය සහ තවත් රෝහල් විශාල ප්‍රමාණයක් කොවිඩ්-19 රෝගී ප්‍රතිකාර සඳහා සූදානම් කිරීම සහ දිවයින පුරා නිරෝධායන මධ්‍යස්ථාන 34 ක් ස්ථාපිත කිරීම.
- දෛනික පී.සී.ආර්. (PCR) පරීක්ෂණ සංඛ්‍යාව 10,000 ඉක්මවීම.
- ත්‍රිපෝෂ, පෝෂණ මල්ල හා ඖෂධ ප්‍රතිලාභීන්ගේ නිවෙස්වලටම බෙදා හැරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ තැපැල් සේවා මගින් විශ්‍රාමිකයින් 645,179 කට විශ්‍රාම වැටුප් ගෙවීම.
- ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා "සෞභාග්‍යා" ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- ගොවිතැන්/ගෙවතු වගාව දිරි ගැන්වීම උදෙසා සමෘධි ප්‍රතිලාභීන්ට පොහොර සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම.
- රෝහල් ඇඳන්, විෂබීජ හරණ කුටි, විෂබීජ හරණ ආලේපන වැනි නිෂ්පාදන රට තුළදීම නිපදවීමට දේශීය නිෂ්පාදකයන් සහ නව නිපැයුම්කරුවන් දිරිමත් කිරීම.
- දේශීය මෙන්ම අපනයන ඉල්ලුම සපුරාලීම සඳහා සියලුම කෘෂිකාර්මික කටයුතු සඳහා ඇඳිරිනීති ඇතුළු සියලුම සීමා ලිහිල් කිරීම.
- දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) කොවිඩ්-19 අරමුදලට ඇ.ඩො. මිලියන 5 ක් ප්‍රදානය කිරීම.
- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඉන්දියාව, යුරෝපය, බ්‍රිතාන්‍ය හා මැදපෙරදිග වැනි රටවල්වල සිර වී සිටි ශ්‍රී ලාංකිකයන් මෙරටට රැගෙන ඒමට කටයුතු කිරීම.
- "නිවසේ සිට වැඩ කිරීමේ" උපදෙස් සහ මාර්ගෝපදේශ විශේෂයෙන්ම රාජ්‍ය අංශයට නිකුත් කිරීම.

# II කොටස

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

# 01

## 1.1 සමාලෝචනය

ආර්ථිකයෙහි සමස්ත ඉල්ලුම ඉහළ නැංවීම තුළින් ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා රජය විසින් 2019 වසරේ අග භාගයේ දී සහ 2020 වසර ආරම්භයේ දී සරල, විනිවිදභාවයෙන් යුතු සහ කාර්යක්ෂම බදු පද්ධතියක් හඳුන්වා දෙන ලදී. ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ණය ආපසු ගෙවීමේ අය බද්ද ඉවත් කිරීමෙන් බදු ව්‍යුහය සරල කරන ලදී. පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු ව්‍යුහයන් සංශෝධනය කරන ලදී. එකතු කළ අගය මත (වැට්) බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 8 දක්වා පහත හෙළන ලද අතර, වැට් බදු ලියාපදිංචි කිරීමේ සීමාව පුළුල් කරන ලදී.

බහුවිධ හේතු නිසාවෙන් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් 2020 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලපරිච්ඡේදය තුළ දී මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. කොවිඩ්-19 වසංගතය පැතිරීම සහ එහි බලපෑම අවම කිරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සහ මුදල් උත්තේජන පැකේජ, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑම් එල්ල කර ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ දී ආදායම් කාර්යසාධනය ප්‍රධාන වශයෙන් (i) පූර්ව කොවිඩ්-19 කාලපරිච්ඡේදයේ පළමු මාස දෙක තුළ දී සමස්ත ආදායම රු. බිලියන 318.6 දක්වා සියයට 5.0 කින් වැඩි වීම; (ii) 2020 වසරේ මාර්තු මස අවසානයේ සිට මැයි මස දක්වා රට අගුළු දමන ලද කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය ආදායම රු. බිලියන 264.6 දක්වා සියයට 43.4 කින් සැලකිය යුතු ලෙස අඩු වීම; සහ (iii) 2020 වසරේ ජූනි මස සිට අගෝස්තු මස දක්වා නව සාමාන්‍ය කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය ආදායම යථා තත්ත්වයට පත් වෙමින් රු. බිලියන 323.1 දක්වා සියයට 25.6 කින් පමණක් අඩු වීම ලෙස අවධි තුනකින් යුක්ත විය. ඉහත වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 1,205.0 ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 906.4 දක්වා සියයට 24.8 කින් අඩු විය. සමස්ත වියදම ද 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැවති රු. බිලියන 1,927.1 ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා රු. බිලියන 1,883.7 කින් එනම් සියයට 2.3 කින් අඩු විය. කොවිඩ්-19 සමඟ පැන නැගුණ ජීවනෝපාය සහන සඳහා වන වියදම් වැඩි වීම හේතුවෙන් 2020 වසරේ මාර්තු මස දී අනම්‍යශීලී ස්වභාවයක් ගන්නා පුනරාවර්තන වියදම් ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, එම වියදම් රු. බිලියන 1,670.4 දක්වා සියයට 11.3 කින් වැඩි විය. ප්‍රාග්ධන වියදම් ද අදාළ කාලපරිච්ඡේදය තුළ දී ආදායම් රටාවන් හා සමානව අවධි තුනකින් යුක්ත විය. ප්‍රාග්ධන වියදම් පළමු මාස දෙක තුළ දී අඩකින් පමණ අඩු වූ අතර, මාර්තු සහ අප්‍රේල් මාස තුළ දී රට අගුළු දැමීම හේතුවෙන් තවදුරටත් අඩු වී මැයි මස සිට යළි වැඩි විය. කෙසේ වුවද, ඉදිකිරීම් අංශයේ සිදු වූ පසුබෑම් හේතුවෙන් ජූනි සහ ජූලි මාස තුළ දී එම වියදම් අප්‍රේල් මස වාර්තා වූ අගය දක්වා තවදුරටත් පහත වැටුණි. 2020 වසරේ අගෝස්තු මස සිට ප්‍රාග්ධන වියදම් ද වැඩි වීම ආරම්භ විය.

**වගුව 1.1 : රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය**

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020 (අ) |
|---|---|---|
| ආදායම් සහ ප්‍රදාන | 1,206,477 | 908,876 |
| ආදායම | 1,205,036 | 906,359 |
| බදු | 1,105,402 | 801,340 |
| බදු නොවන | 99,634 | 105,020 |
| ප්‍රදාන | 1,440 | 2,516 |
| වියදම් | 1,927,104 | 1,883,706 |
| පුනරාවර්තන | 1,500,534 | 1,670,356 |
| වැටුප් | 446,451 | 516,354 |
| පොලී ගෙවීම් | 599,612 | 653,498 |
| අනෙකුත් | 454,471 | 500,504 |
| රාජ්‍ය ආයෝජන | 435,270 | 227,939 |
| අනෙකුත් | -8,699 | -14,590 |
| ආදායම් හිඟය (-)/අතිරික්තය (+) | -295,498 | -763,997 |
| සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+) | -720,628 | -974,831 |
| මූල්‍යයනය | 720,628 | 974,831 |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | 142,349 | -92,289 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 578,279 | 1,067,119 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
(අ) තාවකාලික

වගුව 1.2 : ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම සහ වියදම - 2020

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තු | ජන. - අගෝ. තථ්‍ය [අ] | වෙනස |
|---|---|---|---|
| මුළු ආදායම | **1,520.0** | **906.4** | **-613.6** |
| බදු ආදායම | **1,358.0** | **801.4** | **-556.6** |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | | |
| ආදායම් සහ ලාභ මත බදු | 323.9 | 167.4 | -156.5 |
| එකතු කල අගය මත බදු - දේශීය (ශුද්ධ) | 161.0 | 87.1 | -73.9 |
| ජාතිය ගොඩනැගීමේ බදු (දේශීය) | 2.8 | 1.8 | -1.1 |
| අනෙකුත් | 7.4 | 33.1 | 25.7 |
| උප එකතුව | **495.1** | **289.5** | **-205.6** |
| ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | | | |
| ආනයන බදු | 140.0 | 73.2 | -66.8 |
| එකතු කළ අග මත බදු - ආනයන (ශුද්ධ) | 80.0 | 50.6 | -29.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු (ආනයන) | 0.2 | 0.1 | -0.1 |
| වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 115.0 | 71.8 | -43.2 |
| සෙස් බදු | 50.0 | 31.3 | -18.7 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 99.6 | 55.9 | -43.7 |
| ආර්ථික සේවා බද්ද | 0.1 | 0.0 | -0.1 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 225.0 | 142.3 | -82.7 |
| දුම්වැටි | 105.0 | 59.0 | -46.1 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 65.0 | 37.3 | -27.7 |
| මෝටර් වාහන | 50.0 | 43.2 | -6.8 |
| අනෙකුත් | 5.0 | 2.9 | |
| උප එකතව | **709.9** | **425.2** | **-284.7** |
| සුරාබදු දෙපාර්තමේන්තුව | | | |
| මත්පැන්/දුම්කොළ | 130.0 | 72.5 | -57.5 |
| උප එකතුව | **130.0** | **72.5** | **-57.5** |
| අනෙකුත් | | | |
| විදුලි සංදේශ බද්ද | 15.0 | 8.8 | -6.2 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 8.0 | 5.4 | -2.6 |
| උප එකතුව | **23.0** | **14.2** | **-8.8** |
| බදු නොවන ආදායම | **162.0** | **105.0** | **-57.0** |
| මුළු වියදම | **2,794.1** | **1,883.7** | **-910.4** |
| වර්තන වියදම් | **2,385.3** | **1,670.4** | **-714.9** |
| වැටුප් සහ වේතන | 800.0 | 516.4 | -283.6 |
| පොලී ගෙවීම් | 866.0 | 653.5 | -212.5 |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | 252.7 | 160.1 | -92.6 |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 76.6 | 68.2 | -8.4 |
| අනෙකුත් | 390.0 | 272.3 | -117.7 |
| ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය | **408.8** | **213.3** | **-195.5** |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

2020 වසරේ පළමු මාස අට තුළ දී රජයේ සමස්ත ආදායම රු. බිලියන 906.4 ක් වූ අතර, එය රු. බිලියන 801.3 ක බදු ආදායමකින් සහ රු. බිලියන 105.0 ක බදු නොවන ආදායමකින් සමන්විත විය. කොවිඩ්-19 යෙහි බලපෑම පිළිබිඹු කරමින් රජයේ සමස්ත ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පැවති රු. බිලියන 294.5 ට සාපේක්ෂව 2020 වසරේ මාර්තු මස සිට අප්‍රේල් මස දක්වා රු. බිලියන 158.1 කින් එනම් සියයට 46.3 කින් අඩු විය. ජූලි මස සිට අගෝස්තු මස දක්වා නව සාමාන්‍ය කාලපරිච්ඡේදය තුළ දී රජයේ ආදායම රු. බිලියන 243 වෙමින් යථා තත්ත්වයට පත් විය. මේ අතර, කොවිඩ්-19 සමඟ ආර්ථික කටයුතු අඩපණ වීම හේතුවෙන් බදු නොවන ආදායම අප්‍රේල් මස සිට ජූනි මස දක්වා කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 258.1 දක්වා සියයට 42.1 කින් අඩු විය. කෙසේ වුවද, ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින් 2020 වසරේ ජූලි මස දී බදු නොවන ආදායම 2019 වසරේ ජූලි මස ආදායම අභිබවා ඇත. සමුච්චිත වශයෙන් 2020 වසරේ පෙබරවාරි මස මහ බැංකු ලාභ පැවරුම් ලැබීම හේතුවෙන්, බදු නොවන ආදායම 2019 වසරේ පැවති රු. බිලියන 99.6 ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 105.0 ක් දක්වා සියයට 5.4 කින් වැඩි විය.

රජයේ සමස්ත වියදම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැවති රු. බිලියන 1,927.1 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 1,883.7 ක් දක්වා සියයට 2.3 කින් අඩු විය. මේ අතර, 2020 වසරේ පළමු මාස අට තුළ දී පුනරාවර්තන වියදම් රු. බිලියන 1,670.4 ක් දක්වා සියයට 11.3 කින් ඉහළ ගොස් ඇති අතර, ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් රු. බිලියන 213.3 දක්වා සියයට 50.0 කින් අඩු විය. තවද, වැටුප් හා වේතන සඳහා වන පුනරාවර්තන වියදම් රු. බිලියන 516.3 ක් දක්වා සියයට 15.7 කින් ඉහළ ගොස් ඇති අතර, පොලී ගෙවීම් සියයට 9.0 කින් එනම් රු. බිලියන 653.5 දක්වා ඉහළ ගොස් ඇත. පුනරාවර්තන වියදම් වලින් සියයට 70 ක්ම මෙම අයිතම දෙක සඳහා වැයවී ඇත. 2020 වසරේ පළමු මාස අට තුළ දී භාණ්ඩ හා සේවා සඳහා වන වියදම් රු. බිලියන 106.8 දක්වා සියයට 15.9 කින් ඉහළ ගොස් ඇති අතර, සහනාධාර හා පැවරුම් සඳහා වන වියදම් රු. බිලියන 393.7 දක්වා සියයට 8.7 කින් වැඩි වී ඇත.


2020 වසරෙහි වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අතුරු සම්මත ගිණුම මත මුළුමනින්ම රඳා පැවතුණි. 2020 වසර සඳහා අයවැය ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම වසරේ පළමු මාස හතර සඳහා අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන ලද අතර, එය 2020 වසරේ අප්‍රේල් මස 30 වන දින දක්වා වියදම් කිරීමේ අධිකාරීත්වය ලබා දෙමින් 2019 වසරේ ඔක්තෝබර් මස 23 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. මේ අතර, 2020 වසරේ මාර්තු මස 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර, 2020 වසරේ මාර්තු සිට මැයි දක්වා රජයේ සේවාවන් සහ සංවර්ධන කටයුතු සඳහා ඒකාබද්ධ අරමුදලෙන් වියදම් දැරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත අධිකාරීත්වය ලබා දෙන ලදී. කොවිඩ්-19 වසංගතය පැන නැගීමත් සමඟ 2020 වසරේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම අධිකාරීත්වය 2020 වසරේ අගෝස්තු මස දක්වා දීර්ඝ කරන ලදී. 2020 වසරේ පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වීමෙන් පසුව, 2020 වසරේ අවසන් මාස හතර සඳහා වියදම් දැරීමට නව අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, එම ගිණුම 2020 වසරේ අගෝස්තු මස 28 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

2020 වසරේ පළමු මාස අට තුළ දී අයවැය හිඟය රු. බිලියන 974.8 ක් වූ අතර, එම හිඟය ප්‍රධාන වශයෙන් දේශීය ණය ගැනීම් මඟින් මූල්‍යායනය කරන ලදී. මෙම කාලපරිච්ඡේදය තුළ දී දේශීය ණය ගැනීම් රු. බිලියන 1,067.1 ක් වූ අතර, ණය සේවාකරණය සඳහා විදේශීය ණය ගැනීම් රු. බිලියන 92.3 ක් විය.

## 1.2 රජයේ ආදායම


කොවිඩ්-19 වසංගතයෙන් දේශීය සහ විදේශීය ආර්ථික කටයුතු කෙරෙහි සිදුවූ බලපෑම පිළිබිඹු කරමින් රජයේ සමස්ත ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 1,205.0 සිට 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 906.4 දක්වා සියයට 24.8 කින් ලෙස අඩු විය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී ආදායම "V-හැඩැති" ව තියුණු ලෙස යථා තත්ත්වයට පත්වීමක් නිරීක්ෂණය විය. 2020 වසරේ පළමු කාර්තුවේ දී වැඩි වූ ආදායම, කොවිඩ්-19 වසංගතයෙන් දැඩි බලපෑම් එල්ල කළ මාස වල විශේෂයෙන්ම 2020 වසරේ දෙවන කාර්තුවේ දී පසුබෑමකට ලක්ව, මෙම වසරේ ජූලි මස ආරම්භයේ සිට ආදායම් රැස් කිරීම යළි වේගවත් විය. විශේෂයෙන්ම එකතු කළ අගය මත බදු, මෝටර් වාහන සඳහා නිෂ්පාදන බදු සහ විදුලි සංදේශ බදු රැ ස් කිරීම පහත වැටීමත් සමඟ ඇතැම් බදු ඉවත් කිරීම හේතුවෙන් 2020 වසරේ පළමු මාස අට තුළ දී බදු ආදායම රු. බිලියන 801.3 දක්වා සියයට 27.5 කින් අඩු විය. කෙසේ වුවද, බදු නොවන ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 99.6 ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා රු. බිලියන 105.0 කින් එනම් සියයට 5.4 කින් වැඩි විය. සමස්තයක් ලෙස, වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 1,520 න් අදාළ කාලපරිච්ඡේදය තුළ දී රැස් කළ ආදායම සියයට 59.6 ක් විය.

**රූප සටහන 1.1 : මුළු ආදායම් සංයුතිය 2020 ජනවාරි සිට අගෝස්තු**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**රූප සටහන 1.2 : මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම 2020 ජනවාරි සිට අගෝස්තු**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

වගුව 1.3 : රාජ්‍ය ආදායම් කාර්ය සාධනයේ සංක්ෂිප්තය

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020(අ) | වෙනස (%) |
|---|---|---|---|
| බදු ආදායම | **1,105,402** | **801,340** | **-27.5** |
| ආදායම් බදු | **238,168** | **167,440** | **-29.7** |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | **358,848** | **223,201** | **-37.8** |
| එකතු කළ අගය මත බදු | 186,875 | 87,148 | -53.4 |
| නිෂ්පාදන බදු | 137,270 | 134,298 | -2.2 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 34,703 | 1,754 | -94.9 |
| ආනයන මත පදනම් වූ බදු | **467,480** | **362,609** | **-22.4** |
| රේගු ආනයන බදු | 63,973 | 73,171 | 14.4 |
| එකතු කළ අගය මත බදු | 114,885 | 50,644 | -55.9 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 13,254 | 112 | -99.2 |
| වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 73,825 | 71,769 | -2.8 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 46,867 | 55,141 | 17.7 |
| නිෂ්පාදන බදු | 122,280 | 80,486 | -34.2 |
| සෙස් | 32,397 | 31,286 | -3.4 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | **40,906** | **48,091** | **17.6** |
| බදුනොවන ආදායම | **99,634** | **105,020** | **5.4** |
| මුළු බදු ආදායම | **1,205,035** | **906,359** | **-24.8** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

### ආදායම් බදු

ආදායම් බදු වලින් ලද ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 74.9 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස තුන තුළ දී රු. බිලියන 79.3 දක්වා සියයට 5.9 කින් වැඩි විය. ආර්ථික ක්‍රියාකාරකම් බිඳවැටීම හේතුවෙන් ආදායම් බදු මූලාශ්‍රයන්ට කොවිඩ්-19 වසංගතයෙන් සිදුවූ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ අප්‍රේල් මස සිට අගෝස්තු මස දක්වා ආදායම් බදු වලින් රැස්කරගත් ආදායම රු. බිලියන 88.1 දක්වා සියයට 46.0 කින් පහත වැටුණි. මේ අතර, 2020 වසරේ ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වන පරිදි සම්මත සංස්ථාපිත බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 24 දක්වා සංශෝධනය කිරීම මෙන්ම නිෂ්පාදන සහ ඉදිකිරීම් අංශ සඳහා පිළිවෙළින් සියයට 18 ක සහ සියයට 14 ක සහනදායී බදු අනුපාතික ප්‍රදානය කළ ද, 2020 වසරේ පළමු මාස අට තුළ දී සංස්ථාපිත ආදායම් බදු වලින් ලද ආදායම රු. බිලියන 132.1 දක්වා සියයට 12.1 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2020 වසරේ ජනවාරි මස 01 වන දින සිට අදාළවන අනුක්‍රමික බදු ව්‍යුහයේ සිදුකරන ලද සංශෝධනයන් සමඟම පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව රු. 500,000 සිට රු. 3,000,000 දක්වා පුළුල් කිරීමත්, ආදායම් ප්‍රභවයන් බිඳ වැටීමත් හේතුවෙන් සංස්ථාපිත නොවන බදු වලින් ලද ආදායම රු. බිලියන 4.3 දක්වා සියයට 65.5 කින් පහත වැටුණි. 2020 වසරේ ජනවාරි මස සිට ඇතැම් බදු ඉවත් කිරීම නිසා 2020 වසරේ පළමු මාස 08 තුළ දී ආර්ථික සේවා ගාස්තු සහ උපයනවිට ගෙවීමේ බදු මගින් රැස්කළ ආදායම පිළිවෙළින් රු. බිලියන 13.8 ක් සහ රු. බිලියන 9.9 ක් දක්වා සියයට 66.0 කින් හා සියයට 70.8 කින් තියුණු ලෙස අඩුවී ඇත.

වගුව 1.4 : ආදායම් බදු කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020(අ) | වර්ධනය (%) |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 129,967 | 136,214 | 4.8 |
| උපයනවිට ගෙවීම් | 33,737 | 9,860 | -70.8 |
| පොලිය මත රඳවා ගැනීමේ බදු | 33,616 | 7,406 | -78.0 |
| ආර්ථික සේවා ගාස්තු | 40,625 | 13,816 | -66.0 |
| ප්‍රාග්ධන ඉපයීම් බද්ද | 224 | 144 | -35.9 |
| **එකතුව** | **238,168** | **167,440** | **-29.7** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

**එකතු කළ අගය මත බද්ද**

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දේශීය සහ ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් අඩුවීම සහ 2019 වසරේ දෙසැම්බර් මස ආරම්භයේ සිට එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් 2020 වසරේ පළමු මාස අට තුළ දී එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණි. මීට අමතරව, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 12 සිට වාර්ෂිකව රු. මිලියන 300 දක්වා ඉහළ දැමීමත් කොවිඩ්-19 හේතුවෙන් අපේක්ෂිත ආර්ථික වර්ධනය පසුබෑමත් එකතු කළ අගය මත බදු ආදායම පහත වැටීමට හේතු විය.

වගුව 1.5 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020(අ) | වර්ධනය (%) |
|---|---|---|---|
| දේශීය | 187,026 | 87,394 | -53.3 |
| ආනයන | 115,488 | 51,626 | -55.3 |
| **දළ ආදයම** | **302,514** | **139,019** | **-54.0** |
| ආපසු ගෙවුම් | 753 | 1,226 | 62.8 |
| **ශුද්ධ ආදායම** | **301,761** | **137,793** | **-54.3** |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | 0.25 | 0.88 | |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

රජයේ සමස්ත එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පැවති රු. බිලියන 301.8 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 137.8 ක් විය. එකතු කළ අගය මත බදු ආදායමෙහි වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 241.0 න් මෙම කාලපරිච්ඡේදය තුළ එකතු කළ අගය මත බද්දෙන් උපයන ලද මුළු ආදායම සියයට 57.2 කි. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මගින් ලද එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 186.9 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 87.1 දක්වා සියයට 53.4 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 114.9 ට සාපේක්ෂව රු. බිලියන 59.6 දක්වා සියයට 55.9 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

### නිෂ්පාදන/සුරා බද්ද

නිෂ්පාදන/සුරා බදු තුළින් ලද ආදායම මෝටර් වාහන හැර අනෙකුත් සියළුම අංශයන්ගෙන් ලද ආදායම් වැඩිවීමත් සමගින් 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 94.6 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස තුන තුළ දී රු. බිලියන 105.6 දක්වා සියයට 11.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතයෙහි බලපෑම පෙන්නුම් කරමින් 2020 වසරේ දෙවන කාර්තුව තුළ දී මෙම ආදායම රු. බිලියන 54.5 ක් දක්වා සියයට 44.9 කින් කැපීපෙනෙන ලෙස අඩු වූ අතර, රටෙහි නව සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමගින් අගෝස්තු මාසය වන විට එම ආදායම යථා තත්ත්වයට පත් විය. රජයේ බදු ආදායම සඳහා නිෂ්පාදන/සුරා බදු තුළින් ලද ආදායම ප්‍රධාන දායකයා ලෙස තවදුරටත් පවතින අතර, එය අදාළ කාලපරිච්ඡේදය සඳහා වන මුළු බදු ආදායමෙන් සියයට 26.8 ක් ලෙස ද, 2020 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 60.5 ක ලඟාකරගැනීමක් ද වේ.

**වගුව 1.6 : නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය**

රු. මිලියන


| බදු පදනම | ජන. - අගෝ. | | |
|---|---|---|---|
| | 2019 | 2020[අ] | වර්ධනය (%) |
| මත්පැන් | 75,628 | 72,503 | -4.1 |
| දුම්වැටි/දුම්කොළ | 58,300 | 58,949 | 1.1 |
| මෝටර් වාහන | 81,521 | 43,151 | -47.1 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 40,759 | 37,335 | -8.4 |
| අනෙකුත් | 3,342 | 2,846 | -14.8 |
| **එකතුව** | **259,548** | **214,783** | **-17.2** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

දුම්වැටි අලෙවිය 2020 වසර තුළ දී පහත වැටුණ ද, දුම්වැටි තුළින් ලද නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 58.3 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 58.9 දක්වා සියයට 1.1 කින් සුළු වශයෙන් වර්ධනය විය. කෙසේ වුවද, දුම්වැටි අලෙවිය පහත වැටීමේ පාර්ශ්වීය බලපෑම ඉක්මවමින් දුම්වැටි මත නිෂ්පාදන බදු ඉහළ දැමීමෙන් වූ බලපෑම මෙම ආදායම් කාර්යසාධනය කෙරෙහි ධනාත්මකව බලපාන ලදී.

**රූප සටහන 1.3 : නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය - 2020 ජනවාරි සිට අගෝස්තු**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

මෝටර් වාහන ආනයනය තුළින් උපයන ලද නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 81.5 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 43.1 දක්වා සියයට 47.1 කින් කැපීපෙනෙන ලෙස අඩු විය. මෙම මන්දගාමී කාර්යසාධනය සඳහා 2020 වසරේ මාර්තු මස සිට ක්‍රියාත්මක කරන ලද මෝටර් වාහන ආනයනය මත පනවන ලද සීමා හේතුවෙන් මෝටර් වාහන ආනයනය සීඝ්‍ර ලෙස අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, 2019 වසරේ අයවැයට සමගාමීව මෝටර් වාහන මත නිෂ්පාදන බදු ඉහළ නැංවීම මෝටර් වාහන ආනයනය කෙරෙහි සෘණාත්මකව බලපාන ලදී.

මාර්තු සිට මැයි දක්වා වන මාස තුන තුළ නිරීක්ෂණය වූ මත්පැන් තුළින් ලද ආදායමේ අඩුවීම ජුනි සිට ජූලි දක්වා මාස තුළ දී නැවත එහි වර්ධන විභවතාවය පෙන්නුම් කරමින් යථා තත්ත්වයට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වූ රු. බිලියන 75.6 ක බදු ආදායම 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 72.5 දක්වා සියයට 4.1 කින් ආන්තිකව අඩුවූ අතර, කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය තුළ මත්පැන් නිෂ්පාදනය සහ මත්පැන් අලෙවිය පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. සැර මත්පැන් තුළින් ලද සුරා බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 54.6 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 51.3 දක්වා සියයට 6.0 කින් අඩු විය. එමෙන්ම, ධාන්‍ය මත්පැන් වලින් ලද සුරා බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 21.6 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 18.1 දක්වා සියයට 16.2 කින් අඩු විය.

ඛනිජතෙල් නිෂ්පාදන පරිභෝජනය ඉහළ යාමෙන් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ සළකුණු පිළිඹිබු කරමින්, ඛනිජතෙල් නිෂ්පාදන මගින් ලද ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැවති රු. බිලියන 14.1 ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මස සිට මාර්තු මස දක්වා රු. බිලියන 18.3 කින් එනම් සියයට 29.3 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. කෙසේ වුවද, මෙම ඉහළ ආදායම් කාර්යසාධනය 2020 වසරේ අප්‍රේල් මස සිට ජුනි මස දක්වා රු. බිලියන 7.4 කින් එනම් සියයට 52.0 කින් දැඩි ලෙස පහත වැටුණු අතර, 2020 වසරේ ජූලි මස සිට අගෝස්තු මස දක්වා රු. බිලියන 11.6 කින් එනම් සියයට 4.4 ක වර්ධනයක් පෙන්නුම් කරමින් යථා තත්ත්වයට පත් විය. මේ අතර, අනෙකුත් නිෂ්පාදන මත වූ නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැවති රු. බිලියන 3.3 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 2.8 දක්වා සියයට 14.8 කින් මධ්‍යස්ථ ලෙස අඩු විය.

**වගුව 1.7 : මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම**

ඒකකය : සංඛ්‍යාව

| අයිතමය | ආනයන ජන. - අගෝ. | | | | නව ලියාපදිංචි කිරීම ජන. - අගෝ. | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2019 | 2020 | වෙනස | % | 2019 | 2020 | වෙනස | % |
| බස් රථ | 3,309 | 27 | -3,282 | -99 | 25,909 | 19,445 | -6,464 | -25 |
| මෝටර් රථ | 106 | 2 | | | 1,116 | 445 | | |
| ත්‍රිරෝද රථ | 1,060 | - | -1,060 | -100 | 10,245 | 6,610 | -3,635 | -35 |
| යතුරු පැදි | 21,203 | 277 | -20,926 | -99 | 202,081 | 135,270 | -66,811 | -33 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 1,441 | 57 | -1,384 | -96 | 13,761 | 12,746 | -1,015 | -7 |
| ඉඩම් වාහන (ආ) | 233 | 354 | 121 | 52 | 3,592 | 3,018 | -574 | -16 |
| අනෙකුත් (ඇ) | 11 | 3 | -8 | -73 | 593 | 395 | -198 | -33 |
| **එකතුව** | **27,363** | **720** | **-26,643** | **-97** | **257,297** | **177,929** | **-78,697** | **-31** |

*මූලාශ්‍ර : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

(අ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන වාහන සහ විශේෂ අරමුණු සහිත වාහන

(ආ) ඉඩම් වාහන, අත්ට්‍රැක්ටර් සහ අනෙකුත් ඉඩම් වාහන ඇතුලත් වේ.

(ඇ) ද්විත්ව කාර්ය වාහන ඇතුලත් වේ.(ද්විත්වකාර්ය වාහන, ගිලන් රථ සහ අවමංගල රථ ඇතුලත් වේ.

### රේගු ආනයන බද්ද

රේගු ආනයන බදු තුළින් ලද ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 64.0 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 73.2 දක්වා සියයට 14.4 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා අර්ධ වශයෙන්, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කප්පාදු කිරීමෙන් සිදුවූ බලපෑම ඉක්මවා පිළිවෙළින් 2020 වසරේ අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය සඳහා වූ ආනයන බදු අනුපාතික ඉහළ දැමීම සහ 2020 වසරේ මාර්තු මස සහ අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි ඩීසල් සහ පෙට්‍රල් සඳහා රේගු බදු සහන ඉවත් කිරීම ද හේතු වී ඇත.

**වගුව 1.8 : නිදහස් වෙළඳ ගිවිසුම් අනුව ලබා දෙන ලද තීරු බදු සහන යටතේ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම හා ආවරණය**

| නිදහස් වෙළඳ ගිවිසුම | 2020 ජනවාරි - ජූනි | | |
|---|---|---|---|
| | තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛ්‍යාව | ආනයන රු. මිලියන | අපනයන රු. මිලියන |
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 4,883 | 21,863 | 52,338 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 5,724 | 1,338 | 7,461 |
| දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම | 5,465 | 724 | 5,401 |
| ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම | 715 | 2,723 | 28,539 |
| **එකතුව** | **16,787** | **26,648** | **93,739** |

*මූලාශ්‍ර : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු තුළින් රැස් කර ගත් ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 46.9 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 55.1 දක්වා සියයට 17.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2020 වසරේ මැයි මස සිට අර්තාපල්, රතුළූණු, සුදුළූණු, කව්පි, කඩල, පරිප්පු, එළවළු තෙල්, මාළු, සීනි, ඇපල්, මිදි සහ දොඩම් වැනි තෝරාගත් වෙළෙඳ භාණ්ඩ ආනයනය සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාතික ඉහළ දැමීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, දේශීය වෙළෙඳපොළේ මිල ස්ථාවරත්වය පවත්වා ගනිමින් කෘෂි නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති ද මෙම ආදායම් වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් විය.

### අනෙකුත් බදු

2019 වසරේ දෙසැම්බර් මස 06 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු අනුපාතිකය සියයට 7.5 සිට සියයට 10.0 දක්වා ඉහළ දැමීම සහ බොරතෙල් හැර අනෙකුත් සියළුම සහනදායී බදු අනුපාතික සියයට 2.5 කින් වැඩි කිරීම කළ ද, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු මගින් ඉපයූ ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 73.8 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 71.8 දක්වා සියයට 2.8 කින් සුළු වශයෙන් අඩු විය. කෙසේ වුවද, තෝරා ගත් භාණ්ඩ ආනයනය සීමා කිරීම සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ගෙවීම් නිදහස් කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු අනුපාත ඉහළ නැංවීම තුළින් අපේක්ෂිත ආදායම නොඉක්මවන ලදී. එමෙන්ම සෙස් බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 32.4 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 31.3 දක්වා සියයට 3.4 කින් පහත වැටී ඇත. විදුලි සංදේශ බදු තුළින් ලද ආදායම 2019 වසරේ දී වූ රු. බිලියන 12.5 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 8.8 දක්වා සියයට 30.0 කින් සැලකිය යුතු ලෙස අඩු විය. 2019 වසරේ දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි වාචික සන්නිවේදනය සඳහා වන විදුලි සංදේශ බදු අනුපාතිකය සියයට 15.0 සිට සියයට 11.25 දක්වා අඩු කිරීම මේ සඳහා හේතු වී ඇත.

**වගුව 1.9 : ජාතිය ගොඩනැගීමේ බදු, මුද්දර බදු සහ මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | 2019 ජන. - අගෝ. | | | 2020 ජන. - අගෝ.(අ) | | | වෙනස 2019/2020 ජන. - අගෝ. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව | මධ්‍යම රජය | පළාත් සභා | එකතුව |
| ජාතිය ගොඩනැගීමේ බදු* | 47,957 | 23,978 | 71,935 | 1,866 | 933 | 2,800 | -96.1 | -96.1 | -96.1 |
| දේශීය | 34,703 | 17,351 | 52,054 | 1,754 | 877 | 2,631 | -94.9 | -94.9 | -94.9 |
| ආනයන | 13,254 | 6,627 | 19,881 | 112 | 56 | 168 | -99.2 | -99.2 | -99.2 |
| මුද්දර බදු** | - | 7,053 | 7,053 | - | 4,374 | 4,374 | - | -38.0 | -38.0 |
| මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු*** | 489 | 1,141 | 1,630 | 372 | 869 | 1,241 | -58.9 | -58.9 | -58.9 |
| **එකතුව** | **48,446** | **32,173** | **80,618** | **2,239** | **6,176** | **8,415** | **-95.7** | **-82.0** | **-90.3** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

* ජාතිය ගොඩනැගීමේ බද්ද 2019.12.01 දින සිට අහෝසි කර ඇත.

**2011 වසරේ සිට මුද්දර බදු ආදායම මගින් ඉපයූ සම්පූර්ණ ආදායම මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත මාරු කරනු ලැබේ.

***මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් මධ්‍යම රජය විසින් ඉපයූ ආදායමෙන් පළාත් සභාවලට මාරු කරන ලද සියයට 70 ට අදාළ සංඛ්‍යා දැක්වේ

**වගුව 1.10 : ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020(අ) |
|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **1,563** | **1,224** |
| තේ - (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ | 526 | 272 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 4 | 4 |
| පොල් - පොල් සංවර්ධන අධිකාරි පනත යටතේ | 90 | 129 |
| අ.සං.ම. සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 942 | 819 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | **30,834** | **30,062** |
| **එකතුව** | **32,397** | **31,286** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

**බදු නොවන ආදායම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ රු. බිලියන 24 ක ලාභ පැවරුම්, කුලී ලැබීම් සහ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබුණ ආදායම් වැඩි වීම හේතුවෙන් බදු නොවන ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 99.6 සිට 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 105.0 දක්වා සියයට 5.4 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් 2020 වසරේ පෙබරවාරි මස දී රු. බිලියන 8.6 ක කුලී ආදායමක් ලැබීම හේතුවෙන් කුලී ආදායමෙන් ලද ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 2.8 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 9.8 දක්වා සියයට 245.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලද ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 18.2 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 20.8 දක්වා සියයට 13.8 කින් වැඩි විය. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතයෙහි බලපෑම පෙන්නුම් කරමින් බදු නොවන ආදායමට දායක වූ පොලී ආදායම, ප්‍රධාන ව්‍යවසායයන්ගෙන් ලැබෙන ලාභ හා ලාභාංශ පැවරුම් සහ ගාස්තු හා අයකිරීම් පිළිවෙළින් රු. බිලියන 4.7 ක්, රු. බිලියන 7.7 ක් සහ රු. බිලියන 34.6 ක් දක්වා සියයට 47.7 කින්, සියයට 45.6 කින් සහ සියයට 33.4 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. සමස්තයක් ලෙස, මුළු බදු ආදායමට බදු නොවන ආදායමෙහි දායකත්වය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 8.3 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී සියයට 11.6 දක්වා වැඩි විය.

**වගුව 1.11 : රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2020 ජනවාරි සිට අගෝස්තු**

රු. බිලියන

| අයිතමය | 2019 | 2020 ඇස්තමේන්තුව | 2020 තත්‍ය | හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 238.2 | 324.0 | 167.4 | 2019 වසරේ සමාන කාලය තුළ වාර්තා කල රු. බිලි. 74.9 හා සැසඳීමේ දී 2020 වර්ෂයේ මුල් මාස තුන තුළ රු. බිලි. 79.3 ක් දක්වා ආදායම් බදු ආදායම සියයට 5.9 කින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, 2020 මාර්තු මස මැද භාගයේ සිට ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ආදායම් බදු ආදායම රු. බිලි. 167.4 දක්වා සියයට 29.7 කින් පහල බැස ඇත. එමෙන්ම 2020 වර්ෂයේ අගෝස්තු මාසය අවසන්වන විට 2020 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 51.7 ක් ලඟාකරගෙන ඇත. සලකා බලන කාලය තුළ ප්‍රාග්ධන ලාබ බද්ද ද ඇතුළත් වූ සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු රු. බිලි. 136.2 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය වී ඇත. කොවිඩ්-19 ව්‍යාප්තියත් සමගින් රාජ්‍ය මූල්‍ය සහන පැකේජයක් වශයෙන් රජය විසින් 2019 වසරේ අවසාන භාගයේ දී හඳුන්වාදුන් බදු ප්‍රතිසංස්කරණ තවදුරටත් අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකරගැනීම පමාකර ඇත. |
| එකතු කළ අගය මත බදු | 301.8 | 241.0 | 137.8 | එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කිරීමත් සමගින් කොවිඩ්-19 වසංගත තත්ත්වය ව්‍යාප්තවීමේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ක්‍රියාකාකම් පහත බැසීම තුලින් ඇතිකල බලපෑම තවදුරටත් පෙන්නුම් කරමින් අදාල කාලය තුලදී එකතු කළ අගය මත බද්ද රු. බිලි. 137.8 දක්වා සියයට 54.3 කින් සැලකියයුතු ලෙස පහත වැටී ඇති අතර, එය වාරෂික ඇස්තමේන්තුවෙන් සියයට 57.2 ක ලඟාකර ගැනීමකි. දේශීය ක්‍රියාකාරකම් මත මෙන්ම ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් මත අයකරනු ලබන එකතු කළ අගය මත බද්ද රු.බිලි. 87.4 දක්වා සියයට 53.3 කින් සහ රු. බිලි. 51.6 දක්වා සියයට 55.3 කින් පිළිවෙළින් අඩු විය. වසරකට රු. මිලි. 12 ක්ව පැවති එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචිමේ අවම සීමාව වසරකට රු. මිලි. 300 දක්වා පහත දැමීම තවදුරටත් මෙම කාර්යසාධනය සඳහා බලපා ඇත. |

වගුව **1.11** : **රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2020 ජනවාරි සිට අගෝස්තු** *(සම්බන්ධිතයි...)*

රු. බිලියන

| අයිතමය | 2019 | 2020 ඇස්තමේන්තුව | 2020 තත්‍ය | හේතු |
|---|---|---|---|---|
| නිෂ්පාදන බදු | 259.5 | 355.0 | 214.8 | 2019 වසරේ සමාන කාලය තුළ වාර්තා කළ රු. බිලි. 94.6 හා සැසඳීමේ දී 2020 වසරේ පළමු මාස තුන තුළ නිෂ්පාදන බදු ආදායම රු. බිලි 105.6 දක්වා සියයට 11.6 කින් ඉහළගොස් ඇත. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතය මගින් ඇතිකළ බලපෑම පිළිබිඹු කරමින් 2019 වර්ෂයේ සමාන කලය තුළ වාර්තාකරන ලද රු. බිලි. 259.5 හා සැසඳීමේ දී 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී නිෂ්පාදන බදු ආදායම රු. බිලි. 214.8 දක්වා සියයට 17.2 කින් පහත බැස ඇත. එය 2020 වර්ෂයේ ඇස්තමේන්තුවෙන් සියයට 60.5 ක ලඟාකර ගැනීමකි. සලකා බලනු ලබන කාලය තුළ සිගරට් අලෙවිය පහතවැටීම හමුවේ වුව ද දුම්වැටි මගින් ලද ආදායම රු.බිලි.58.9 දක්වා සියයට 0.3 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, 2020 වසරේ මාර්තු මස සිට ක්‍රියාත්මක කළ මෝටර් රථවාහන ආනයන සීමා පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථවාහන ආනයනය තුළින් ලත් නිෂ්පාදන බදු ආදායම රු. බිලි. 43.1 දක්වා සියයට 47.1 කින් පහත වැටී ඇත. විශේෂයෙන්ම වසංගත කාලය තුළ දී මත්පැන් අලෙවිය සහ නිෂ්පාදනය පහළයෑම හේතුවෙන් සලකා බලනු ලබන කාලය තුළ මත්පැන් මගින් ලද ආදායම රු. බිලි. 72.5 දක්වා සියයට 4.1 කින් පහත බැස ඇත. මේ අතර, වසර ආරම්භයේ දී ඉහළ ආදායම් කාර්යසාධනයක් පැවතිය ද, පෙට්‍රල් හා ඩීසල් ආනයන පහත බැසීම හේතුවෙන් 2020 වසරේ පළමු මාස අට තුළ ඛණිජ තෙල් නිෂ්පාදන මගින් ලද ආදායම රු. බිලි. 37.3 දක්වා සියයට 8.4 කින් පහළ ගොස් ඇත. එමෙන්ම සලකා බලනු ලබන කාලය තුළ අනෙකුත් නිෂ්පාදන මගින් ලද ආදායම රු. බිලි.2.8 දක්වා සියයට 14.8 කින් පහළ ගොස් ඇත. |
| රේගු ආනයන බදු | 64.0 | 140.0 | 73.2 | 2020 වසරේ මාර්තු මස මැද සිට මේ දක්වා ක්‍රියාත්මක වන ආනයන සීමාකිරීමේ ප්‍රතිපත්තිය මධ්‍යයයේ වුව ද, 2019 වර්ෂයේ සමාන කාලයතුළ වාර්තා කරන ලද රු. බිලි. 64.0 හා සංසන්දනය කිරීමේදී 2020 වසරේ පළමු මාස අට තුළ ආනයන බදු ආදායම රු. බිලි. 73.2 දක්වා මධ්‍යස්ථව වැඩී වී ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 52.3 ක ලඟාකර ගැනීමකි. 2020 වසරේ අප්‍රේල් මස සිට පෙට්‍රල් හා ඩිසල් ආනයනය මත බදු ඉහළ දැමීම හා ඩිසල් හා පෙට්‍රල් සඳහා ලබාදී තිබූ තීරු බදු අත්හැරීම් ඉවත්කිරීම මෙම වැඩිදියුණු වූ ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 46.9 | 98.0 | 55.1 | 2019 වසරේ සමාන කාලය තුළ වාර්තා වූ රු. බිලි. 46.9 හා සැසඳීමේදී 2020 වසරේ පළමු මාස අට තුළ විශේෂ වෙළඳ භාණ්ඩ බදු මගින් උපයන ලද ආදායම රු. බිලි. 55.1 දක්වා සියයට 17.7 කින් වර්ධනය වී ඇත. එය 2020 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 56.2 ක ලඟාකරගැනීමකි. දොඩම්, මිදි, ඇපල්, සීනි, මාළු, එළවළු තෙල්, පරිප්පු, කවුපි, කඩල, සුදුළූණු, රතු ළූණු සහ අර්තාපල් ඇතුළු තෝරාගත් පාරිභෝගික භාණ්ඩ ආනයනයේදී අයකරනු ලබන විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතයන් ඉහළ දැමීම මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. |

**වගුව 1.11 : රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2020 ජනවාරි සිට අගෝස්තු** *(සම්බන්ධිතයි...)*

රු. බිලියන

| අයිතමය | 2019 | 2020 ඇස්තමේන්තුව | 2020 තත්‍ය | හේතු |
|---|---|---|---|---|
| වෙනත් බදු | 168.1 | 200.0 | 136.4 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 74.5 ක් ලඟාකර ගැනිමින්, 2020 වසරේ පළමු මාස අට තුළ අනෙකුත් බදු මගින් උපයන ලද ආදායම සියයට 18.9 කින් පහළ බැස ඇත. 2020 වාර්ෂික ඇස්තමේන්තුවෙන් 62.4 ක් අත්කරග නිමින්, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද රු. බිලි. 71.8 දක්වා සියයට 2.8 කින් පහත බැස ඇත. කොවිඩ් -19 වසංගත තත්ත්වය සමගින් ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තියේ බලපෑම හේතුවෙන් සෙස් බදු මගින් උපයන ලද ආදායම රු. බිලි. 31.3 දක්වා සියයට 3.4 කින් පහළ බැස ඇත. 2020 වසරේ පළමු භාගයේ දී අන්තර්ජාතික දුරකතන ඇමතුම් ලැබීම් කාලය පහළ යාම සහ 2019 දෙසැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙතෙක් දුරකථන ඇමතුම් සඳහා පැවති සියයට 15 ක් වූ බදු අනුපාතය සියයට 11.25 දක්වා පහළ දැමීමෙහි ප්‍රතිඵලයක් ලෙස විදුලිසංදේශ බද්ද රු. බිලි. 8.8 දක්වා සියයට 30 කි න් පහළ බැස ඇත. 2020 ජනවාරි 01වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය ආපසු ගෙවීමේ බද්ද ඉවත් කිරීම හා 2019 දෙසැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම තවදුරටත් මෙම විචලනය කෙරෙහි බලපා ඇත. |
| බදු නොවන ආදායම | 99.6 | 162.0 | 105.0 | පසුගිය වසරේ සමාන කාලය තුළ වාර්තාකළ රු. බිලි. 99.6 හා සැසඳීමේ දී 2020 මුල් මාස අට තුළ බදු නොවන ආදායම රු.බිලි. 105.0 දක්වා සියයට 5.4 කින් ඉහළ ගොස් ඇත. එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 64.8 ක ලඟාකර ගැනීමකි. මහ බැංකු ලාභ රු. බිලි. 24.0 ක් වාර්තා කිරීම, කුලී ආදායම් රු. බිලි.10 ක් හා සමාජ ආරක්ෂණ දායක මුදල් රු. බිලි. 20.8 ක් ලැබීම බදු නොවන ආදායමෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. කෙසේ වුවද, කොවිඩ් -19 වසංගතයේ බලපෑම හේතුවෙන් සලකාබලනු ලබන කාලය තුළ පොළී ආදායම, රජය සතු ව්‍යාපාරයන්ගෙන් ලැබෙන ලාභ හා ලාභාංශ ලැබීම් මෙන්ම විකුණුම් හා අයකිරීම් රු. බිලි. 4.7, 7.7 සහ රු. බිලි. 34.5 දක්වා සියයට 47.7, 45.6 කින් සහ සියයට 33.4 කින් පිළිවෙලින් පහළ බැසීම බදු නොවන ආදායම කෙරෙහි ප්‍රධාන වශයෙන් ඍණාත්මකව බලපා ඇත. |
| **එකතුව** | **1,205.0** | **1,520.0** | **906.4** | |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

සටහන 3 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර්

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|

**2020.01.01**

**ආදායම් බදු - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**
**සංස්ථාපිත ආදායම් බදු**

| කාණ්ඩය | අනුපාතය |
|---|---|
| සම්මත ආදායම් බදු අනුපාතය | 24% |
| නිෂ්පාදන කර්මාන්තය සඳහා අදාල වන ආදායම් බදු අනුපාතය | 18% |
| අපනයන, සංචාරක, අධ්‍යාපන, සෞඛ්‍ය සේවා, ඉදිකිරීම් සහ කෘෂි සැකසුම් යන ක්ෂේත්‍ර සඳහා අදාල වන ආදායම් බදු අනුපාතය | 14% |
| ඔට්ටු සහ සූදු, මධ්‍යසාර සහ දුම්කොල නිෂ්පාදන සඳහා අදාල වන ආදායම් බදු අනුපාතය | 40% |

**2020.01.01**

**පුද්ගල ආදායම් බදු**

| වාර්ෂික බදු අයවන ආදායම | අනුපාතය |
|---|---|
| පළමු 3,000,000 | නිදහස් |
| 3,000,000 - 6,000,000 | 6% |
| 6,000,000 - 9,000,000 | 12% |
| 9,000,000 ඉක්මවන | 18% |

**2020.01.01**

**සේවාස්ථ ප්‍රතිලාභ**

| සේවාස්ථ ආදායම් ප්‍රතිලාභ | අනුපාතය |
|---|---|
| පළමු 10,000,000 | නිදහස් |
| ඊළඟ 10,000,000 | 6% |
| ඉතිරිය | 12% |

**2020.01.01**

**උපයන විට ගෙවීම් බද්ද (උ.වි.ගෙ.)**

- වාසික සහ නිර්වාසික තැනැත්තන්ගේ සේවා නියුක්ති ආදායම මත අයවන උපයන විට ගෙවීම් බද්ද ඉවත් කිරීමට සහ සේවකයාගේ කැමැත්තට යටත්ව පඩිනඩි ගෙවීමේදී අඩුකල හැකි පුද්ගල ආදායම් අත්තිකාරම් බද්ද හඳුන්වා දීම.

**2020.01.01**

**රඳවා ගැනීමේ බද්ද (ර.ගැ.බ.)**

- පහත සඳහන් ගෙවීම් හැර යම් තැනැත්තන්ට කරන අනෙකුත් ගෙවීම් මත අයවන ර.ගැ.බ. ඉවත් කිරීම;
  - ලොතරයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් ලද දිනුම් ලෙස මුදල් ප්‍රමාණයක් ගෙවන අවස්ථාවක ර.ගැ.බ. - 14%
  - ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් පවත්වනු ලබන යම් වෙන්දේසියක දී විකුණනු ලබන යම් මැණිකක විකුණුම් මිලෙන් ර.ගැ.බ. - 2.5%
  - නිර්වාසික තැනැත්තන්ට කරන ගෙවීම් මත ර.ගැ.බ. - 14%

**2020.01.01**

**ආදායම් බද්දෙන් නිදහස් කිරීම්**

- තොරතුරු තාක්ෂණ සැපයීම් හා සඵල සේවා තුළින් උපයන ලාභය හා ආදායම්.
- විදේශීය මූලාශ්‍ර වලින් උපයන ආදායමද ඇතුලුව ලංකාවෙන් පිටත පුද්ගලයන්ට ලබාදෙන සේවා මගින් උපයන ලාභය හා ආදායම, එකී සේවා සඳහා වන ගෙවීම් හෝ එකී ආදායම බැංකු හරහා විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන්නේ නම්.
- අනේවාසික සහ නේවාසික විදේශ ව්‍යවහාර ගිණුම් සඳහා ලැබෙන පොලී ආදායම.
- දේශීය සමාගමක් විසින් නිර්වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන ලාභාංශ.
- වාණිජ කේන්ද්‍රස්ථාන ව්‍යාපාර විසින් කරන ලාභාංශ බෙදාහැරීම්.
- රසායනාගාර සේවා හෝ තත්ත්ව සහතික ලබා දීමේ සේවා මගින් නිර්වාසික තැනැත්තෙකු විසින් උපයන මුදල්
- ප්‍රදාන හෝ පරිත්‍යාග ලෙස යම් ආගමික ස්ථානයකට ලැබෙන මුදල්.

සටහන 3 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර් *(සම්බන්ධිතයි...)*

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2019.04.01 | - කෘෂිකාර්මික, පශු සම්පත් සහ මත්ස්‍ය වගාව ඇතුළුව වගා ව්‍යාපාර තුළින් උපයන ලාභ සහ ආදායම්. |
| 2018.04.01 | - ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයෙකුගෙන් ලබාගෙන ඇති ණය මත සිදුකරන පොලී ගෙවීම්.<br>- විදේශීය හෝ දේශීය මුදල් ලෙස නම්කර ඇති ඕනෑම ස්වෛරීත්ව බැඳුම්කරයක් මත නිර්වාසික පුද්ගලයෙකු උපයන ආදායම්.<br>- විදේශ ව්‍යවහාර මුදලින් නම්කර ඇති ස්වෛරීත්ව බැඳුම්කර මත ඕනෑම පුද්ගලයෙකු ලබන පොලී හෝ වට්ටම්.<br>- රාජ්‍ය සංස්ථාවකට ලැබෙන, ඒකාබද්ධ අරමුදලින් හෝ රජය විසින් සැලසුම් කරන ණය මුදලකින්, පාර්ලිමේන්තුව විසින් වෙන්කරනු ලබන අරමුදල්. |
| | **ආර්ථික සේවා ගාස්තුව - 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත** |
| 2020.01.01 | - ආර්ථික සේවා ගාස්තුව ඉවත් කිරීම. |
| | **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** |
| 2020.01.01 | - එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය වන සැපයුම් සීමාව වසරකට රු. මිලියන 12 සිට වසරකට රු. මිලියන 300 දක්වා ඉහළ නැංවීම.<br>- තොරතුරු තාක්ෂණ හා සඵල සේවා සැපයීම් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම. |
| 2020.04.01 | - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක නියෝජිතයෙකු විසින් අභ්‍යන්තර සංචාර සඳහා වන සේවා සැපයීම නිදහස් කිරීම. |
| 2020.04.22 | - වැට් බදු ගෙවීම නිදහස් කිරීම<br>සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය සහ කොවිඩ් මධ්‍යස්ථානය (කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත ඔවුන්ගේ ඉල්ලීම පරිදි, අපනයන අරමුණු කර ගත් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් විසින් සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සැපයීම හෝ පරිත්‍යාග කිරීම. |
| 2020.05.20 | - වැට් බදු ගෙවීම නිදහස් කිරීම<br>කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය සේවා සැපයීමේ දී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය හා දන්ත උපකරණ, මෙවලම්, උපාංග සහ කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ භාණ්ඩ හා ඖෂධ, රසායනික ද්‍රව්‍ය හා සමාන භාණ්ඩ ඇතුළු යන්ත්‍රෝපකරණ හා උපකරණ ආනයනය කිරීම, ආනයනය කිරීම සහ සැපයීම හෝ ආනයනය කිරීම සහ පරිත්‍යාග කිරීම. |
| | **නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත** |
| 2020.03.06 | 2020.03.06 දිනැති අංක 2165/60 දරන ගැසට් නිවේදනය.<br>- 2019.03.05 දිනැති අංක 2113/9 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ II වන උපලේඛනය සංශෝධනය කිරීම. |
| 2020.06.02 | 2020.06.02 දිනැති අංක 2178/15 දරන ගැසට් නිවේදනය,<br>- කාර්මික මේද අම්ල සඳහා තීරුබදු අනුපාතය 20% සිට 24% දක්වා වැඩි කිරීම. |
| 2020.08.22 | 2020.08.21 දිනැති අංක 2189/47 දරන ගැසට් නිවේදනය,<br>- කාබනීකෘත බීම සහ පලතුරු පදනම් කරගත් බීම සඳහා බදු රහිත සීමාව සහ බදු අනුපාත සංශෝධනය කිරීම. |
| | **සුරා බද්ද - සුරා බදු ආඥා පනත (52 වන අධිකාරය)** |
| 2020.03.01 | සුරාබදු නිවේදන අංක 01/2020 (2020.03.01 දිනැති අංක 2164/72 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 04/2019 හි දැක්වෙන රීති සංශෝධනය කිරීම. |
| 2020.04.30 | සුරාබදු නිවේදන අංක 02/2020 (2020.04.30 දිනැති අංක 2173/11 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 988 හි උපලේඛනය සංශෝධනය කිරීම. |
| 2020.06.01 | සුරාබදු නිවේදන අංක 03/2020 (2020.06.01 දිනැති අංක 2178/4 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 01/2020 හි රීති සංශෝධනය කිරීම. |
| 2020.06.09 | සුරාබදු නිවේදන අංක 04/2020 (2020.06.09 දිනැති අංක 2179/9 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 02/2020 හි උපලේඛනය සංශෝධනය කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | **වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත** |
| 2020.02.25 | 2020.02.24 දිනැති අංක 2164/15 දරන ගැසට් නිවේදනය.<br>- ක්ලින්කර් ආනයනය මත 7.5% සහනදායී අනුපාතය ප්‍රදානය කිරීම. |
| 2020.04.16 | 2020.04.16 දිනැති අංක 2171/06 දරන ගැසට් නිවේදනය.<br>- පරිත්‍යාග ලෙස සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශ ලේකම් නමට වෛද්‍ය උපකරණ සහ රෝහල් ගෘහ භාණ්ඩ ආනයනය කිරීම වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කිරීම. |
| 2020.04.23 | 2020.04.22 දිනැති අංක 2172/10 දරන ගැසට් නිවේදනය<br>- වානේ කර්මාන්තයට අදාල අමුද්‍රව්‍ය ආනයනය මත 5.0% සහනදායී අනුපාතය ප්‍රදානය කිරීම. |
| 2020.05.19 | 2020.05.19 දිනැති අංක 2176/10 දරන ගැසට් නිවේදනය<br>- වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු ගෙවීම නිදහස් කිරීම:<br>සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ කොවිඩ් මධ්‍යස්ථානය (කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත ඔවුන්ගේ ඉල්ලීම පරිදි, අපනයන අරමුණු කරගත් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් විසින් සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සැපයීම හෝ පරිත්‍යාග කිරීම.<br>කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය සේවා සැපයීමේදී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය හා දන්ත උපකරණ, මෙවලම්, උපාංග සහ කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ භාණ්ඩ හා ඖෂධ, රසායනික ද්‍රව්‍ය හා සමාන භාණ්ඩ ඇතුළු යන්ත්‍රෝපකරණ හා උපකරණ ආනයනය කිරීම, ආනයනය කිරීම සහ සැපයීම හෝ ආනයනය කිරීම සහ පරිත්‍යාග කිරීම. |
| 2020.05.26 | 2020.05.26 දිනැති අංක 2177/4 දරන ගැසට් නිවේදනය<br>- වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ගෙවීම නිදහස් කිරීම:<br>ඖෂධ නිෂ්පාදනය සඳහා ඖෂධ නිෂ්පාදකයින් විසින් අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීම. |
| 2020.09.03 | 2020.09.02 දිනැති අංක 2191/25 දරන ගැසට් නිවේදනය<br>- තෙල් නිස්සාරණ කර්මාන්තය සඳහා භාවිතා කරන යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමේදී සියයට 2.5 ක සහන අනුපාතයක් ලබා දීම. |
| | **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** |
| 2020.01.14 | 2020.01.13 දිනැති අංක 2158/1 දරන ගැසට් නිවේදනය.<br>- තිරිඟු පිටි ආනයනය මත සෙස් බද්ද ඉවත් කිරීම. |
| 2020.05.20 | 2020. 05.20 දිනැති අංක 2176/13 දරන ගැසට් නිවේදනය<br>- සෙස් ගෙවීම නිදහස් කිරීම සඳහා:<br>සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ කොවිඩ් මධ්‍යස්ථානය (කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත ඔවුන්ගේ ඉල්ලීම පරිදි, අපනයන අරමුණු කරගත් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් විසින් සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සැපයීම හෝ පරිත්‍යාග කිරීම.<br>කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය සේවා සැපයීමේදී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය හා දන්ත උපකරණ, මෙවලම්, උපාංග සහ කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ භාණ්ඩ හා ඖෂධ, රසායනික ද්‍රව්‍ය හා සමාන භාණ්ඩ ඇතුළු යන්ත්‍රෝපකරණ හා උපකරණ ආනයනය කිරීම, ආනයනය කිරීම සහ සැපයීම හෝ ආනයනය කිරීම සහ පරිත්‍යාග කිරීම. |
| 2020.06.03 | 2020.06.03 දිනැති අංක 2178/21 දරන ගැසට් නිවේදනය<br>- සිමෙන්ති ක්ලින්කර් සහ සිමෙන්ති ආනයනය කිරීමේදී අය කරන සෙස් බදු පදනම ප්‍රමාණාත්මක අනුපාතයේ සිට ඒකක අනුපාතයට සංශෝධනය කිරීම. |
| 2020.07.01 | 2020.06.30 දිනැති අංක 2182/21 දරන ගැසට් නිවේදනය<br>- පපඩම්, තල් රා, තල් අරක්කු, කුරුඳු අඩංගු සිගරට්, පාවහන් උඩ කොටස් සහ සූත්‍රිකා බල්බ ආනයනය කිරීම සඳහා සෙස් බදු හඳුන්වා දීම සහ සිමෙන්ති ආනයනය කිරීමේදී පැවති සෙස් බදු සංශෝධනය කිරීම. |

සටහන 3 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර් *(සම්බන්ධිතයි...)*

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2020.07.01 | 2020.06.30 දිනැති අංක 2182/22 දරන ගැසට් නිවේදනය<br>- සිමෙන්ති ක්ලින්කර් ආනයනය කිරීමේදී සෙස් බද්ද ඉවත් කිරීම. |
| | **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්‍ෂණ පනත** |
| 2020.03.08 | ආදායම් සංරක්‍ෂණ නියෝග අංක 01/2020 (2020.03.07 දිනැති අංක 2165/72 දරන ගැසට් නිවේදනය)<br>- බෝංචි ඇට ආනයනය මත රේගු බදු සංශෝධනය කිරීම. |
| 2020.04.10 | ආදායම් සංරක්‍ෂණ නියෝග අංක 02/2020 (2020.04.09 දිනැති අංක 2170/6 දරන ගැසට් නිවේදනය)<br>- ලිහිසි තෙල් ආනයනය මත රේගු බදු සංශෝධනය කිරීම. |
| 2020.04.17 | ආදායම් සංරක්‍ෂණ නියෝග අංක 03/2020 (2020.04.16 දිනැති අංක 2174/4 දරන ගැසට් නිවේදනය)<br>- තෝරාගත් භාණ්ඩ ආනයනය මත රේගු බදු සංශෝධනය කිරීම. |
| 2020.04.23 | ආදායම් සංරක්‍ෂණ නියෝග අංක 04/2020 (2020.04.22 දිනැති අංක 2172/7 දරන ගැසට් නිවේදනය)<br>- පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත රේගු බදු සංශෝධනය කිරීම. |
| 2020.06.19 | ආදායම් සංරක්ෂණ නියෝග අංක 05/2020<br>(2020.06.18 දිනැති අංක 2180/31 දරන ගැසට් නිවේදනය)<br>තෝරා ගත් භාණ්ඩ සඳහා නව සංයෝජිත සංකේත නිර්මාණය කිරීම සහ තෝරා ගත් භාණ්ඩ ආනයනය මත රේගු තීරු බදු සංශෝධනය කිරීම. |
| 2020.07.08 | ආදායම් සංරක්ෂණ නියෝග අංක 06/2020<br>(2020.07. 08 දිනැති අංක 2183/27 දරන ගැසට් නිවේදනය)<br>උඳු ඇට ආනයනය මත පනවා ඇති රේගු බදු වලංගු කාල සීමාව දීර්ඝ කිරීම. |
| 2020.09.22 | ආදායම් සංරක්ෂණ නියෝග අංක 07/2020<br>(2020.09.21 දිනැති අංක 2194/5 දරන ගැසට් නිවේදනය)<br>උන පතුරු ආනයනය මත රේගු බදු සංශෝධනය කිරීම |
| | **රේගු අධිභාරය - රේගු ආඥාපනත (232 වැනි අධිකාරය)** |
| 2020.03.14 | 2020.03.13 දිනැති අංක 2166/35 දරන ගැසට් නිවේදනය.<br>- පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත අදාල වන රේගු බද්ද මත අධිභාරය හඳුන්වාදීම. |
| 2020.04.23 | 2020.04.22 දිනැති අංක 2172/6 දරන ගැසට් නිවේදනය.<br>- පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත අදාල වන රේගු අධිභාරය වැඩි කිරීම. |
| 2020.06.24 | 2020. 06.24 දිනැති අංක 2181/13 දරන ගැසට් නිවේදනය.<br>- පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත අදාල වන රේගු අධිභාරය අඩු කිරීම සහ මාස දෙකක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.08.24 | 2020.08.23 දිනැති අංක 2189/57 දරන ගැසට් නිවේදනය.<br>- පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත අදාල වන දැනට පවතින රේගු අධිභාරය මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| | **රේගු ආනයන බදු නිදහස් කිරීම - රේගු ආඥාපනත (232 වැනි අධිකාරය)** |
| 2020.01.14 | - තිරිඟු පිටි ආනයනය මත කි. ග්‍රෑමයට රු. 13 ක රේගු බදු නිදහස් කිරීම හඳුන්වාදීම. |
| 2020.03.14 | - ඔටෝ ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 3 ක රේගු බදු නිදහස් කිරීම ඉවත් කිරීම.<br>- පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 17 සිට ලීටරයකට රු. 5 දක්වා අඩු කිරීම. |
| 2020.04.23 | - පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත අදාල වන ලීටරයට රු. 5 ක රේගු බදු නිදහස් කිරීම ඉවත් කිරීම. |
| 2020.06.30 | - පෙට්‍රල් (ඔක්ටේන් 92 සහ ඔක්ටේන් 95) ආනයනය මත ලීටරයකට රු. 6 ක රේගු බදු නිදහස් කිරීම හඳුන්වා දීම.<br>- සුපර් ඩීසල් සහ ඔටෝ ඩීසල් ආනයනය මත පිළිවෙලින් ලීටරයකට රු. 5 ක සහ ලීටරයකට රු. 7 ක රේගු බදු නිදහස් කිරීම හඳුන්වා දීම. |

සටහන 3 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර් *(සම්බන්ධිතයි...)*

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2020.09.17 | - පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 6 සිට රු. 11 දක්වා වැඩි කිරීම.<br>- ඔටෝ ඩීසල් ආනයනය මත රේගු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 7 සිට ලීටරයකට රු. 8 දක්වා වැඩි කිරීම. |
| | **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** |
| 2020.01.25 | 2020.01.24 දිනැති අංක 2159/41 දරන ගැසට් නිවේදනය.<br>- අර්තාපල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.02.02 | 2020.02.01 දිනැති අංක 2160/63 දරන ගැසට් නිවේදනය.<br>- බොම්බයි ළූණු, කොණ්ඩ කඩල, රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අළුත් සහ වියළි), දොඩම් (අළුත්), ඇපල් (අළුත්), බඩ ඉරිඟු, එළවළු තෙල්, උක් සීනි, බීට් සීනි, සුදු ස්ඵටිකකෘත, උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වලංගු කාලසීමාව මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.02.07 | 2020.02.06 දිනැති අංක 2161/34 දරන ගැසට් නිවේදනය.<br>- මාළු (අළුත්, ශීතකල හෝ අධිශීතනය කල) ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා කිලෝ ග්‍රෑමයට රු. 25 දක්වා අඩු කිරීම. |
| 2020.02.25 | 2020.02.24 දිනැති අංක 2164/10 දරන ගැසට් නිවේදනය.<br>- අර්තාපල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.03.04 | 2020.03.03 දිනැති අංක 2165/12 දරන ගැසට් නිවේදනය.<br>- මාළු (අළුත්, ශීතකල හෝ අධිශීතනය කල) ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා කිලෝ ග්‍රෑමයට රු.150 දක්වා වැඩි කිරීම. |
| 2020.03.08 | 2020.03.07 දිනැති අංක 2165/73 දරන ගැසට් නිවේදනය.<br>- මැකරල්, උඳු, කව්පි සහ කුරක්කන් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වලංගු කාලසීමාව මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.03.13 | 2020.03.13 දිනැති අංක 2166/34 දරන ගැසට් නිවේදනය.<br>- 03.03.2020 දිනැති අංක 2165/12 දරන ගැසට් නිවේදනයේ සඳහන් මාළු ඇම ආනයනය සම්බන්ධයෙන් වන නියෝගයේ අතීතයට බලපෑම ඉවත් කිරීම. |
| 2020.03.18 | 2020.03.18 දිනැති අංක 2167/10 දරන ගැසට් නිවේදනය.<br>- 2020.03.03 දිනැති අංක 2165/12 දරන ගැසට් නිවේදනයේ සඳහන් මාළු (අළුත්, ශීතකල හෝ අධිශීතනය කල) ආනයනය සම්බන්ධයෙන් වන නියෝගයේ අතීතයට බලපෑම ඉවත් කිරීම. |
| 2020.03.19 | 2020.03.18 දිනැති අංක 2167/11 දරන ගැසට් නිවේදනය.<br>- විෂබීජනාශක සහ මුහුණු ආවරණ ආනයනය මත කිලෝ ග්‍රෑමයට රු. 1 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලයක් සඳහා පැනවීම. |
| 2020.03.27 | 2020.03.26 දිනැති අංක 2168/7 දරන ගැසට් නිවේදනය.<br>- අර්තාපල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වලංගු කාලසීමාව මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.04.10 | 2020.04.09 දිනැති අංක 2170/5 දරන ගැසට් නිවේදනය.<br>- එළවළු තෙල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා සංශෝධනය කිරීම. |
| 2020.04.17 | 2020.04.16 දිනැති අංක 2171/2 දරන ගැසට් නිවේදනය<br>- දොඩම් (අළුත්), මිදි (අළුත් සහ වියළි) සහ ඇපල් ඇතුළු පළතුරු ආනයනය මත අදාලවන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලයක් සඳහා සංශෝධනය කිරීම. |
| 2020.04.17 | 2020.04.16 දිනැති අංක 2171/3 දරන ගැසට් නිවේදනය<br>- එළවළු තෙල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා නිදහස් කිරීම. |
| 2020.05.01 | 2020.04.30 දිනැති අංක 2173/12 දරන ගැසට් නිවේදනය<br>- බොම්බයි ළූණු ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා කිලෝ ග්‍රෑමයට රු. 1 සිට කිලෝ ග්‍රෑමයට රු. 15 දක්වා වැඩි කිරීම. |
| 2020.05.08 | 2020.05.07 දිනැති අංක 2174/7 දරන ගැසට් නිවේදනය<br>- හාල්මැස්සන්, කරවල, මුංඇට, මැංගුස්ටීන් (වියළි හා අළුත්) සහ කිව්ෆෘට් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වලංගු කාල සීමාව මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |

සටහන 3 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර් *(සම්බන්ධිතයි...)*

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2020.05.22 | 2020.05.21 දිනැති අංක 2176/18 දරන ගැසට් නිවේදනය<br>- යෝගට්, අර්තාපල්, රතු ළූණු, සුදුළූණු, සම්පූර්ණ මද වර්ගයේ ඇට (සම්පූර්ණ හා පියළි කල), කොණ්ඩ කඩල (සම්පූර්ණ හා පියළි කල), රතු පරිප්පු (සම්පූර්ණ හා පියළි කල), කහ පරිප්පු (සම්පූර්ණ හා පියළි කල) බෙදීම), රට ඉඳි (අළුත් හා වියළි), දොඩම් (අළුත්), ලෙමන් (අළුත් හා වියළි), මිදි (අළුත් හා වියළි), ඇපල් (අළුත්), ක්වින්සස්, මිරිස් (වියළි), සූදුරු, මහදුරු, බඩ ඉරිඟු, රට කජු (පොතු හරින ලද), එළවළු තෙල්, මාළු, බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වලංගු කාල සීමාව  මාස හයක කාලයක් සඳහා සංශෝධනය කිරීම හා දීර්ඝ කිරීම. |
| 2020.05.22 | 2020.05.21 දිනැති අංක 2176/20 දරන ගැසට් නිවේදනය<br>- සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.03 යටතේ ආනයනය කරනු ලබන ජැක් සහ හෝස් මැකරල් (Trachurus spp¸ රේගු සංකේතාංක 0303.55 යටතේ වර්ගීකරණය කරන ලද) සඳහා අදාළ වන 10% හෝ කි. ග්‍රෑමයකට රු. 150 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්  කි. ග්‍රෑමයකට රු. 6 ක් අයකර ගෙන ඉතිරි ප්‍රමාණය අත්හරිනු ලැබිය යුතුය. |
| 2020.06.17 | 2020.06.16 දිනැති අංක 2180/10 දරන ගැසට් නිවේදනය<br>- එළවළු මේද හා තෙල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා පැනවීම. |
| 2020.06.17 | 2020.06.16 දිනැති අංක 2180/11 දරන ගැසට් නිවේදනය<br>- තෝරාගත් පළතුරු ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා පැනවීම. |
| 2020.06.27 | 2020.06.26 දිනැති අංක 2181/23 දරන ගැසට් නිවේදනය<br>- තෝරාගත් එළවළු තෙල් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා සංශෝධනය කිරීම හා දීර්ඝ කිරීම. |
| 2020.06.27 | 2020.06.26 දිනැති අංක 2181/24 දරන ගැසට් නිවේදනය<br>- සංයෝජිත වර්ගීකරණ අංක 1516.20 යටතේ වර්ගීකරණය කරන ලද එළවළු මේද හා තෙල් සඳහා අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයකට රු. 440 ක් සහ සංයෝජිත වර්ගීකරණ අංක 1517.90 යටතේ වර්ගීකරණය කරන ලද මාගරින් ආනයනය කිරීම සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයකට රු. 400 ක් මාස හයක කාලයක් සඳහා අත්හරිනු ලැබිය යුතුය. |
| 2020.07.11 | 2020.07.10 දිනැති අංක 2183/44 දරන ගැසට් නිවේදනය<br>- පොල්තෙල් ආනයනය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කි. ග්‍රෑමයකට රු. 25 ක් මාස හයක කාලයක් සඳහා නිදහස් කිරීම. |
| 2020.07.19 | 2020. 07.18 දිනැති අංක 2184/53 දරන ගැසට් නිවේදනය<br>- උම්බලකඩ සහ ආදේශක, ගාන ලද හෝ පිටි කරන ලද චීස්, කොත්තමල්ලි බීජ (කුඩු නොකළ, නොඇඹරූ), කහ (කුඩු නොකළ, නොඇඹරූ), කහ (වෙනත්) සහ උදු පිටි ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වලංගු කාල සීමාව  මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2020.08.01 | 2020.07.31 දිනැති අංක 2186/32 දරන ගැසට් නිවේදනය<br>- හාල්මැස්සන්, කරවල, බොම්බයි ළූණු, මුංඇට, මැංගුස්ටීන් (වියළි හා අළුත්) සහ කිවිෆෘට් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා සංශෝධනය කිරීම. |
| 2020.08.15 | 2020.08.14 දිනැති අංක 2188/50 දරන ගැසට් නිවේදනය<br>- අර්තාපල් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රු. 55 ක් ලෙස මාස හතරක කාලයක් සඳහා වැඩි කිරීම හා දීර්ඝ කිරීම. |
| 2020.08.22 | 2020.08.21 දිනැති අංක 2189/39 දරන ගැසට් නිවේදනය<br>- සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.03 යටතේ ආනයනය කරනු ලබන ජැක් සහ හෝස් මැකරල් (Trachurus spp" රේගු සංකේතාංක 0303.55 යටතේ වර්ගීකරණය කරන ලද) සඳහා අදාළ වන 10% හෝ කිලෝග්‍රෑමයකට රු. 150 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්  කි. ග්‍රෑමයකට රු. 6 ක් අයකර ගෙන ඉතිරි ප්‍රමාණය අත්හරිනු ලැබිය යුතුය. |
| 2020.09.04 | 2020.09.03 දිනැති අංක 2191/26 දරන ගැසට් නිවේදනය<br>- තෝරාගත් භාණ්ඩ ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා සංශෝධනය කිරීම හා දීර්ඝ කිරීම. |
| 2020.10.01 | 2020.09.30 දිනැති අංක 2195/29 දරන ගැසට් නිවේදනය<br>- බටර්, කිරි වලින් නිපදවූ තැවරුම්, උළුහාල්, කුරක්කන් පිටි, අබ සහ ලුණු ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |

සටහන 3 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් - 2020 ජනවාරි සිට සැප්තැම්බර් *(සම්බන්ධිතයි...)*

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | **2018 අංක 35 දරන මුදල් පනත** |
| | **මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද** |
| 2020.02.20 | 2020.02.20 දිනැති අංක 2163/26 දරන ගැසට් නිවේදනය<br>- 2019.10.31 දිනැති අංක 2147/72 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම. |
| 2020.05.26 | 2020.05.26 දිනැති අංක 2177/2 දරන ගැසට් නිවේදනය<br>- 2019.10.31 දිනැති අංක 2147/72 ගැසට් නිවේදනය සංශෝධනය කිරීම. |
| 2020.06.17 | 2020.06.17 දිනැති අංක 2180/21 දරන ගැසට් නිවේදනය<br>- 2020.05.26 දිනැති අංක 2177/2 ගැසට් නිවේදනය සංශෝධනය කිරීම. |
| | **ණය ආපසු ගෙවීමේ අය බද්ද** |
| 2020.01.01 | - ණය ආපසු ගෙවීමේ අය බද්ද ඉවත් කිරීම. |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී*

## 1.3 රජයේ වියදම්

2020 වසරේ පළමු මස අට තුළදී රජයේ වියදම් රු. බිලියන 1,882.7 ක් වූ අතර එයින් රු. බිලියන 1,670.4 ක් පුනරාවර්තන වියදම් සහ රු. බිලියන 231.3 ක් මූලධන හා ශුද්ධ ණය ගැනීම් සඳහා විය.

වගුව **1.12 : රාජ්‍ය වියදම් කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020[(අ)] |
|---|---|---|
| **පුනරාවර්ථන වියදම** | 1,500,534 | 1,670,356 |
| වැටුප් | 446,451 | 516,354 |
| විශ්‍රාම වැටුප් | 143,511 | 160,058 |
| පොලී ගෙවීම් | 599,612 | 653,498 |
| අනෙකුත් | 310,960 | 340,446 |
| **ප්‍රාග්ධන වියදම** | **426,571** | **213,350** |
| **මුළු වියදම** | **1,927,104** | **1,883,706** |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

#### පුද්ගල පඩිනඩි හා විශ්‍රාම වැටුප්

පළාත් සභා සේවකයින් ද ඇතුළුව රජයේ සේවකයින්ගේ පුද්ගල පඩිනඩි සඳහා වන මුළු වියදම 2019 වසරේ සමාන කාලපරිච්ඡේද තුළදී, වූ රු. බිලියන 446.4 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 516.3 දක්වා සියයට 15.7 කින් වැඩි විය. 2019 වසරේ දී සමාන කාලපරිච්ඡේදය තුළදී පැවති පළාත් සභාවල වැටුප් සඳහා මධ්‍යම රජය විසින් ලබාදුන් දායකත්වය වූ රු. බිලියන 115.9 ට සාපේක්ෂව, 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 153.8 දක්වා සියයට 32.6 කින් වැඩි විය. විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දරන ලද වියදම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වූ රු. බිලියන 143.5 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 160.1 ක් දක්වා සියයට 11.5 කින් වැඩි විය.

#### පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් සඳහා 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැවති රු. බිලියන 599.6 සිට 2020 වසරේ පළමු මාස අට දක්වා රු. බිලියන 653.5 කින් එනම් සියයට 9.0 කින් වැඩි විය. රු. බිලියන 653.5 ක් වූ පොලී ගෙවීම් සඳහා වූ මුළු වියදමින් රු. බිලියන 481.7 ක් දේශීය ණය වෙනුවෙන් වන පොලී ගෙවීම සඳහා වෙන් වූ අතර, රු. බිලියන 171.7 ක් විදේශීය ණය සඳහා විය.

**වගුව 1.13 : රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතිකයන්හි හැසිරීම හැසිරීම (%) - 2019 සිට 2020**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය රු. / ඇ.ඩො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 91 දින | 182 දින | 364 දින | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | |
| 2019 | ජන | 10.01 | 9.87 | 10.69 | - | 10.85 | - | 11.58 | 182.1 |
| | පෙබ | 9.55 | 9.87 | 10.67 | - | - | - | - | 178.7 |
| | මාර්තු | 9.39 | 9.67 | 10.40 | - | - | - | 11.04 | 178.4 |
| | අප්‍රේ | 8.89 | 9.09 | 9.81 | - | 10.72 | - | 10.98 | 174.8 |
| | මැයි | 8.52 | 8.63 | 8.88 | - | - | - | - | 176.4 |
| | ජුනි | 8.24 | 8.49 | 8.70 | 9.79 | - | - | 9.83 | 176.6 |
| | ජුලි | 7.85 | 7.94 | 8.21 | - | - | - | - | 176.0 |
| | අගෝ | 7.63 | 7.70 | 8.22 | - | - | - | - | 178.0 |
| | සැප් | 7.62 | 7.75 | 8.41 | - | - | - | 10.27 | 180.8 |
| | ඔක් | 7.49 | 7.65 | 8.35 | - | 9.65 | - | - | 181.5 |
| | නොවැ | 7.45 | 7.67 | 8.29 | - | - | - | - | 180.4 |
| | දෙසැ | 7.51 | 8.02 | 8.45 | - | - | - | 9.87 | 181.3 |
| 2020 | ජන | 7.51 | 8.15 | 8.59 | - | 9.39 | - | 9.27 | 181.4 |
| | පෙබ | 7.42 | 8.06 | 8.58 | - | - | - | - | 181.6 |
| | මාර්තු | 7.00 | 7.25 | 7.50 | - | 9.33 | 9.81 | - | 185.1 |
| | අප්‍රේ | 6.75 | 6.80 | 7.00 | - | 8.14 | 8.70 | 8.75 | 193.1 |
| | මැයි | 6.69 | 6.82 | 6.93 | - | 8.05 | - | - | 187.9 |
| | ජුනි | 5.50 | 5.53 | 5.66 | 5.86 | - | - | 8.59 | 186.0 |
| | ජුලි | 4.59 | 4.68 | 4.86 | 5.73 | - | - | 6.50 | 185.8 |
| | අගෝ | 4.56 | 4.68 | 4.89 | - | - | - | - | 184.9 |
| | සැප් | 4.51 | 4.64 | 4.89 | 5.65 | 5.72 | - | 6.59 | 185.0 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව*

**සුභසාධන වියදම්**

සුභසාධක වැඩසටහන් සඳහා වන වියදම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වූ රු. බිලියන 141 ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා රු. බිලියන 199 ක් විය. 2020 වසරේ පළමු මාස අට තුළ දී "සැමට නොමිලේ ඖෂධ", "ත්‍රිපෝෂ" වැඩසටහන හා "පෝෂණ මල්ල" වැඩසටහන ආවරණය වන සෞඛ්‍ය පිළිබඳ වූ සුභසාධන වියදම රු. මිලියන 44,089 ක් විය. "සැමට නොමිලේ ඖෂධ" වැඩසටහන සඳහා අදාළ කාලපරිච්ඡේදය තුළ දී විශාලතම දායකත්වය ලබාදුන් අතර, ඒ අතරතුර දී අධ්‍යාපනය සඳහා වන වියදම් ද ඉහළ ගියේය.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා රු. මිලියන 105,157 වියදමක් දරා ඇත. කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමට ලක් වූ කුටුම්භ සඳහා මැයි සහ ජූනි මාස තුළ දී ගෙවන ලද රු. 5,000 දීමනාව සඳහා රු. මිලියන 47,700 ක් වැය වූ අතර, "සමෘද්ධි" සහ පොහොර සහනාධාර වැඩසටහන රජයේ ප්‍රධාන ජීවනෝපාය සහය වැඩසටහන් විය. මේ අතර, 2020 වසරේ පළමු මාස අට තුළ දී සමාජ වැඩසටහන හා ආරක්ෂක ජාල වැඩසටහන සඳහා දරන ලද වියදම රු. මිලියන 39,689 ක් විය. ආබාධිත රණවිරුවන් සඳහා ආධාර ලබාදීමේ වැඩසටහන වෙනුවෙන් රු. මිලියන 25,431 ක් දරා ඇති අතර, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එය සියයට 18 ක වැඩිවීමකි.

**වගුව 1.14 : සුභසාධන වියදම්**

රු. මිලියන

| අයිතමය | ජන. - අගෝ. | |
|---|---|---|
| | 2019 | 2020(අ) |
| **සෞඛ්‍ය හා පෝෂණ** | **41,260** | **44,089** |
| සැමට නොමිලේ ඖෂධ | 36,453 | 40,133 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 1,282 | 728 |
| පෙර පාසැල් දරුවන් සඳහා උදෑසන ආහාරය | 174 | 65 |
| පෝෂණ මල්ල | 3,351 | 3,163 |
| **අධ්‍යාපන** | **9,742** | **10,523** |
| නොමිලේ පෙළපොත් | 919 | 1,958 |
| නොමිලේ පාසැල් නිල ඇඳුම් | 2,500 | 2,080 |
| පාසල් පෝෂ්‍යදායි ආහාර වැඩසටහන | 1,399 | 2,900 |
| නොමිලේ වාර ප්‍රවේශ පත්‍ර | 2,436 | 1,541 |
| දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පාසැල් සිසුන්ට පාවහන් | 681 | 491 |
| 5 වසර ශිෂ්‍යත්ව | 123 | 321 |
| මහපොළ ශිෂ්‍යත්ව | 822 | 698 |
| ශිෂ්‍යාධාර | 438 | 427 |
| දහම් පාසල් පෙළපොත් | 122 | 30 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 66 | 3 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා ආධාර | 236 | 74 |
| **ජීවනෝපාය සහායයන්** | **57,964** | **105,157** |
| පොහොර සහනාධාරය | 30,148 | 21,349 |
| සමෘද්ධි සහනාධාරය | 27,036 | 35,087 |
| නැවත වගා කිරීම සඳහා සහනාධාර (තේ/රබර්) | 534 | 740 |
| අපනයන බෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | 246 | 281 |
| කොවිඩ් - 19 නිසා බලපෑමට ලක්වූ පුද්ගලයින්ට ජීවනෝපාය සහායයන් | - | 47,700 |
| **සමාජ සුභසාධන සහ ආරක්ෂණ ජාලය** | **32,554** | **39,689** |
| ආබාධිත පුද්ගලයින් හා වකුගඩු රෝගීන් සඳහා ආධාර | 506 | 1,460 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා ආධාර | 3,331 | 6,575 |
| ආබාධිත රණවිරුන් සඳහා ආධාර | 21,635 | 25,431 |
| රණවිරු මාපිය සමාජ සත්කාර | 1,567 | 1,571 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං සහනාධාර | 228 | 52 |
| ආර්ථික වශයෙන් වාසිදායක නොවන මාර්ගවල බස් සේවා | 5,287 | 4,600 |
| **එකතුව** | **141,520** | **199,458** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

(අ) තාවකාලික

**රාජ්‍ය ආයෝජන**

මහාමාර්ග, ජල සම්පාදන, වාරිමාර්ග, ප්‍රවාහනය, කෘෂිකර්ම, සෞඛ්‍ය හා අධ්‍යාපන අංශවල යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළත් රාජ්‍ය ආයෝජනයන් සඳහා වූ වියදම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පැවති රු. බිලියන 175 ට සාපේක්ෂව, 2020 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 98 ක් විය.

## 1.4 භාණ්ඩාගාර මෙහෙයුම්

**භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය**

2020 වසරේ මුල් මාස අට තුළ දී භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලාඒම් රු. බිලියන 880.4 ක් වූ අතර, එය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 1,281.7 ට සාපේක්ෂව සියයට 31.3 ක අඩුවීමකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගෝලීය වශයෙන් මෙන්ම දේශීයව ද කොවිඩ්-19 වසංගතයෙන් ආර්ථික ක්‍රියාකාරකම් වලට සිදුවූ බලපෑමයි. මේ අතර, 2020 වසරේ පළමු මාස අට තුළ දී පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලායාම් රු. බිලියන 1,948.1 වූ අතර, එය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 1,869.4 ට සාපේක්ෂව සියයට 4.2 වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

2020 අගෝස්තු 31 වන දිනට මුළු මුදල් හිඟය රු. බිලියන 1,067.7 ක් වූ අතර, 2019 වසරේ අගෝස්තු මස අවසානයේ පැවති රු. බිලියන 587.7 ට සාපේක්ෂව එය සියයට 81.7 වැඩිවීමකි. මහා භාණ්ඩාගාරයට මුදල් ගලා ඒම් සියයට 31.3 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුව විය. මෙහි ප්‍රතිඵලය වූයේ 2020 වසරේ අගෝස්තු 31 වන දිනට සමස්ත මුදල් හා බැංකු ශේෂ හිඟය රු. බිලියන 541.5 ක් දක්වා වැඩිවීමයි.

**වගුව 1.15 : රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රු. බිලියන

| අයිතමය | ජන.-අගෝ. තථ්‍ය 2019 | 2020 |
|---|---|---|
| ආරම්භක මුදල් ශේෂය | -274.2 | -274.3 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 1,281.7 | 880.4 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -1,442.9 | -1,626.7 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -426.5 | -321.4 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -587.7 | -1,067.7 |
| දල ණය ගැනීම් * | 1,524.1 | 1,355.7 |
| ණය ආපසු ගෙවීම් | -886.5 | -616.2 |
| ශුද්ධ ණය ගැනීම් | 637.6 | 739.5 |
| පෙර වසරේ ස්වෛරීත්ව බැඳුම්කර ශේෂය | - | 51.4 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ශුද්ධ තැන්පතු යනාදිය) | 5.3 | 9.6 |
| අවසාන මුදල් ශේෂය | -219.0 | -541.5 |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

* *CS DRMS* හි වාර්තා කර ඇති 2020/08/31 දින දක්වා රජයට ලැබුණු වැඩසටහන් හා ව්‍යාපෘති ණය ඇතුලත්වේ.

**රාජ්‍ය ණය කළමනාකරණය**

2020 වසරේ ජනවාරි 01 වන දින සිට අගෝස්තු මස 31 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ රජයේ දල ණය ගැනීම් රු. බිලියන 1,355.7 කි. එම කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහ මෙහෙයුම් කටයුතු සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මුදල් යෙදවීම පිණිස දේශීය හා විදේශීය ණය වලින් සමන්විත මුළු ණය ගැනීම් පිළිවෙළින් රු. බිලියන 1,085.8 ක් සහ රු. බිලියන 269.9 ක් ලෙස මූල්‍යයනය කර ඇත. 2020 වසරේ පළමු මාස අට තුළ දේශීය ණය ගැනීම් වලින් සියයට 74 ක්ම දිගුකාලීන ණය ගැනීම් වලින් සමන්විත විය. භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ විදේශ විනිමය මුදල් බැංකු ඒකක ණය ගැනීම් ප්‍රධාන දේශීය ප්‍රභවයන් විය. ඒ අනුව, 2020 පළමු මාස අට තුළ සමස්ත දේශීය ණය වලින් සියයට 67 ක් භාණ්ඩාගාර බැඳුම්කර මගින් ද, සියයට 21 ක් භාණ්ඩාගාර බිල්පත් මගින්ද, සියයට 7 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ද, තවත් සියයට 5 ක් විදේශ විනිමය මුදල් බැංකු ඒකක මගින් ද ලබාගෙන ඇත.

ඊට අමතරව, 2020 වසරේ පළමු කාර්තුවේදී නිකුත්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් මූල්‍යකරණ පහසුකම් ණය මගින් ලද මුදල විදේශ ණයසේවා ගෙවීම් සඳහා යොදාගන්නා ලදී. 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට ශුද්ධ ණය ගැනීම් රු. බිලියන 739.5 ක් විය.

2020 ජනවාරි සිට අගෝස්තු දක්වා රජය විසින් ලබාගත් දේශීය දළ ණය ගැනීම් වගු අංක 1.16 හා රූප සටහන 1.4 මගින් දක්වා ඇත.


වගුව 1.16 : දළ දේශීය ණය මූලාශ්‍ර අනුව

රු. බිලියන

| මූලාශ්‍ර | ජන. - අගෝ. 2020 |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 721.2 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 227.9 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 77.7 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය (ශුද්ධ) | 57.8 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 1.2 |
| **එකතුව** | **1,085.8** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

රූපසටහන 1.4 : මූලාශ්‍ර අනුව දළ දේශීය ණය 2020 ජනවාරි සිට අගෝස්තු




*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

### භාණ්ඩාගාර ඇපකර මත වගකීම් හෙළිදරව් කිරීම

2020 වසරේ අගෝස්තු මස 31 වන දිනට නිකුත්කළ භාණ්ඩාගාර ඇපකර වටිනාකම රු. බිලියන 1,317 ක් වන අතර, එය 2016 අංක 13 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතේ දෙවන වගන්තිය අනුව අදාළ සීමාව තුළ වේ. 2020 වසරේ අගෝස්තු මස 31 වන දින මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව ඇමුණුම I හි දක්වා ඇත.

ඇමුණුම 1 මගින් 2020.08.31 දක්වා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව

## 1.5 විදේශ මූල්‍යයනය

### විදේශ මූල්‍යයන එකඟතා

රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා අවශ්‍ය විදේශ මූල්‍යයනයන් සම්පාදනය කිරීම වෙනුවෙන් රජය විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග 2020 වසරේ ජනවාරි මස 1 වන දින සිට අගෝස්තු මස 31 වන දින දක්වා විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් එකොළහක් (11ක්) මගින් ඇ.ඩො. මිලියන 742.8 ක එකඟතා ඇතිකරගෙන ඇත. මෙයින් ඇ.ඩො. මිලියන 500.0ක් අයවැය මූල්‍යකරණ සහාය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දුන් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමකින් ද, ඉතිරි ඇ.ඩො. මිලියන 128.6 ක ප්‍රමාණය ලෝක බැංකුව මගින් මූල්‍යයනය වන කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ද වන අතර, විදේශ මූල්‍යයන ප්‍රදාන ලෙස ජපානය (ඇ.ඩො. මිලියන 7.6), ජ(ර්)මනිය (ඇ.ඩො. මිලියන 12.5), ආසියානු සංවර්ධන බැංකුව (ඇ.ඩො. මිලියන 3.0) සහ සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (ඇ.ඩො. මිලියන 7.6) යන සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් එකඟතා පළකර ඇත. 2020 වසරේ පළමු කාර්තුවේ දී එකඟතා අත්සන් කිරීමේ ප්‍රගතිය සඳහා කොවිඩ්-19 ලෝක ව්‍යාප්ති වසංගත තත්ත්වය අහිතකර ලෙස බලපාන ලදී.

වගුව 1.17 : විදේශ මූල්‍යයන එකගතා සහ අදාළ මූල්‍ය කොන්දේසි - 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකගතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | එකගතා ප්‍රමාණය (මිලියන) විනිමය | අත්සන් කරන ලද මුදලයෙන් | රුපියල් | එ.ජ.ඩොලර් | මූල්‍ය කොන්දේසි පොලිය වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් කොන්දේසි වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ද්විපාර්ශ්වික** | | | | | | | | | | | | | |
| චීන සංවර්ධන බැංකුව | ණය | 3/18/2020 | විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම 2020 | එ.ජ. ඩොලර්(ර්) | 500 | 92542.7 | 500 | විචල්‍ය | LIBOR for USD | 2.51 | මූලික ගෙවීම් 1.25% | 3 | 10 |
| ජපානය | ප්‍රදාන | 7/30/2020 | කොවිඩ් 19 වැළැක්වීමේ ක්‍රියාකාරකම් බලගැන්වීම වෙනුවෙන් අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා ජපාන ආධාර | යෙන් | 800 | 1413.9 | 7.6 | | | අදාළ නොවේ | | | 3 |
| | ප්‍රදාන | 8/11/2020 | ශ්‍රී ලංකා පොලිසියේ මත්ද්‍රව්‍ය විරෝධී ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | යෙන් | 200 | 348.8 | 1.9 | | | අදාළ නොවේ | | | 3 |
| ජ(ර්)මනිය | ප්‍රදාන | 6/10/2020 | ජ(ර්)මන් තාක්ෂණික සහයෝගීතාව | යූරෝ | 11 | 2,308.80 | 12.5 | | | අදාළ නොවේ | | | 1 |
| **බහුපාර්ශ්වික** | | | | | | | | | | | | | |
| ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව | ණය | 4/3/2020 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර්(ර්) | 35 | 6,685.00 | 35.0 | විචල්‍ය | LIBOR for USD | 0 | පොරොන්දු ගාස්තු 0.25%, මූලික ගෙවීම් 0.25% | 5 | 30 |

වගුව 1.17 : විදේශ මූල්‍යයන එකඟතා සහ අදාළ මූල්‍ය කොන්දේසි - 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා *(සම්බන්ධිතයි...)*

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද මිලියනයේ | රුපියල් | එ.ජ.ඩොලර් | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | (වර්ෂ) |
| | ණය | 4/3/2020 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය | එ.ජ. ඩොල(ර්) | 93.6 | 17877.6 | 93.6 | විචල්‍ය | LIBOR for USD | 0 | පොරොන්දු ගාස්තු 0.25%, මූලික ගෙවීම් එ.ජ. ඩොලර් 234,000 | 5 | 30 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 7/23/2020 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - අමතර මූල්‍ය සහනදායී ණය | විශේෂ ගැණුම් හිමිකම් | 33 | 8,467.20 | 45.6 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | සේවා ගාස්තු 0.75%, | 5 | 30 |
| | ණය | 7/23/2020 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - අමතර මූල්‍ය සහනදායී නොවන ණය | එ.ජ. ඩොල(ර්) | 41.9 | 7,784.60 | 41.9 | විචල්‍ය | LIBOR for USD | 0 | පොරොන්දු ගාස්තු 0.25%, | 5 | 30 |
| | ප්‍රදාන | 7/23/2020 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - අමතර මූල්‍ය -ප්‍රදාන | එ.ජ. ඩොල(ර්) | 1.7 | 320.2 | 1.7 | | | අදාළ නොවේ | | | 0.5 |
| ආසියානු සංවර්ධන බැංකුව | ප්‍රදාන | 6/8/2020 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර ව්‍යාපෘතිය | එ.ජ. ඩොල(ර්) | 3 | 556.4 | 3 | | | අදාළ නොවේ | | | 0.5 |

**වගුව 1.17 : විදේශ මූල්‍යයන එකඟතා සහ අදාළ මූල්‍ය කොන්දේසි - 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා** *(සම්බන්ධිතයි...)*

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | වෙනත් කොන්දේසි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද ගිවිසුමේ | රුපියල් | එ.ජ.ඩොලර් | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් | ප්‍රදාන | 3/2/2020 | උතුරු පළාතේ දිස්ත්‍රික්ක 5 සහ පුත්තලම්හි විශ්‍රාමිකයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම | රුපියල් | 4.6 | 4.6 | 0.02 | | | අදාළ නොවේ | | | 0.5 |
| **එකතුව** | | | | | | 138,309.70 | 742.8 | | | | | | |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

සටහන :
1. *LIBOR* = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය,

2. එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත

### විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2020 වසරේ ජනවාරි මස 01 වන දින සිට අගෝස්තු 31 වන දින දක්වා ඇ.ඩො. මිලියන 1,352.2 ක විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණයක් ලබා ගෙන ඇති අතර, මෙයින් ඇ.ඩො. මිලියන 1,320.9 ක් ණය ප්‍රතිලබ්ධි වන අතර, ඇ.ඩො. මිලියන 31.3 ක් ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි වී ඇත.

මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය චීනය සමග අත්සන් කරන ලද ණය ගිවිසුම් මගින් ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 50 ක් ද අනතුරුව ඉහළ ප්‍රමාණයක් ලෝක බැංකුව (සියයට 15), ආසියානු සංවර්ධන බැංකුව (සියයට 14), සහ ජපානය (සියයට 9) සමග අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදු වූ ප්‍රතිලබ්ධි වේ.

**වගුව 1.18 : විදේශ ණය හා ප්‍රදාන ප්‍රතිලබ්ධි - 2020 ජනවාරි සිට අගෝස්තු**

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (එ.ජ.ඩොල(ර්) මිලියන)* | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| ද්විපාර්ශ්වික | 914.4 | 9.3 | 923.7 |
| චීනය** | 679.4 | - | 679.4 |
| ජපානය | 115.2 | 9.1 | 124.3 |
| ප්‍රංශය | 47 | 0.2 | 47.2 |
| ඉන්දියාව | 33 | - | 33 |
| එක්සත් රාජධානිය | 11.8 | - | 11.8 |
| නෙද(ර්)ලන්තය | 11.1 | - | 11.1 |
| ඔස්ට්‍රියාව | 4.5 | - | 4.5 |
| කොරියාව | 6.4 | - | 6.4 |
| කුවේටය | 4.2 | - | 4.2 |
| ස්පාඤ්ඤය | 0.9 | - | 0.9 |
| ජ(ර්)මනිය | 0.5 | - | 0.5 |
| ඩෙන්මා(ර්)කය | 0.3 | - | 0.3 |
| බහුපාර්ශ්වීය | 406.5 | 22 | 428.5 |
| ලෝක බැංකුව | 208.6 | 0.2 | 208.8 |
| ආසියානු සංවර්ධන බැංකුව | 181.4 | 11.1 | 192.5 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 7.4 | - | 7.4 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 6.6 | - | 6.6 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 2.4 | - | 2.4 |
| ලෝක ආහාර වැඩසටහන | - | 0.4 | 0.4 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | - | 0.2 | 0.2 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | - | 8.4 | 8.4 |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | - | 1.6 | 1.6 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | - | 0.1 | 0.1 |
| එකතුව | 1,320.90 | 31.3 | 1,352.20 |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*


සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී 2020 අගෝස්තු 31 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත

* තාවකාලික

** චීන සංවර්ධන බැංකුව විසින් ලබා දුන් එ.ජ.ඩොලර් මිලියන 500.0 ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම අඩංගු වේ


අයවැය මූල්‍යකරණය සඳහා ලබාගත් ඇ.ඩො. මිලියන 500 ක ප්‍රමාණයට අමතරව, මෙම වසරේ සිදුවූ ප්‍රතිලබ්ධි වලින් ඉහළ ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ (සියයට 17) ව්‍යාපෘති වල උපයෝජනය පිණිස යොදවා ඇති අතර, අනතුරුව

**රූපසටහන 1.5 : අංශ අනුව ප්‍රතිලබ්ධින් - 2020 ජනවාරි සිට අගෝස්තු (එ.ජ. ඩොලර් මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

**රූපසටහන 1.6 : ණය ප්‍රදානකරුවන් අනුව සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල එකඟ වූ උපයෝජනය නොවූ ශේෂයන් - 2020 අගෝස්තු (එ.ජ. ඩොලර් මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*


## එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට එකඟතා පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වසර 3-5 ත් අතර කාලපරිච්ඡේදය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන වල ශේෂය 2020 වසරේ අගෝස්තු මස 31 දින වන විට ඇ.ඩො. මිලියන 8,737 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයක් පිළිවෙළින් ආසියානු සංවර්ධන බැංකුව, ජපානය සහ ලෝක බැංකුව විසින් ලබා දීමට නියමිත වේ.

මෙයින් සියයට 25 ක් මාර්ග හා පාලම් අංශයේ ද ජල සම්පාදන හා සනීපාරක්ෂාව අංශයේ සියයට 18 ක් හා සියයට 18 ක් ප්‍රවාහන අංශයේ එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

ඉහළ ප්‍රමාණයක් ප්‍රවාහනය (සියයට 11), ජල සම්පාදනය හා සනීපාරක්ෂාව (සියයට 9), සහ ආපදා කළමණාකරණය (සියයට 4) යන අංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල උපයෝජනය පිණිස යොදවා ඇත.

**රූපසටහන 1.7 : අංශ අනුව සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල එකඟ වූ උපයෝජනය නොවූ ශේෂය - 2020 අගෝස්තු (එ.ජ. ඩොලර් මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

## විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2020 වසරේ අගෝස්තු මස 31 දින වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 35.3[1] කි. තවද, 2020 ජනවාරි මස 1 වන දින සිට අගෝස්තු මස 31 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 2,292.7 කි. මෙයින් ඇ.ඩො. මිලියන 1,348.6 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 994.1 ක් පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

---

1 භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්හි අනේවාසික අයෝජන හා රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.

2 මුළු ණය සේවාකරණය = පොලී ගෙවීම් + ණය වාරික ආපසු ගෙවීම්, රාජ්‍ය ව්‍යාපාරයන්හි ණය සේවාකරණය අඩංගු නොවේ.

# ආර්ථික උපනතීන් 02

## 2.1 සමාලෝචනය

2020 වසරේ පළමු කාර්තුව තුළ දී ආර්ථිකය සියයට 1.6 කින් සංකෝචනය වූ අතර, ඒ සඳහා (i) පසුගිය වසර පහ තුළ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමේ දැඩි බලපෑම; (ii) කොවිඩ්-19 වසංගතය; (iii) 'අගුළුලා දැමීම' හා 'සමාජ දුරස්ථභාවය' වැනි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රියාමාර්ග; (iv) අයහපත් කාලගුණික තත්ත්වයන්; සහ (v) ගෝලීය අගයදාම අවහිර කරමින් භාණ්ඩ, සේවා හා ප්‍රාග්ධන ප්‍රවාහයන් කෙරෙහි බලපෑම් එල්ල කරමින් කොවිඩ්-19 වසංගතය දේශසීමා හරහා ව්‍යාප්ත වීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම් පිරිහීම හේතුවෙන් ඇති වූ දේශීය මෙන්ම විදේශීය වශයෙන් බලපෑ හේතු ඉවහල් විය. කෙසේ වුවද, සාර්ව ආර්ථික දර්ශක වලට අනුව, 2020 වසරේ ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදය තුළ දී ආර්තිකය 'v-හැඩැති'ම යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කරන ලදී.

ව්‍යාපාර වෙත පහසුකම් සැලසීම සහ සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වෙත සහන සැලසීම සඳහා රජය විසින් රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති උත්තේජන ඇතුළත් සහන ක්‍රියාමාර්ග මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. පීඩාවට පත් ජනතාවට ලබා දී ඇති අනෙකුත් සහන ක්‍රියාමාර්ග වලට අමතරව, කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා 2019 වසර අග භාගයේ දී ආරම්භ කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ද රාජ්‍ය උත්තේජන පැකේජයක් ලෙස සැලකිය හැකි වේ. ආර්ථික කටයුතු වේගවත් කිරීම සඳහා ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ණය පමා සහන කාලසීමා සහ සහනදායී ණය යෝජනා ක්‍රම සමගින් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය පහත හෙලීම වැනි මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළුව මුදල් උත්තේජන පැකේජයක් ක්‍රියාත්මක කරන ලදී.


2020 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාස තුළ දී පෞද්ගලික අංශය වෙත ප්‍රදානිත ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් එය, 2020 වසරේ පළමු මාස නවය තුළ දී පුළුල් මුදල් සැපයුම වර්ධනයට ඉවහල් වී ඇත. විනිමය අනුපාතිකය ස්ථාවර වීමත් සමඟම සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම සහ වෙළඳ හිඟය පටු වීම පිළිබිඹු කරමින් විදේශ අංශයද යථා තත්ත්වයට පත් විය. ගෝලීය බනිජතෙල් මිල පහත වැටීමෙන් වූ හිතකර ප්‍රතිලාභයන්ට අතිරේකව අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීමට රජය විසින් ගන්නා ලද පූර්ව ක්‍රියාමාර්ග මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2020 වසරේ අගෝස්තු මස අවසානයේ දී දළ නිල සංචිත ඇ.ඩො. මිලියන 7,430 ක් ලෙස වාර්තා වූ අතර, ගෙවුම් ශේෂය මධ්‍යස්ථව පැවතුණි. නියමිත පරිදි හිඟ මුදල් ගෙවීමේ නොකලැල් වාර්තාව තහවුරු කරමින්, 2020 වසරේ ඔක්තෝබර් මස පළමු සතියේ දී රජය විසින් ඇ.ඩො. බිලියන 1 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව පියවා දමන ලදී. සැපයුම් අංශයේ කම්පන හේතුවෙන් ඇතැම් මාස වල ආහාර මිල ඉහළ ගිය ද, උද්ධමනය සියයට 4-6 ත් අතර පරාසයක් තුළ පැවතුණි. විධිමත් සෞඛ්‍ය ක්‍රියාමාර්ග ද සමගින් කොවිඩ්-19 වසංගතය මනාව මැඩ පවත්වන අතරතුර දී, දේශීය නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා ගන්නා ලද ප්‍රතිපත්ති හේතුවෙන් 2021 වසරින් ඔබ්බට ආර්ථිකය යළි පුනර්ජීවනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2.2 ආර්ථික වර්ධනය

සේවා අංශයේ වර්ධනයක් පෙන්නුම් කළ ද, කෘෂිකාර්මික සහ කර්මාන්ත අංශයේ පහත වැටීම පිළිබිඹු කරමින්, ආර්ථිකය 2019 වසරේ සමාන කාර්තුවේ දී වාර්තා වූ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2020 පළමු කාර්තුව තුළ සියයට 1.6 ක සමකෝචනය වීමත් පෙන්නුම් කරන ලදී.


ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතු සහ නිෂ්පාදන කටයුතු මන්දගාමී වීම හේතුවෙන් කර්මාන්ත අංශය 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 3.7 ක වර්ධනයේ සිට 2020 වසරේ පළමු කාර්තුවේ දී වර්ධනය සියයට 7.8 දක්වා සංගෝචනය විය. තේ හා පොල් වගාවේ මෙන්ම ධීවර කර්මාන්තයේ මන්දගාමී වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික අංශය ද 2019 වසරේ සමාන කාර්තුවේ දී පැවති සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ දී සියයට 5.6 කින් සංකෝචනය විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා, දේපල වෙළඳාම් කටයුතු සහ අනෙකුත් පුද්ගල සේවාවන්හි වූ වර්ධනය හේතුවෙන් සේවා අංශය 2019 වසරේ සමාන කාර්තුවේ දී වූ සියයට 3.7 ක වර්ධනයේ සිට 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.1 කින් පුළුල් විය. 2020 වසරේ පළමු කාර්තුව තුළ දී බදු සහ සහනාධාර අතර වෙනස සියයට 10.8 කින් අඩු විය.

රූපසටහන 2.1 : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

රූප සටහන 2.2 : දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය 2020 පළමු කාර්තුව




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව 2.1 : ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය**

රු. මිලියන

| | අංශය | 2017 | 2018 | 2019[අ] | පළමු කාර්තුව | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2019[අ] | 2020[ආ] | 2019 | 2020 |
| | **කෘෂිකර්මාන්තය,වන වගාව හා ධීවර කර්මාන්තය** | **642,159** | **683,816** | **687,857** | **162,787** | **153,735** | **-3.5** | **-5.6** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 11,503 | 11,736 | 10,615 | 3,426 | 3,867 | -19.8 | 12.9 |
| 2 | වී වගාව | 48,648 | 70,380 | 70,169 | 11,316 | 11,783 | 28.2 | 4.1 |
| 3 | එළවළු වගාව | 55,240 | 57,439 | 58,298 | 9,801 | 10,288 | - 4.4 | 5.0 |
| 4 | උක් වගාව,දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 2,044 | 1,820 | 1,973 | 443 | 490 | 3.1 | 10.6 |
| 5 | පළතුරු වගාව | 49,961 | 55,654 | 60,399 | 14,788 | 15,883 | 11.4 | 7.4 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්,තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 53,773 | 57,577 | 68,062 | 17,106 | 14,909 | 34.2 | - 12.8 |
| 7 | තේ වගාව | 66,879 | 67,141 | 66,300 | 16,223 | 11,766 | -1.2 | -27.5 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි,කොකෝවා ආදී.) | 1,268 | 1,592 | 1,219 | 334 | 306 | - 16.2 | -8.3 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 63,200 | 66,914 | 66,223 | 17,571 | 17,834 | 2.4 | 1.5 |
| 10 | රබර් වගාව | 24,165 | 24,085 | 21,807 | 6,265 | 5,721 | 3.3 | - 8.7 |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 16,717 | 16,303 | 16,255 | 4,044 | 3,870 | -1.0 | - 4.3 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 58,729 | 63,418 | 65,440 | 15,572 | 15,629 | 8.3 | 0.4 |
| 13 | පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 9,238 | 9,258 | 8,675 | 2,124 | 2,110 | -4.7 | - 0.6 |
| 14 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 62,545 | 62,020 | 59,036 | 13,745 | 11,914 | -5.5 | -13.3 |
| 15 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 103,043 | 102,175 | 96,589 | 26,163 | 24,056 | -2.0 | - 8.1 |
| 16 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 15,208 | 16,304 | 16,797 | 3,866 | 3,308 | 17.6 | -14.4 |
| | **කර්මාන්ත** | **2,509,421** | **2,540,315** | **2,608,211** | **736,946** | **679,127** | **3.9** | **-7.8** |
| 17 | පතල් හා කැණීම් කර්මාන්තය | 237,827 | 225,505 | 231,893 | 62,727 | 51,232 | 6.2 | - 18.3 |
| 18 | ආහාර,බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 534,924 | 556,140 | 574,888 | 169,694 | 174,434 | 2.1 | 2.8 |
| 19 | රෙදිපිළි,නිමි ඇඳුම්,සම් සහ සම් භාණ්ඩ හා බුමුතුරුණු නිෂ්පාදනය | 304,090 | 314,442 | 326,803 | 114,329 | 98,723 | 3.9 | -13.6 |
| 20 | ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 32,909 | 33,845 | 31,178 | 10,472 | 10,850 | -17.0 | 3.6 |
| 21 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 31,885 | 32,226 | 30,803 | 11,484 | 10,599 | -5.8 | - 7.7 |
| 22 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 29,743 | 27,312 | 33,694 | 14,001 | 11,313 | 94.8 | - 19.2 |
| 23 | රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 93,552 | 96,761 | 100,511 | 23,740 | 21,339 | 1.8 | -10.1 |
| 24 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 86,202 | 88,147 | 83,009 | 11,821 | 10,447 | 1.6 | -11.6 |
| 25 | ලෝහමය නොවන වෙනත් ඛණිජ නිෂ්පාදන | 77,821 | 85,031 | 85,341 | 21,592 | 21,471 | -4.1 | -0.6 |
| 26 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 43,862 | 48,111 | 46,328 | 14,824 | 16,041 | -4.2 | 8.2 |
| 27 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 50,967 | 52,075 | 52,578 | 14,578 | 14,072 | -2.5 | - 3.5 |

වගුව 2.1 : ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය *(සම්බන්ධිතයි)* රු. මිලියන

| | අංශය | 2017 | 2018 | 2019(ඇ) | පළමු කාර්තුව 2019(ඇ) | පළමු කාර්තුව 2020(ආ) | වර්ධනය (%) 2019 | වර්ධනය (%) 2020 |
|---|---|---|---|---|---|---|---|---|
| 28 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 97,920 | 100,302 | 100,797 | 32,824 | 30,633 | 5.9 | -6.7 |
| 29 | වෙනත් නිෂ්පාදන කර්මාන්ත,යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවි කිරීම | 76,943 | 78,408 | 75,040 | 20,194 | 20,696 | -3.8 | 2.5 |
| 30 | විදුලිය,ගෑස්,වායු හා වායු සමීකරණ සැපයීම | 94,803 | 100,382 | 104,437 | 25,609 | 26,191 | 1.9 | 2.3 |
| 31 | ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 13,562 | 14,351 | 15,139 | 3,711 | 3,895 | 6.3 | 5.0 |
| 32 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 28,316 | 30,207 | 32,403 | 8,076 | 8,224 | 7.0 | 1.8 |
| 33 | ඉදිකිරීම් කර්මාන්තය | 674,097 | 657,070 | 683,371 | 177,270 | 148,966 | 6.9 | - 16.0 |
| | **සේවාවන්** | **5,313,435** | **5,555,303** | **5,680,757** | **1,326,977** | **1,367,507** | **3.7** | **3.1** |
| 34 | තොග හා සිල්ලර වෙළඳාම | 993,667 | 1,040,360 | 1,071,847 | 270,577 | 281,581 | 4.6 | 4.1 |
| 35 | මඟීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,013,857 | 1,034,755 | 1,049,566 | 233,219 | 232,917 | 2.7 | -0.1 |
| 36 | තැපැල් හා කුරියර් සේවාවන් | 4,425 | 4,485 | 4,752 | 1,184 | 1,276 | 5.7 | 7.7 |
| 37 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 146,432 | 154,794 | 147,671 | 40,448 | 37,945 | 4.6 | -6.2 |
| 38 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 2,804 | 2,519 | 2,639 | 622 | 651 | 8.8 | 4.5 |
| 39 | විදුලි සංදේශ සේවාවන් | 41,503 | 45,830 | 53,695 | 12,381 | 14,264 | 17.5 | 15.2 |
| 40 | තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 13,564 | 15,072 | 17,044 | 3,893 | 4,265 | 11.7 | 9.6 |
| 41 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 606,512 | 687,918 | 701,880 | 140,166 | 152,822 | 4.4 | 9.0 |
| 42 | රක්ෂණය,ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 95,925 | 112,493 | 118,987 | 20,019 | 20,060 | 7.4 | 0.2 |
| 43 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 544,733 | 566,078 | 579,601 | 145,023 | 151,068 | 2.2 | 4.2 |
| 44 | වෘත්තිමය සේවාවන් | 158,755 | 165,550 | 169,523 | 41,896 | 42,582 | 4.9 | 1.6 |
| 45 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව | 430,672 | 428,022 | 437,065 | 97,733 | 98,631 | 2.0 | 0.9 |
| 46 | අධ්‍යාපනය | 172,701 | 179,524 | 185,116 | 46,439 | 47,540 | 4.3 | 2.4 |
| 47 | සෞඛ්‍ය,නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 174,155 | 179,356 | 182,777 | 32,616 | 32,999 | -1.6 | 1.2 |
| 48 | වෙනත් පෞද්ගලික සේවාවන් | 913,729 | 938,547 | 958,592 | 240,760 | 248,905 | 3.8 | 3.4 |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **8,465,015** | **8,779,434** | **8,976,825** | **2,226,711** | **2,200,369** | **3.8** | **-1.2** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අය කරන බදු (-) සහනාධාර** | **894,132** | **889,166** | **912,553** | **103,342** | **92,221** | **1.3** | **-10.8** |
| | **දළ දේශීය නිෂ්පාදිතය(GDP), වෙළෙඳපොළ මිල** | **9,359,147** | **9,668,600** | **9,889,379** | **2,330,053** | **2,292,590** | **3.7** | **-1.6** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

(ඇ) සංශෝධිත

(ආ) තාවකාලික


## කෘෂිකර්මය

කෘෂිකාර්මික අංශය 2019 වසරේ පළමු කාර්තුවේ දී වූ සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.6 කින් පහත වැටී ඇති අතර, තේ, පොල්, මිරිදිය මත්ස්‍යය කර්මාන්තය, වන වගාව සහ දැව නිෂ්පාදනය පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2020 වසරේ පළමු කාර්තුව තුළ දී ධාන්‍ය වර්ග, උක්, දුම්කොළ හා අනෙකුත් බහු වාර්ෂික නොවන බෝග, පළතුරු හා එළවළු, කුළුබඩු සහ සත්ත්ව නිෂ්පාදන යන උප අංශවල ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

### වී

2019/20 මහ කන්නයේ දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.2 ක් දක්වා සියයට 4.0 කින් ඉහළ ගොස් ඇති අතර, 2020 වසරේ යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.8 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව වී නිෂ්පාදනය 2019 වසරේ පැවති මෙට්‍රික් ටොන් මිලියන 4.6 ට සාපේක්ෂව 2020 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 5.0 දක්වා ඉහළ යනු ඇත. වී වගා කරන ප්‍රදේශවල පවතින හිතකර කාලගුණික තත්ත්වයන් සහ යල කන්නයේ දී ගොවීන් වෙත නොමිලේ පොහොර ලබාදීම මෙම වර්ධනයට හේතු වී ඇත. වී නිෂ්පාදනයේ ඉහළයාමත් සමග 2020 වසරේ පළමු මාස අට තුළ සහල් ආනයනය මෙට්‍රික් ටොන් 10,726 දක්වා සියයට 26.1 කින් පහත වැටුණි. රජය විසින් ගොවීන් සහ පාරිභෝගිකයින් යන දෙපාර්ශවයම ආරක්ෂා කිරීම සඳහා වී සඳහා සහතික කළ මිලක් සහ සහල් සඳහා උපරිම සිල්ලර මිලක් ද නියම කරන ලදී.

**රූපසටහන 2.3 : කෘෂිකාර්මික අංශයේ සංයුතිය 2020 පළමු කාර්තුව**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### තේ, රබර් සහ පොල් නිෂ්පාදනය

2020 වසරේ පළමු මාස අට තුළ දී තේ, රබර් සහ පොල් නිෂ්පාදනය පහත වැටුණි. අහිතකර කාලගුණික තත්ත්වයන් සහ කොවිඩ්-19 න් ඇතිකරන ලද බලපෑම හේතුවෙන්, 2020 වසරේ පළමු මාස අට තුළ දී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 177.3 ක් දක්වා සියයට 16.0 කින් අඩු විය. සැපයුම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස, කොළඹ තේ වෙන්දේසියේ දී (CTA) තේ මිල ගණන් කිලෝග්‍රෑමයකට රු. 630.80 දක්වා සියයට 15.5 කින් ඉහළ ගියේය. ඒ හා සමානව, අහිතකර කාලගුණික තත්ත්වයන් හමුවේ රබර් කිරි කැපුම් දින ගණන අඩුවීමත් සමග කොවිඩ්-19 වසංගත කාලය තුළ සංචරණ සීමා පැනවීම හේතුවෙන් 2020 පළමු මාස අට තුළ දී රබර් නිෂ්පාදනය ද කිලෝග්‍රෑම් මිලියන 50.2 දක්වා සියයට 5.9 කින් පහත වැටුණි. 2020 වසරේ පළමු කාර්තුවේ දී, කොළඹ රබර් වෙන්දේසියේදී, දුම් ගැසූ දාර සහිත ෂීට් රබර් මිල කිලෝග්‍රෑමයකට රු. 309.24 දක්වා සියයට 20.8 කින් ඉහළ ගොස් ඇති අතර, සාමාන්‍ය ක්‍රේප් රබර් (IX) මිල ද කිලෝග්‍රෑමයකට රු. 330.61 දක්වා සියයට 20.6 කින් වැඩි විය.

පොල් නිෂ්පාදනයද, 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ ගෙඩි මිලියන 2,104 සිට 2020 වසරේ පළමු මාස අට තුළ දී ගෙඩි මිලියන 1,867 ක් දක්වා සියයට 11.3 කින් අඩුවී ඇති අතර, 2020 වසරේ පැවති වියළි කාලගුණික තත්ත්වයන් මේ සඳහා බලපා ඇත. එමෙන්ම, දිසිඳි පොල් සහ පොල්තෙල් නිෂ්පාදනය ද අඩු විය. ඒ අනුව, පොල්තෙල්, නොඉඳුල් පොල්තෙල් සහ පාම් තෙල් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කිරීමේ ප්‍රතිලාභ ලබා ගනිමින්, 2020 පළමු මාස අට තුළ දී පොල්තෙල් ආනයනය මෙට්‍රික් ටොන් 30,575 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, පොල් ක්‍රීම් සහ පිටි කළ පොල් කිරි නිෂ්පාදනය 2020 වසරේ පළමු මාස අට තුළ දී සියයට 26.2 කින් වැඩි විය.

### ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, කුළුබඩු සහ ඖෂධ බෝග වගා කිරීම

දේශීය නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා ධාන්‍ය ආනයනය මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දැමීමෙන් වූ ආකර්ෂණීය මිල ගණන්වල ප්‍රතිලාභ ලබමින්, 2019 වසරේ අදාල කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 12.9 ක සංකෝචනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ දී අගය එකතු කළ ධාන්‍ය නිෂ්පාදනය කෘෂිකාර්මික අංශයේ සමස්ත වර්ධනයට ධනාත්මකව බලපාන ලදී. 2019/20 මහ කන්නයේ එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 893,930 දක්වා සියයට 7.0 කින් වැඩි වී ඇති අතර, හිතකර මිල ගණන් සහ කාලගුණික තත්ත්වයන් මේ සඳහා බලපා ඇත. 2020 වසරේ පළමු කාර්තුව තුළ දී අගය එකතු කළ, පළතුරු හා එළවළු නිෂ්පාදනය පිළිවෙළින් සියයට 7.4 කින් හා සියයට 5.0 කින්

ඉහළ ගියේය. අගය එකතු කළ කුළුබඩු, සුවඳ දෙන භෝග ඖෂධ සහ ඖෂධ නිෂ්පාදන ද 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.5 කින් වර්ධනය විය.


### ධීවර හා පශු සම්පත්

ධීවර උප අංශය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. මිරිදිය ධීවර නිෂ්පාදන හා ජලජීවී වගා උප අංශය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 17.4 ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 14.4 කින් අඩු විය. මේ අතර, කරදිය ධීවර නිෂ්පාදන හා ජල ජීවී වගා උප අංශය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 2.0 ක හැකිලීමට සාපේක්ෂව සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී සියයට 8.1 කින් අඩු විය. අයහපත් කාලගුණික තත්ත්වයන් සහ ධීවර කර්මාන්තය සඳහා පනවා ඇති යම් සීමාවන්හි ඒකාබද්ධ බලපෑම් හේතුවෙන් 2020 වසරේ පළමු මාස අට තුළ දී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 5.6 කින් ඉහළ ගියද, කරදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 222,270 දක්වා සියයට 20.2 කින් පහළයාම හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 283,485 දක්වා සියයට 15.7 කින් පහත වැටුණි. පශු සම්පත් අංශයට කොවිඩ්-19 වසංගතයෙන් වූ අහිතකර බලපෑම පිළිබිඹු කරමින්, සත්ත්ව නිෂ්පාදන උප අංශය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ සියයට 9.4 ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 0.4 අතර මධ්‍යස්ථව පැවතුණි. කිරි නිෂ්පාදනය ද 2020 වසරේ පළමු මාස හය තුළ ලීටර් මිලියන 240.7 දක්වා සියයට 8.2 කින් ඉහළ ගියේය.

### කර්මාන්ත හා නිෂ්පාදන අංශය

කර්මාන්ත අංශය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.8 කින් හැකිලී ගියේය. මේ සඳහා විශේෂයෙන්ම ඉදිකිරීම් (සියයට 16.0), නිෂ්පාදන කටයුතු (සියයට 4.1), පතල් හා කැණීම් (සියයට 18.3) සහ රෙදිපිළි හා ඇඟලුම් (සියයට 13.6) යන අංශවල සිදුවූ කැපී පෙනෙන පහත වැටීම හේතු විය. කෙසේ වුවද, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ (සියයට 2.3), ජල රැස්කිරීම, පිරිපහදු කිරීම සහ බෙදාහැරීම (සියයට 5.0), සහ මලාපවහන, අපද්‍රව්‍ය පිරිපහදු හා බැහැර කිරීමේ ක්‍රියාකාරකම් (සියයට 1.8) එම අංශයට පුළුල් දායකත්වයක් ලබාදෙමින් ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන (සියයට 13.6), කෝක් හා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන (සියයට 19.2), රසායනික නිෂ්පාදන හා මූලික ඖෂධ නිෂ්පාදන (සියයට 10.1), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (සියයට 6.7), සහ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන නිෂ්පාදනය (සියයට 11.6) ඇතුළු නිෂ්පාදන අංශය පහත වැටුණි. එනමුත්, ආහාරපාන සහ දුම්කොළ

**රූපසටහන 2.4 : කර්මාන්ත අංශයේ සංයුතිය 2020 පළමු කාර්තුව**





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

නිෂ්පාදන (සියයට 2.8), සහ මූලික ලෝහ හා පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන (සියයට 8.2) වැනි නිෂ්පාදන අංශවල ධනාත්මක වර්ධනයක් වාර්තා විය.

2020 වසරේ පළමු කාර්තුව තුළ දී විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයුම සහ ජලය එකතු කිරීම හා පිරිපහදු කිරීම සහ මලාපවහන සහ අපද්‍රව්‍ය පිළිවෙළින් සියයට 2.3, සියයට 5.0 සහ 1.8 කින් වර්ධනය වී ඇත. සමස්ත විදුලි උත්පාදනය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී උත්පාදනය වූ ගිගාවොට් පැය 1,373 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ ගිගාවොට් පැය 1,353 දක්වා සියයට 1.4 කින් පහළ ගොස් ඇත. 2020 වසරේ පළමු මාස අට තුළ විදුලිය අලෙවියෙන් ලද මුළු ආදායම රු. මිලියන 158.5 දක්වා සියයට 3.1 කින් අඩු විය. ජල: තාප (ඉන්ධන): තාප (ගල් අඟුරු): NCRE සුළං මිශ්‍ර උත්පාදන අනුපාතය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති 17:37:38:9 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී 22: 28:41:9 දක්වා වෙනස් විය.

**රූපසටහන 2.5 : නිෂ්පාදන අංශයේ සංයුතිය - 2020 පළමු කාර්තුව**





*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**සේවා අංශය**

සේවා අංශය 2019 වසරේ පළමු කාලපරිච්ඡේදය තුළ දී අත්කරගත් සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේ දී සියයට 3.1 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා (සියයට 9.0), තොග හා සිල්ලර වෙළඳාම (සියයට 4.1), වෙනත් පුද්ගලික සේවා (සියයට 3.4) සහ දේපල වෙළඳාම් ක්‍රියාකාරකම් (සියයට 4.2), විදුලි සංදේශ (සියයට 15.2), අධ්‍යාපනය (සියයට 2.4), රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක (සියයට 0.9), වෘත්තීය සේවා (සියයට 1.6), තොරතුරු තාක්ෂණ වැඩසටහන් සහ උපදේශන (සියයට 9.6), මානව සෞඛ්‍ය (සියයට 1.2), තැපැල් සහ කුරියර් සේවා (සියයට 7.7), වැඩසටහන් හා විකාශන සේවා (සියයට 4.5) සහ රක්ෂණ කටයුතු (සියයට 0.2) අංශවල පුළුල්වීම හේතු වී ඇත. කෙසේ වුවද, 2020 වසරේ පළමු කාර්තුවේ දී නවාතැන්, ආහාරපාන සේවා (සියයට 6.2) සහ ප්‍රවාහන කටයුතු (සියයට 0.1) සංකෝචනය විය.

**රූප සටහන 2.6 : සේවා අංශයේ සංයුතිය - 2020 පළමු කාර්තුව**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**තොග හා සිල්ලර වෙළඳාම, භාණ්ඩ ප්‍රවාහනය, ගබඩා හා මගී සේවා**

තොග හා සිල්ලර වෙළඳ කටයුතු 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 4.1 කින් වර්ධනය විය. ප්‍රවාහන අංශය 2019 වසරේ සමාන කාර්තුවට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 0.1 කින් සංකෝචනය විය. ලියාපදිංචි වූ නව වාහන සංඛ්‍යාව 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ 286,126 සිට 2020 වසරේ පළමු මාස නවය තුළ දී 190,442 දක්වා අඩු විය. විනිමය අනුපාතය ස්ථාවරව පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සඳහා රජය විසින් සීමා පැනවීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2020 පළමු මාස නවය තුළ දී මෝටර් කාර් ලියාපදිංචි කිරීම සියයට 29.8 කින් පහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී බස් රථ, ලොරි, ගොඩබිම් වාහන සහ ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීම පිළිවෙළින් සියයට 55.9 කින්, 25.0 කින් සියයට 8.5 කින් සියයට 42.0 කින් අඩු විය. 2020 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 5.1 ක් දක්වා සියයට 4.7 කින් අඩු විය. ප්‍රතිනැව්ගත කිරීම සහ නැවත ඇසිරීම සඳහා මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව පිළිවෙළින් 2020 වසරේ පළමු මාස නවය තුළ දී අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 4.8 සහ 0.1 දක්වා සියයට 2.1 කින් හා සියයට 9.2 කින් අඩු විය. සමස්ත භාණ්ඩ මෙහෙයවීම් 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 80.5 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස නවය තුළ මෙට්‍රික් ටොන් මිලියන 76.6 එනම් සියයට 4.8 කින් අඩු විය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගෝලීය සැපයුම් දාමයන් අඩාල වීම මෙම මධ්‍යස්ථ වර්ධනයට හේතු විය.

**නවාතැන් සැපයීම හා ආහාරපාන සේවා**

නවාතැන් හා ආහාර පාන සේවා උප අංශයේ එකතු කළ අගය 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේදී සියයට 6.2 කින් සංකෝචනය විය. 2020 වසරේ මාර්තු මස මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ සංචාරකයන්ගේ පැමිණීමේ තහනම සහ රට අගුළුලා දැමීම හේතුවෙන් 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැමිණි 244,328 ක් වූ සංචාරකයන් සංඛ්‍යාවට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළදී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 71,370 ක් දක්වා සියයට 70.8 කින් අඩු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ පළමු මාස අට තුළ දී සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 956.2 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

**2.2 වගුව : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්**

| දර්ශකය | 2016 | 2017 | 2018 | 2019 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| වරාය සේවා | | | | | ජන.- සැප්. | ජන.- සැප් |
| පැමිණි නැව් සංඛ්‍යාව | 5,023 | 4,879 | 4,874 | 4,707 | 3,513 | 3,320 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. '000) | 86,546 | 93,857 | 104,934 | 106,979 | 80,579 | 76,675 |
| මෙහෙයවන ලද මුළු බහළුම් (TEU '000) | 5,735 | 6,209 | 7,047 | 7,228 | 5,428 | 5,190 |
| ප්‍රතිනැව්ගත කිරීම් (TEU ‘000) * | 4,435 | 4,826 | 5,704 | 5,955 | 4,484 | 4,384 |

**2.2 වගුව : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්** *(සම්බන්ධිතයි...)*

| දර්ශකය | 2016 | 2017 | 2018 | 2019 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| **විදුලි සංදේශ අංශය** | | | | | ජන.- සැප්. | ජන.- සැප්. |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000) ** | 1,166 | 1,198 | 1,216 | 2,300 | 2,324 | 2,328 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව '000) | 26,228 | 28,199 | 32,528 | 32,884 | 33,463 | 27,679 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000) | 1,384 | 1,405 | 1,269 | 1,055 | 1,084 | 1,074 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව '000) | 4,921 | 5,904 | 10,563 | 13,408 | 12,536 | 13,295 |
| **සෞඛ්‍ය අංශය** | | | | | ජන.- සැප්. | ජන.- සැප්. |
| පෞද්ගලික රෝහල් | 225 | 181 | 191 | 207 | 207 | 209 |
| රජයේ රෝහල් | 610 | 612 | 612 | 603 | 603 | 605 |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 76,829 | 76,569 | 76,824 | 77,964 | 77,964 | 78,526 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 20,458 | 20,349 | 19,692 | 18,130 | 18,130 | 20,544 |
| හෙදියන් සංඛ්‍යාව (රජයේ) | 32,499 | 34,221 | 34,714 | 38,276 | 38,276 | 38,569 |
| **මූල්‍ය අංශය** | | | | | ජන. -අගෝ. | ජන. - අගෝ. |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථාන | 6,107 | 6,213 | 6,882 | 7,387 | 7,133 | 7,397 |
| | | | | | ජන.- මාර්. | ජන.- මාර්. |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 1,315,915 | 1,486,545 | 1,710,671 | 1,854,103 | 1,730,521 | 1,892,205 |
| | | | | | ජන.- ජුනි. | ජන.- ජුනි. |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් | 46 | 45 | 43 | 42 | 42 | 39 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 7 | 6 | 5 | 4 | 4 | 3 |
| **සංචාරක අංශය** | | | | | ජන.- සැප්. | ජන.- සැප්. |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 2,050,832 | 2,116,407 | 2,333,796 | 1,913,702 | 1,376,312 | 507,311 |
| සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | 3,518 | 3,925 | 4,381 | 3,607 | 2,594 | 956 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 74.8 | 73.3 | 72.8 | ලැ.නො | ලැ.නො | ලැ.නො |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම්)** | | | | | ජන.- සැප්. | ජන.- සැප්. |
| බස් රථ | 2,685 | 3,331 | 2,957 | 1,613 | 1,099 | 507 |
| මෝටර් කාර් | 45,172 | 39,182 | 80,776 | 38,232 | 28,574 | 20,048 |
| ලොරි | 26,887 | 16,742 | 16,931 | 3,738 | 2,969 | 2,387 |
| යතුරු පැදි | 340,129 | 344,380 | 339,763 | 284,301 | 223,728 | 144,399 |
| ත්‍රිරෝද රථ | 56,945 | 23,537 | 20,063 | 15,490 | 12,144 | 7,040 |
| ට්‍රැක්ටර් සහ ටේලර්ස් *** | 13,947 | 13,049 | 10,282 | 7,666 | 5,531 | 5,790 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

* නැවත (ඇසිරීම්) ඇතුළත් වේ.

** රැහැන් සහිත දුරකථන සහ රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව මෙහි ඇතුළත් වේ.

*** රෝද හතරේ ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් මෙහි ඇතුළත් වේ.

## විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ උපදේශන, තැපැල් සේවා

විදුලි සංදේශ සේවාවල සිදුවූ සියයට 15.2 ක පුළුල්වීම හේතුවෙන් 2020 වසරේ දී විදුලි සංදේශ අංශයේ අගය එකතු කළ සේවාවන් සියලුම උප අංශ අතර ඉහළම වර්ධනයක් පෙන්නුම් කළේය. රට අගුළුලා දැමූ කාලපරිච්ඡේදය තුළ දී සහ 'නිවසේ සිට වැඩකිරීම' සංකල්පය හඳුන්වා දීම හේතුවෙන් පරිශීලකයින්ගෙන් එවැනි සේවාවන් සඳහා ඇති ඉහළ ඉල්ලුම ඉහළයාමෙන් විදුලි සංදේශ සේවාවන්ට ඉහළ ප්‍රතිලාභ හිමි විය. ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (BPO) සඳහා ඇති ඉහළ ඉල්ලුමේ ප්‍රතිලාභ ලබමින් 2020 වසරේ පළමු කාර්තුවේ දී තොරතුරු තාක්ෂණ වැඩසටහන් උපදේශනය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සියයට 9.6 කින් පුළුල් විය. ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා සහ ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා සංඛ්‍යාවේ වැඩිවීම පිළිවෙළින් සියයට 19.4 සහ සියයට 6.5 ක් විය. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම විසින් 'නිවසේ සිට වැඩකිරීම' සහ 'නිවසේ සිට අධ්‍යාපන' කටයුතු කිරීමට අදාලව ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. මේ අතර, තැපැල් හා කුරියර් ක්‍රියාකාරකම් 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.7 කින් වර්ධනය විය.

**මූල්‍ය සේවා, රක්ෂණ හා දේපල වෙළඳාම් සහ වෙනත් සේවා**

මූල්‍ය හා සහායක මූල්‍ය සේවා අංශය එකතු කළ අගය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වූ සියයට 4.8 ට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.9 කින් සැළකිය යුතු ලෙස පුළුල් විය. මේ අතර, 2020 වසරේ පළමු කාර්තුවේදී රක්ෂණ උප අංශයේ වර්ධනය සියයට 0.2 දක්වා පහත වැටුණි.

2020 වසරේ පළමු කාර්තුවේ දී දේපල වෙළඳාම් කටයුතු සියයට 4.2 කින් පුළුල් විය. 2020 වසරේ පළමු කාර්තුවේ දී රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක, අධ්‍යාපනය, මානව සෞඛ්‍ය හා සමාජ වැඩ කටයුතු උප අංශ පිළිවෙළින් සියයට 0.9, සියයට 2.4 සහ සියයට 1.2 කින් වර්ධනය විය. වෘත්තීය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන සහ උපකාරක සේවා ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 1.6 කින් ආන්තිකව වැඩි විය.

**වගුව 2.3: සංචාරක අංශයේ කාර්යසාධනය**

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020(ආ) | 2016 | 2017 | 2018 | 2019(අ) | 2020(ආ) |
| ජනවාරි | 194,280 | 219,360 | 238,924 | 244,239 | 228,434 | 333.3 | 407.0 | 448.5 | 460.3 | 430.6 |
| පෙබරවාරි | 197,697 | 197,517 | 235,618 | 252,033 | 207,507 | 339.2 | 366.3 | 442.3 | 475.0 | 391.1 |
| මාර්තු | 192,841 | 188,076 | 233,382 | 244,328 | 71,370 | 330.8 | 348.8 | 438.1 | 460.5 | 134.5 |
| අප්‍රේල් | 136,367 | 160,249 | 180,429 | 166,975 | - | 234.0 | 297.2 | 338.7 | 314.7 | - |
| මැයි | 125,044 | 121,891 | 129,466 | 37,802 | - | 214.5 | 226.1 | 243.0 | 71.2 | - |
| ජූනි | 118,038 | 123,351 | 146,828 | 63,072 | - | 202.5 | 228.8 | 275.6 | 118.9 | - |
| ජූලි | 209,351 | 205,482 | 217,829 | 115,701 | - | 359.2 | 381.1 | 408.9 | 218.1 | - |
| අගෝස්තු | 186,288 | 190,928 | 200,359 | 143,587 | - | 319.6 | 354.0 | 376.1 | 270.6 | - |
| සැප්තැම්බර් | 148,499 | 145,077 | 149,087 | 108,575 | - | 254.8 | 269.0 | 279.8 | 204.6 | - |
| ඔක්තෝබර් | 150,419 | 152,429 | 153,123 | 118,743 | | 258.1 | 283.0 | 287.4 | 223.8 | |
| නොවැම්බර් | 167,217 | 167,511 | 195,582 | 176,984 | | 286.9 | 311.0 | 367.1 | 333.6 | |
| දෙසැම්බර් | 224,791 | 244,536 | 253,169 | 241,663 | | 385.7 | 453.0 | 475.2 | 455.5 | |
| **එකතුව** | **2,050,832** | **2,116,407** | **2,333,796** | **1,913,702** | **507,311** | **3,518.6** | **3,925.3** | **4,380.7** | **3,606.9** | **956.2** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය*

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

**වගුව 2.4 : ද.දේ.නි වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)**

| අංශය | 2015 | 2016 | 2017 | 2018 | 2019(අ) | පළමු කාර්තුව 2019(අ) | පළමු කාර්තුව 2020(අ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික** | **4.7** | **-3.7** | **-0.4** | **6.5** | **0.6** | **5.0** | **-5.6** |
| තේ වගාව | -2.5 | -11.2 | 4.5 | 0.4 | -1.3 | -1.2 | -27.5 |
| වී වගාව | 25.0 | -31.3 | -7.1 | 44.7 | -0.3 | 28.2 | 4.1 |
| රබර් වගාව | -10.1 | -10.7 | 4.9 | -0.3 | -9.5 | 3.3 | -8.7 |
| ධාන්‍ය වගාව | 7.3 | -12.2 | -12.6 | 2.0 | -9.5 | -19.8 | 12.9 |
| එළවළු වගාව | 2.7 | 2.9 | -5.3 | 4.0 | 1.5 | -4.4 | 5.0 |
| සත්ව නිෂ්පාදන | 8.1 | 7.3 | 5.6 | 8.0 | 3.2 | 8.3 | 0.4 |
| වන වගාව,දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 1.9 | 8.5 | 19.2 | -0.8 | -4.8 | -5.5 | -13.3 |
| ධීවර කර්මාන්තය | -12.5 | 10.6 | -8.7 | 6.4 | -2.5 | 17.6 | -14.4 |
| **කර්මාන්ත** | **2.2** | **5.7** | **4.7** | **1.2** | **2.7** | **3.9** | **-7.8** |
| පතල් හා කැනීම් | -5.2 | 13.8 | 9.3 | -5.2 | 2.8 | 6.2 | -18.3 |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | 4.7 | 1.8 | 3.9 | 3.6 | 1.9 | 2.5 | -4.1 |
| අනෙකුත් කර්මාන්ත | 10.1 | 10.0 | 3.9 | 7.5 | 3.4 | 3.4 | 2.4 |
| ඉදිකිරීම් | -2.5 | 8.3 | 4.4 | -2.5 | 4.0 | 6.9 | -16.0 |
| **සේවා** | **6.0** | **4.8** | **3.6** | **4.6** | **2.3** | **3.7** | **3.1** |
| තොග හා සිල්ලර වෙළඳාම | 5.6 | 2.6 | 3.8 | 4.7 | 3.0 | 4.6 | 4.1 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | 5.2 | 5.5 | 3.2 | 2.1 | 1.4 | 2.7 | -0.1 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | 1.9 | 4.0 | 5.0 | 5.7 | -4.6 | 4.6 | -6.2 |
| තොරතුරු හා සන්නිවේදනය | 4.4 | 7.9 | -0.9 | -10.2 | 4.8 | 15.0 | 13.1 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 14.8 | 11.8 | 8.9 | 13.9 | 2.6 | 4.5 | 7.9 |
| නිශ්චල දේපළ ක්‍රියාකාරකම් | 10.2 | 6.3 | 4.7 | 3.9 | 2.4 | 2.2 | 4.2 |
| වෘත්තිමය සේවා | -7.3 | -1.3 | 4.3 | 4.3 | 2.4 | 4.9 | 1.6 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජයීය ක්‍රියාකාරකම් | -1.6 | 4.5 | 3.8 | 3.5 | 2.5 | 1.8 | 1.9 |
| රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව | 6.9 | 5.2 | -4.8 | -0.6 | 2.1 | 2.0 | 1.9 |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | 4.0 | 1.4 | 3.2 | 2.7 | 2.1 | 3.8 | 3.4 |
| ද.දේ.නි | **5.0** | **4.5** | **3.6** | **3.3** | **2.3** | **3.7** | **-1.6** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*


(අ) තාවකාලික

## සේවා වියුක්තිය

ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, සේවා නියුක්තික ජන සංඛ්‍යාව 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ මිලියන 8.2 ට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගය තුළ ආසන්න වශයෙන් මිලියන 8 දක්වා සියයට 2.4 කින් අඩුවිය. කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ති ජන සංඛ්‍යාව වැඩිවුවද, කර්මාන්ත හා සේවා අංශවල සේවා නියුක්තිය අඩුවීම මෙම පහත වැටීම සඳහා හේතු විය. කොවිඩ්-19 වසංගතයෙහි බලපෑම හේතුවෙන් රැකියා විරහිත සංඛ්‍යාව 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ මිලියන 0.410 ට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී මිලියන 0.471 දක්වා සියයට 14.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ඒ අනුව විරැකියා අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී වූ සියයට 4.8 ට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී සියයට 5.6 දක්වා ඉහළ ගියේය. 2020 වසරේ පළමු භාගයේ දී කාන්තා සේවා වියුක්ති අනුපාතිකය සියයට 8.9 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, පුරුෂයන් අතර සියයට 3.9 ක් ලෙස මධ්‍යස්ථව පැවතුණි.

කෙසේ වුවද සේවා වියුක්ත අනුපාතිකය 2020 වසරේ පළමු කාර්තුවේ දී වූ සියයට 5.7 ට සාපේක්ෂව 2020 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 5.4 දක්වා අඩු විය. ඇස්තමේන්තුගත ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2020 වසරේ ජුනි මස අවසානය වනවිට සියයට 50.2 ක් විය. වයස අවුරුදු 15-24 අතර තරුණ වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරේ පළමු භාගයේ දී සියයට 27.3 ක් ලෙස ඉහළ මට්ටමක පැවතුණි. අ.පො.ස. (උ.පෙළ) හා ඉන් ඉහළ කාණ්ඩයේ සේවා වියුක්ත අනුපාතිකය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ සියයට 8.7 සිට

රූප සටහන 2.7 : සේවා වියුක්තිය




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

සියයට 10.1 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

### 2.3 මුදල් අංශයේ වර්ධනයන්


කොවිඩ්-19 වසංගත තත්ත්වයන් සමග මහ බැංකුව විසින් වඩාත් ලිහිල් මූල්‍ය ස්ථාවර ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. පොලී අනුපාතිකය අඩු කිරීම සහ පෞද්ගලික අංශයේ ණය වර්ධනය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් රාශියක් ගෙන ඇත.

2019 වසර අවසානය වන විට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් සියයට 7.0 සහ සියයට 8.0 ක් විය. අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවති පෞද්ගලික අංශයේ ණය වර්ධනය උත්තේජනය කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.5 සහ 7.5 දක්වා 2020 වසරේ ජනවාරි මස දී පදනම් අංක 50 කින් අඩු කරන ලදී. 2020 වසරේ මාර්තු මස දී ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාවට අවතීර්ණ වීමත් සමග මූල්‍ය වෙළෙඳපොළ පහසු කිරීම සඳහා ප්‍රතිපත්තිමය පොලී අනුපාත (SDFR සහ SLFR) සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පිළිවෙළින් සියයට 6.25 හා 7.25 සහ සියයට 4.0 දක්වා අඩු කරන ලදී. කොවිඩ්-19 පැතිරී යෑමට ප්‍රතිචාර දැක්වීමක් ලෙස අප්‍රේල් මාසයේ දී යළිත් ප්‍රතිපත්තිමය පොලී අනුපාතික (SDFR සහ SLFR) පදනම් අංක 25 කින් සියයට 6.0 හා 7.0 දක්වා පහත හෙලන ලදී. 2020 වසරේ මැයි මස දී ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත සහන සැලසීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික (SDFR සහ SLFR) පදනම් අංක 50 කින් පිළිවෙළින් සියයට 5.5 හා 6.5 දක්වා අඩු කරන ලදී. කෙසේ වුවද, 2020 ජනවාරි මස සිට මැයි මස දක්වා ප්‍රතිපත්ති අනුපාතික පදනම් අංක 150 කින් පහත දැමුවද පුද්ගලික අංශය සඳහා ණය වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා දුර්වල වීම ඒතුවෙන් 2020 වසරේ ජුනි මස දී පොලී අනුපාතික තවදුරටත් අඩු කිරීමේ අරමුණින් වෙළෙඳපොළට වැඩි ද්‍රවශීලතාවයක් සැපයීම සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය තවදුරටත් අඩු කරන ලදී.

මේ අතර, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සහනදායී පොලී අනුපාත යටතේ නව ණය යෝජනා ක්‍රම හඳුන්වා දුන්නද, පෞද්ගලික අංශයට ණය වර්ධනය අනම්‍යශීලීව පැවතුණි. 2020 වසරේ ජූලි මස දී වෙළෙඳපොළ ණය අනුපාතිකයන් අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික (SDFR සහ SLFR) පදනම් අංක 100 කින් පිළිවෙළින් එනම් සියයට 4.5 සහ 5.5 දක්වා අඩු කර ඇත. ණය ගැනීම් වැඩි කිරීම සඳහා 2020 වසරේ අගෝස්තු මස දී වෙනත් නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. මේ අනුව ඉහත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වලින් පසු අපේක්ෂා කළ පරිදි වෙළෙඳපොළ පොලී අනුපාත පහත වැටුණු අතර පුද්ගලික අංශයේ ඉහළ වර්ධනයක් සමගින් පුළුල් මුදල් වර්ධනය ප්‍රසාරණය විය.

2020 වසරේ ජනවාරි මස අවසානයේ දී සියයට 13.47 ක් වූ බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) 2020 වසරේ ජූලි මස අවසානය වන විට සියයට 12.29 ක් දක්වා පහත වැටුණු අතර, සැප්තැම්බර් අග වන විට එය තවදුරටත් සියයට 11.21 ක් දක්වා පහත වැටුණි. මේ අතර මෙම වසරේ ජනවාරි මස අවසානය වන විට සියයට 8.06 ක් වූ බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) ඔක්තෝබර් 21 වන විට සියයට 6.23 දක්වා පහත වැටී තිබුණි. පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2020 වසරේ ජනවාරි මස අවසානය වන විට රු. බිලියන 7,704 සිට 2020 වසරේ අගෝස්තු මස අවසන් වන විට රු. බිලියන 8,692 ක් දක්වා

රූපසටහන 2.8 : පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

සියයට 8.57 කින් ඉහළ ගිය අතර, පවත්නා අඩු පොළී අනුපාතිකයෙහි වාසිය අත්පත් කර ගනිමින් පුද්ගලික අංශයට ලබාදුන් ණය මෙම වසරේ ජනවාරි අවසානයේ රු. බිලියන 5,798 සිට 2020 වසරේ අගෝස්තු මස අවසානයේ දී රු. බිලියන 5,909 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.


**උද්ධමනය**

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI, 2013 = 100) මත පදනම් වූ උද්ධමනය 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සියයට 4-6 අතර විය. 2020 වසරේ මුල් මාස නවය තුළ වාර්ෂික පදනම මත මනිනු ලබන උද්ධමනය, (i) උද්ධමනය ජනවාරි මාසයේ සියයට 5.7 සිට 2020 පෙබරවාරි මාසයේදී සියයට 6.2 දක්වා වැඩිවීම; (ii) උද්ධමනය පහත වැටී ජුනි මාසයේදී සියයට 3.9 දක්වා ළඟා වීම; සහ (iii) 2020 සැප්තැම්බර් මාසයේදී උද්ධමනය සියයට 4.0 දක්වා වැඩිවීම අදියර තුනක් යටතේ පෙන්නුම් කරයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ජනවාරි මාසයේදී සියයට 4.5 ක් වූ අතර 2020 වසරේ සැප්තැම්බර් මාසයේදී එය සියයට 4.7 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI, 2013 = 100) මගින් මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ ඉහළ මැද තනි අගයකට ළඟා විය. ජනවාරියේදී සියයට 7.6 ක් වාර්තා කළ ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය, 2020 වසරේ පෙබරවාරි මාසයේදී සියයට 8.1 දක්වා උපරිමයට ඉහළ ගොස් 2020 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 6.4 දක්වා අඩුවිය. ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2020 වසරේ ජනවාරි මාසයේ දී සියයට 4.1 සිට 2020 වසරේ සැප්තැම්බර් මස දී සියයට 6.2 ක් දක්වා ඉහළ ගොස් ඇත.

මෙයට අමතරව, ආර්ථිකයේ යටිදැරි උද්ධමනය වන මූලික උද්ධමනය අඛණ්ඩව පහළ මට්ටමක පැවති අතර ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) පදනම් කරගත් මූලික උද්ධමනය වාර්ෂික වශයෙන් ගත් කළ ජනවාරි මාසයේ පැවති සියයට 3.9 සිට මාර්තු මාසයේදී සියයට 3.2 දක්වා පහත වැටුණ ද, එය 2020 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 4.8 කට ළඟා විය. එමෙන්ම, කොළඹ

**රූප සටහන 2.9 : මතුපිට, මූලික හා ආහාර උද්ධමන විචලතා (පදනම : 2013 = 100)**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව 2.5 : ශ්‍රී ලංකාවේ මතුපිට, මූලික සහ ආහාර උද්ධමනය (පාදක වර්ෂය 2013 = 100)**

| මාසය | මතුපිට උද්ධමනය (%) | | | | මූලික උද්ධමනය (%) | | | | ආහාර උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍ය | |
| | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 |
| ජනවාරි | 3.7 | 5.7 | 4.1 | 4.5 | 5.5 | 3.0 | 3.7 | 5.3 | -2.1 | 12.4 | 2.3 | 2.0 |
| පෙබරවාරි | 4.0 | 6.2 | 4.1 | 4.6 | 5.4 | 3.2 | 3.8 | 5.1 | -1.4 | 14.7 | 1.7 | 3.3 |
| මාර්තු | 4.3 | 5.4 | 4.1 | 4.7 | 5.6 | 2.9 | 4.0 | 4.9 | -1.4 | 12.8 | 1.2 | 4.4 |
| අප්‍රේල් | 4.5 | 5.2 | 4.1 | 4.8 | 5.5 | 3.1 | 4.2 | 4.7 | -0.9 | 13.2 | 0.9 | 5.5 |
| මැයි | 5.0 | 4.0 | 4.2 | 4.7 | 6.2 | 2.9 | 4.4 | 4.4 | 0.8 | 9.9 | 0.7 | 6.3 |
| ජූනි | 3.8 | 3.9 | 4.2 | 4.7 | 5.8 | 3.1 | 4.7 | 4.2 | -1.0 | 10.0 | 0.3 | 7.2 |
| ජූලි | 3.3 | 4.2 | 4.0 | 4.8 | 5.7 | 3.2 | 4.8 | 4.0 | -2.6 | 10.9 | -0.3 | 8.4 |
| අගෝස්තු | 3.4 | 4.1 | 3.8 | 4.8 | 5.6 | 3.2 | 5.0 | 3.8 | -2.8 | 12.3 | -1.2 | 9.7 |
| සැප්තැම්බර් | 5.0 | 4.0 | 3.9 | 4.7 | 5.6 | 2.9 | 5.1 | 3.6 | 3.0 | 11.5 | -1.1 | 10.4 |
| ඔක්තෝබර් | 5.4 | - | 4.0 | - | 5.5 | - | 5.3 | - | 6.8 | - | -0.4 | - |
| නොවැම්බර් | 4.4 | - | 4.1 | - | 5.1 | - | 5.4 | - | 4.6 | - | 0.1 | - |
| දෙසැම්බර් | 4.8 | - | 4.3 | - | 4.8 | - | 5.5 | - | 6.3 | - | 0.8 | - |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගත් වාර්ෂික මූලික උද්ධමනය 2020 වසරේ ජනවාරි මාසයේ පැවති සියයට 3.0 ක අගයේ සිට 2020 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 2.9 ක් දක්වා අඩු විය.

### 2.4 කොටස් වෙළෙඳපොළ

කොළඹ කොටස් හුවමාරුවේ (CSE) දර්ශකයන් මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2019 වසර අවසානයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් අවසානය වන විට සමස්ත කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය පිළිවෙළින් සියයට 2.4 කින් සහ සියයට 16.1 කින් පහත වැටුණි. 2019 වසර අවසන් වන විට රු. බිලියන රු. 2,851 ක් වූ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2020 වසරේ සැප්තැම්බර් මස අග වන විට රු. බිලියන 2,5956 ක් විය. මේ අතර 2019 වසරේ මුල් මාස නවය තුළ වාර්තා කළ රු. මිලියන 661 හා සැසඳීමේ දී සාමාන්‍ය දෛනික පිරිවැටුම රු. මිලියන 1,482 ක් දක්වා වැඩි විය. 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 2.6 ක විදේශ විකුණුම් හා සැසඳීමේදී 2020 වසරේ පළමු මාස නවය තුළ සමුච්චිත විදේශ විකුණුම් රු. බිලියන 40 ක් විය.

කොවිඩ්-19 වසංගතය නිසා පැන නැගි අවිනිශ්චිතතාවයන් හේතුවෙන් කොළඹ කොටස් හුවමාරුව මිශ්‍ර කාර්යසාධනය පෙන්නුම් කළද වසර ආරම්භයේ දී නව දේශපාලන ස්ථාවරත්වය සහ කොවිඩ්-19 සාර්ථක ලෙස පාලනය කිරීම නිසා කොළඹ කොටස් හුවමාරුව ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි වීම හේතුවෙන් යථා තත්ත්වයට පත් වීම පෙන්නුම් කළේය. කෙසේ වුවද, කොළඹ කොටස් හුවමාරුවේ ක්‍රියාකාරිත්වය වසංගතයේ පැතිරීමට වඩාත් සංවේදී විය. කොවිඩ්-19 පැතිරීම නිසා ඇති වූ රට අගුළුලා දැමීම හේතුවෙන්, කොළඹ කොටස් හුවමාරුව 2020 වසරේ මාර්තු 20 සිට 2020 වසරේ මැයි 11 දක්වා වසා දමන ලදී. කොළඹ කොටස් හුවමාරුවේ ක්‍රියාකාරකම් නැවත ආරම්භ වීමෙන් පසුව, 2020 වසරේ සැප්තැම්බර්/ඔක්තෝබර් මාසවල පැන නැගි දෙවන රැල්ලෙන් පසුව වෙළෙඳපොළ දර්ශක පහත වැටුණි.

**2.6 වගුව : ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම්**

| දර්ශකය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | සැප්තැම්බර් අවසානයට 2019 | සැප්තැම්බර් අවසානයට 2020(අ) |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 7,299 | 6,895 | 6,228 | 6,369 | 6,052 | 6,129 | 5,738 | 5,985 |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය* | 4,089 | 3,626 | 3,496 | 3,672 | 3,135 | 2,937 | 2,760 | 2,463 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලි.) | 3,105 | 2,938 | 2,745 | 2,899 | 2,840 | 2,851 | 2,709 | 2,596 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 294 | 294 | 295 | 296 | 297 | 289 | 290 | 285 |
| වාර්ෂික පිරිවැටුම (රු. බිලි.) | 341 | 253 | 176 | 221 | 200 | 171 | 118 | 218 |
| විදේශ විකුණුම් (රු. මිලි.) | 83,554 | 89,793 | 74,275 | 94,627 | 100,315 | 68,272 | 48,721 | 87,027 |
| විදේශ ගැනුම් (රු. මිලි.) | 104,771 | 84,421 | 74,625 | 112,285 | 77,067 | 56,537 | 46,127 | 46,905 |
| ශුද්ධ ගැනුම් (රු. මිලි.) | 21,217 | -5,372 | 350 | 17,658 | -23,248 | -11,735 | -2,594 | (40,122) |

*මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළඳපොල හා ශ්‍රී ලංකා මහ බැංකුව*

(අ) තාවකාලික

### 2.5 විදේශ අංශයේ වර්ධනයන්

ශ්‍රී ලංකාවේ විදේශ අංශය, 2020 වසරේ මුල් මාස අට තුළ දී; කොවිඩ්-19 වසංගතයෙන් ඇති කරන ලද අහිතකර බලපෑම් සමඟ (i) 2020 පළමු මාස හය තුළ වෙළඳාම්, සංචාරක සහ මූල්‍ය ප්‍රවාහයන්වල අඩු කාර්යසාධනයක් පෙන්නුම් කිරීම; (ii) අගුළුලා දැමීම් ක්‍රියාමාර්ග ඉවත්කිරීමෙන් පසු දේශීය ආර්ථික කටයුතු යළි ඇරඹීමත් සමඟ 2020 වසරේ මැයි දෙවන සතියේ සිට විදේශ අංශය යථා තත්ත්වයට පත් වීම ඇරඹීම යන අවස්ථා දෙකක් යටතේ මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. බනිජ තෙල් ආනයන වියදම අඩු වීමත් සමඟම, ඇතැම් විදේශ ප්‍රාග්ධන ප්‍රවාහයන් ගලායාම් සහ අත්‍යවශ්‍ය නොවන ආනයන මත සීමාවන් පැනවීම හේතුවෙන් ආනයන වියදම පහත වැටීම, අපනයන ඉහළ යාම, ශ්‍රමික ප්‍රේෂණ වැඩිවීම සහ වෙළඳ හිඟය පටුවීමත් සමඟ ජූනි, ජූලි සහ අගෝස්තු මාසවල විදේශ අංශය යථා තත්ත්වයට පත්විය.

සමුච්චිත පදනම මත ගත් කළ, වෙළඳ හිඟය 2019 සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ ඇ.ඩො. මිලියන 4,855 ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 3,812 දක්වා ඇ.ඩො. මිලියන 1,043 කින් අඩුවිය. 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී ඇ.ඩො. මිලියන 8,030 ක්ව පැවති අපනයන ඉපැයීම් 2020 වසරේ මුල් මාස අට තුළ ඇ.ඩො. මිලියන 6,445 දක්වා

සියයට 19.7 කින් අඩු වී ඇති අතර, කර්මාන්ත, කෘෂිකාර්මික හා ඛනිජ අපනයන පිළිවෙළින් ඇ.ඩො. මිලියන 4,905.5 දක්වා සියයට 22.5 කින් ද, ඇ.ඩො. මිලියන 1,516.0 ක් දක්වා සියයට 9.1 කින් ද, ඇ.ඩො. මිලියන 14.3 දක්වා සියයට 33.1 කින් ද සංකෝචනය විය.

මේ අතර, ආනයන වියදම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 12,885.5 ට සාපේක්ෂව, 2020 වසරේ මුල් මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 10,257.4 දක්වා සියයට 20.4 කින් පහළ ගියේය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන්, ඛනිජතෙල් ආනයනය සඳහා වියදම් අඩු වීම සහ අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්ති හේතු විය.

ගෝලීය වර්ධනයන්ට සමගාමීව, 2020 වසරේ මාර්තු සිට ඉදිරියට, විදේශ සංචාරකයන් සඳහා රට වසා තබන ලදී. ගෝලීය අවිනිශ්චිතතාවයන් ඉහළ යාමත් සමඟ, රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙන් සහ කොළඹ කොටස් වෙළඳපොළෙන් (CSE) සිදු වූ පිටතට ගලා යාම් තුළින් එය තහවුරු වී ඇත. විදේශ විනිමය ගලා යාම් මත පනවා ඇති සීමාවන් ද ඇතුළුව රජය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග මාලාවන් සමඟ 2020 අගෝස්තු මස අවසානයේදී ශ්‍රී ලංකා රුපියල ස්ථාවර විය.

**වගුව 2.7 : විදේශීය වෙළෙඳාම**

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2017 | 2018 | 2019 | ජන. - අගෝ. 2019 | ජන. - අගෝ. 2020(අ) |
|---|---|---|---|---|---|
| අපනයන | **11,361** | **11,890** | **11,940** | **8,030** | **6,445** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,767** | **2,580** | **2,462** | **1,667** | **1,516** |
| තේ | 1,530 | 1,429 | 1,346 | 915 | 806 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 1,237 | 1,151 | 1,116 | 752 | 710 |
| **කාර්මික අපනයන** | **8,542** | **9,258** | **9,427** | **6,330** | **4,906** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,032 | 5,318 | 5,597 | 3,737 | 2,853 |
| ආහාර පාන සහ දුම්කොළ | 393 | 462 | 447 | 304 | 303 |
| රබර් නිෂ්පාදන | 835 | 875 | 866 | 591 | 489 |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 371 | 435 | 400 | 275 | 210 |
| ඛනිජතෙල් නිෂ්පාදන | 434 | 622 | 521 | 328 | 268 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,477 | 1,546 | 1,596 | 1,096 | 783 |
| **ඛනිජමය අපනයන** | **35** | **34** | **34** | **21** | **14** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **17** | **18** | **18** | **11** | **9** |
| ආනයන | **20,980** | **22,233** | **19,937** | **12,886** | **10,258** |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,503** | **4,980** | **3,957** | **2,499** | **2,300** |
| ආහාර සහ පාන | 1,841 | 1,606 | 1,427 | 917 | 1,024 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 2,662 | 3,374 | 2,530 | 1,582 | 1,277 |
| **අතරමැදි භාණ්ඩ** | **11,436** | **12,488** | **11,369** | **7,380** | **5,692** |
| ඛනිජ තෙල් | 3,428 | 4,152 | 3,892 | 2,577 | 1,691 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,724 | 2,859 | 2,909 | 1,877 | 1,457 |
| තිරිඟු සහ බඩ ඉරිඟු | 357 | 374 | 346 | 203 | 229 |
| අනෙකුත් | 4,927 | 5,104 | 4,222 | 2,723 | 2,315 |
| ආයෝජන භාණ්ඩ | **4,895** | **4,690** | **4,603** | **3,002** | **2,253** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 2,621 | 2,492 | 2,490 | 1,610 | 1,325 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,591 | 1,525 | 1,509 | 1,007 | 671 |
| ප්‍රවාහන උපකරණ | 675 | 668 | 597 | 380 | 255 |
| අනෙකුත් | 8 | 6 | 8 | 5 | 2 |
| **වර්ගීකරණය නොකළ ආනයන** | **147** | **75** | **8** | **5** | **11** |
| වෙළඳ හිඟය | **- 9,620** | **-10,343** | **-7,997** | **-4,864** | **-3,8120** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

(අ) තාවකාලික

රජය නිසි පරිදි ණය සේවා වගකීමක්ද ඉටු කළේය. විදේශ ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට රජය කැපවී සිටින අතර එමගින් කෙටි කාලයක් ඇතුළත මධ්‍යකාලීනව ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවෙනු ඇත.


### අපනයන

2020 වසරේ පළමු මාස අට තුළ දී අපනයන "වී" හැඩැතිව යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරන ලදීව. විදේශ වෙළෙඳාම් අංශය සඳහා කොවිඩ්-19 වසංගතයෙන් බලපෑම පිළිබිඹු කරමින්, අපනයන ඉපැයීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 8,030.2 ට සාපේක්ෂව, 2020 වසරේ පළමු මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 6,445.0 දක්වා සියයට 19.7 කින් පහත වැටුණි.

2019 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 6,330.2 ට සාපේක්ෂව, කාර්මික අපනයන ඉපැයීම් 2020 වසරේ මුල් මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 4,905.5 ක් දක්වා සියයට 22.5 කින් පහළ ගියේය. මේ සඳහා 2020 වසරේ මුල් මාස අට තුළ දී කාර්මික අපනයන විශේෂයෙන් රෙදිපිළි හා ඇඟලුම් සියයට 23.6 කින්, මැණික් දියමන්ති සහ ස්වර්ණාභරණ සියයට 48.7 කින්, ප්‍රවාහන උපකරණ සියයට 61.6 කින්, මූල ලෝහ හා කොටස් සියයට 37.2 කින්, සම්, ගමන්මළු හා පාවහන් සියයට 48.5 කින් සහ රබර් නිෂ්පාදන සියයට 17.3 කින් පහත වැටීම හේතු වී ඇත. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ, රෙදිපිළි හා ඇගළුම් අංශය යටතේ කාණ්ඩගත කරන ලද මුහුණු ආවරණ, ශල්‍ය අත්වැසුම් සහ සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුම් කට්ටල, වෙනත් රෙදිපිළි වලින් නිෂ්පාදිත උපාංග සහ රබර් නිෂ්පාදන යටතේ වර්ගීකරණය කරන ලද වෙනත් අත්වැසුම් වැනි පෞද්ගලික සෞඛ්‍යාරක්ෂිත උපකරණ සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ඒ හේතුවෙන්, අනෙකුත් රෙදි වලින් නිෂ්පාදිත උපාංග වලින් ඉපැයූ ආදායම 2019 වසරේ අනුරූප කාලය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 70.5 ට සාපේක්ෂව, ඇ.ඩො. මිලියන 170.1 දක්වා සියයට 141 කින් ඉහළ ගියේය.


තවද, ආහාර පාන සහ දුම්කොළ, ප්‍රවාහන උපකරණ, ප්ලාස්ටික් සහ උපාංග යන උප කාණ්ඩවලින් සමන්විත කාර්මික අපනයන ඉපැයීම් 2020 අගෝස්තු මාසයේදී ඉහළ ගොස් ඇත. අපනයන භාණ්ඩ සඳහා ඉල්ලුම අවම කරමින්, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ අනෙකුත් යුරෝපීය රටවල් වැනි ප්‍රධාන අපනයන ගමනාන්තයන් කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් විය. මේ අතර, එළවළු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන හැර තේ, රබර්, පොල්, කුළුබඩු, සැකසුම් නොකළ දුම්කොළ සහ මුහුදු ආහාර ඇතුළු කෘෂිකාර්මික අපනයන සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයනවල ඉපැයීම්, 2019 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,667.4 ට සාපේක්ෂව 2020 වසරේ මුල් මාස අට තුළ ඇ.ඩො. මිලියන 1,516.0 දක්වා සියයට 9.1 කින් පහත වැටුණි. කෙසේ වුවද, වාර්ෂික පදනම මත කෘෂිකාර්මික අපනයන ඉපැයීම් 2020 වසරේ ජුනි මාසයේදී ඇ.ඩො. මිලියන 229.1 දක්වා සියයට 12 කින් සහ ජූලි මාසයේ දී ඇ.ඩො. මිලියන 261.2 දක්වා සියයට 27.3 කින් ඉහළ ගියේය. තවද, කොවිඩ්-19 වසංගතයෙන් ඇතිකරන ලද අහිතකර බලපෑම් වලින් පසුව දේශීය ආර්ථික කටයුතු ස්ථාවර වීම හේතුවෙන්, පොල්, කුළුබඩු, එළවළු, සැකසුම් නොකළ දුම්කොළ සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන වලින් ලද ආදායම 2020 අගෝස්තු මාසයේදී වැඩි වී ඇත. මේ අතර, 2020 පළමු මාස අට තුළදී ඛනිජ අපනයන ඇ.ඩො. මිලියන 14.3 දක්වා සියයට 33.1 කින් අඩු විය.

**රූපසටහන 2.10 : වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**රූප සටහන 2.11 : අපනයන සංයුතිය**





*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

### ආනයන

2019 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 12,885.5 ට සාපේක්ෂව 2020 වසරේ මුල් මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 10,257.4 දක්වා ආනයන සියයට 20.4

කින් අඩුවී ඇති අතර, මෙයට ප්‍රධාන වශයෙන් මෝටර් වාහන ඇතුළු අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා පැනවීම හේතු වී ඇත. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,300.3 දක්වා සියයට 8 කින් පහත වැටුණි. ඒ අනුව, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,276.7 දක්වා සියයට 19.3 කින් අඩුවී ඇති අතර, එය 2019 වසරේ සමාන කාලය තුළ ඇ.ඩො. මිලියන 1,582.0 ක් විය. මෙයට ප්‍රධාන වශයෙන් පුද්ගලික වාහන, ඇඳුම් හා පැළඳුම්, ගෘහ උපකරණ, ගෘහ භාණ්ඩ, ගෘහස්ත උපකරණ හා ලී බඩු ආනයන වියදම පහත වැටීම හේතු වී ඇත. පුද්ගලික වාහන ආනයන වියදම ඇ.ඩො. මිලියන 280.8 දක්වා සියයට 43.4 කින් පහත වැටුණි. කෙසේ වුවද, එළවළු, කිරි නිෂ්පාදන, සීනි සහ රසකැවිලි හා කුළුබඩු ආනයනය කිරීම හේතුවෙන් 2020 මුල් මාස අට තුළ ආහාර හා පාන සඳහා ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,023.7 ක් දක්වා සියයට 11.6 කින් ඉහළ ගොස් ඇත. මේ අතර, ඉන්ධන, දියමන්ති, වටිනා ගල් හා ලෝහ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, මූල ලෝහ හා ඛනිජ නිෂ්පාදන ආනයන වියදම් අඩුවීම හේතු කොට ගෙන අන්තර් භාණ්ඩ සඳහා ආනයන වියදම ඇ.ඩො. මිලියන 7,379.8 සිට ඇ.ඩො. මිලියන 5,692.4 දක්වා සියයට 22.9 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. ආනයන කටයුතු ජූලි හා අගෝස්තු කාලය තුළ යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරන ලදී. ආර්ථික ක්‍රියාකාරකම් පහත වැටීමත් සමඟ ඉන්ධන සඳහා දේශීය ඉල්ලුම අඩුවීමෙන් ඉන්ධන ආනයන පරිමාව පහත වැටීම හේතුකොට ගෙන සහ ඉන්ධන ආනයනය සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 1,691.2 දක්වා සියයට 34.4 කින් සැලකිය යුතු ලෙස අඩු විය. තවද, 2020 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ගෝලීය සැපයුම් දාමයන්ට ඇති වූ බාධාවන් සහ මෑතකාලීනව ඇඟලුම් අපනයන ඉල්ලුම මත ඇති අඩු අපේක්ෂාවන් ද සමඟ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,457.2 ක් දක්වා සියයට 22.4 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

රූපසටහන 2.12 : ආනයන සංයුතිය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

ආයෝජන භාණ්ඩ මත වූ ආනයන වියදම 2019 වසරේ අනුරූප කාලය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 3,001.8 ට සාපේක්ෂව 2020 වසරේ මුල් මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 2,253.2 දක්වා සියයට 24.9 කින් එනම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ සියයට 17.7 කින්, ගොඩනැගිලි ද්‍රව්‍ය සියයට 33.3 කින්, ප්‍රවාහන උපකරණ සියයට 32.8 කින් සහ අනෙකුත් ආයෝජන භාණ්ඩ සියයට 56.5 කින් සැලකිය යුතු ලෙස අඩු වී ඇත

**සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ**

2019 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සංචාරකයන් 1,267,737 ට සාපේක්ෂව 2020 මුල් මාස අට තුළදී පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 507,311 ක් දක්වා සියයට 60 කින් පහළ ගියේය. මෙම තියුණු පහත වැටීමට 2020 වසරේ මාර්තු මැද සිට සියලුම මගී ගුවන් ගමන් සහ මගී නැව් ගමනාගමනය අත්හිටුවීම හේතු වී ඇත. ඒ අනුව සංචාරක ඉපැයීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 2,389 ට සාපේක්ෂව 2020 වසරේ මුල් මාස අට තුළ ඇ.ඩො. මිලියන 956 දක්වා සියයට 60 කින් පහත වැටුණි.

සමුච්චිත පදනම මත, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ගලාඒම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 4,414 ට සාපේක්ෂව 2020 මුල් මාස අට තුළ දී ඇ.ඩො. මිලියන 4,346 ක් දක්වා සියයට 1.5 කින් ආන්තිකව අඩුවිය. කෙසේ වුවද, ජූනි, ජූලි සහ අගෝස්තු මාසවල විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආදායම පිළිවෙළින් ඇ.ඩො. මිලියන 572 දක්වා සියයට 6.7 කින්, ඇ.ඩො. මිලියන 702 දක්වා සියයට 12.2 කින්, ඇ.ඩො. මිලියන 664 දක්වා සියයට 28.2 කින් ද වැඩි විය. මේ අතර, දළ නිල සංචිතය (GOR) 2020 වසරේ අගෝස්තු අවසානය වන විට ඇ.ඩො. බිලියන 7.4 ක් විය.

**2.6 ලෝක ආර්ථික සන්දර්භය**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අනුව ලෝක ආර්ථික වර්ධනය 2019 වසරේ වාර්තා වූ සියයට 2.4 ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 4.4 කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2020 වසරේ මුල් මාස හතර තුළ ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් විශාල ලෙස බිඳ වැටුණු අතර, කොවිඩ්-19 වසංගතය හා බැඳි රට වසා තැබීම සහ අනෙකුත් සීමාවන් මෙයට හේතු වී ඇත. වෙළඳ හා මූල්‍ය යන දෙඅංශයම කඩා වැටුණු අතර එමගින් බොහෝ ආර්ථිකයන් දැඩි පසුබෑමට ලක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විශේෂයෙන්ම, දැඩි ලෙස සංචාරක කර්මාන්තය ගෝලීය අගය දාමයන් හා බැඳුණු ආර්ථිකයන් සහ ප්‍රධාන කාර්මික භාණ්ඩ අපනයනයන් මත රඳා පවතින නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන් ගෙන් සියයට 80 ක් පමණ ඍණාත්මක ආර්ථික වර්ධනයකට මුහුණ දෙනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අනාවැකි පළ කරයි. ආදායම් අහිමි වීම අඩු ආදායම්ලාභී රටවල ආර්ථිකයන් කෙරෙහි දැඩි ලෙස බලපා ඇති අතර

එමගින් ඔවුන්ව දරිද්‍රතාවයට ඇද දමා ඇත. විශාල වසංගත තත්ත්වයකට මුහුණදීම සඳහා අවැසි සෞඛ්‍ය අංශයේ ධාරිතාව මෙම රටවල සීමාසහිතය. රාජ්‍ය ණය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් වර්තමාන වසංගතයට ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශයේ අර්බුදයකටද මුහුණදෙමින් සිටී. කෙසේ වුවද, වෙළඳ ක්‍රියාකාරකම් සහ ආයෝජන යථා තත්ත්වයට පත්වීමත් සමග 2021 වසරේ දී නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන්හි වර්ධනය සියයට 4.6 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කළද සංචාරක කර්මාන්තය මත යැපෙන රටවල් යථා තත්ත්වයට පත්වීමට වැඩි කාලයක් ගතවනු ඇත.

වගුව 2.8 : **තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2020 (පුරෝකථනය)**

| රට | ද.දේ.නි.වර්ධනය (වාර්ෂික ප්‍රතිශත වෙනස) | උද්ධමනය (ප්‍රතිශත) | සේවා වියුක්තිය (ප්‍රතිශත) | මූල්‍ය හිඟය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | දළ ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| ආජන්ටිනාව | -11.8 | ලැ.නො. | 11.0 | -10.7 | 62.2 |
| ඕස්ට්‍රේලියාව | -4.2 | 0.7 | 6.9 | -10.7 | 125.5 |
| බ්‍රසීලය | -5.7 | 2.8 | 13.4 | -16.8 | 101.4 |
| කැනඩාව | -7.1 | 0.6 | 9.7 | -19.9 | 114.6 |
| චිලී | -6.0 | 2.9 | 11.4 | -10.7 | 62.2 |
| චීනය | 1.9 | 2.9 | 3.8 | -11.9 | 61.7 |
| ප්‍රංශය | -9.8 | 0.5 | 8.5 | -10.8 | 118.7 |
| ජර්මනිය | -6.0 | 0.5 | 4.3 | -8.2 | 73.3 |
| ග්‍රීසිය | -9.5 | -0.6 | 19.9 | -6.2 | 48.8 |
| ඉන්දියාව | -10.3 | 4.9 | ලැ.නො. | -13.1 | 89.3 |
| ඉන්දුනීසියාව | -1.5 | 2.1 | 8.0 | -6.2 | 48.8 |
| ඉතාලිය | -10.6 | 0.1 | 11.0 | -13.0 | 161.8 |
| ජපානය | -5.3 | -0.1 | 3.3 | -14.2 | 266.2 |
| කොරියාව | -1.9 | 0.5 | 4.1 | -10.7 | 125.5 |
| මැලේසියාව | -6.0 | -1.1 | 4.9 | -6.2 | 48.8 |
| මෙක්සිකෝව | -9.0 | 3.4 | 5.2 | -5.8 | 65.5 |
| රුසියාව | -4.1 | 3.2 | 5.6 | -5.3 | 18.9 |
| සිංගප්පූරුව | -6.0 | -0.4 | 3.0 | -10.7 | 63.7 |
| දකුණු අප්‍රිකාව | -8.0 | 3.3 | 37.0 | -14.0 | 78.8 |
| ස්පාඤ්ඤය | -12.8 | -0.2 | 16.8 | -14.1 | 123.0 |
| තායිලන්තය | -7.1 | -0.4 | 1.0 | -6.2 | 48.8 |
| එක්සත් රාජධානිය | -9.8 | 0.8 | 5.4 | -16.5 | 108.0 |
| ඇමරිකා එක්සත් ජනපදය | -4.3 | 1.5 | 8.9 | -18.7 | 131.2 |
| වියට්නාමය | 1.6 | 3.8 | 3.3 | -6.2 | 48.8 |

*මූලාශ්‍රය : ලෝක ආර්ථික දර්ශනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2020 ඔක්තෝබර් සහ Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2020 ඔක්තෝබර්*

ලැ.නො. - ලැබී නොමැත

# 03

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය

### 3.1 සමාලෝචනය

කළමනාකරණ මණ්ඩල තුළ වෘත්තීමයභාවය, සෑම අදියරයකදීම සමීප අධීක්‍ෂණය සහ විධිමත් උපායමාර්ගික මෙහෙයවීම තුළින් රජය සතු ව්‍යවසායයන් මධ්‍යකාලීනව වාණිජමය වශයෙන් ශක්තිමත් කිරීම හා මූල්‍යමය වශයෙන් ස්වාධීන ව්‍යාපාර බවට පරිවර්තනය කිරීම හරහා ඒවායේ කාර්‍යක්‍ෂමතා මට්ටම ඉහළ නැංවීම සඳහා වත්මන් රජයේ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම යොමු වී ඇත.

රජය සතු ව්‍යවසායයන්හි සුදුසුකම් සහිත වෘත්තිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පැවතීමේ වැදගත්කම පැහැදිලිව හඳුනාගෙන, රජය විසින් එම කළමනාකරණ මණ්ඩල තුළ සේවය කිරීම සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයින්ගෙන් අභිලාශ ප්‍රකාශ ලබා ගැනීමේ නව ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ රජය සතු ව්‍යවසායයන්හි කළමනාකරණ මණ්ඩල සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයන් සහ මනා ව්‍යාපාරික පසුබිමක් සහිත ව්‍යවසායකයන් පත් කර ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද පසුගිය මාස කිහිපයේදී එම ව්‍යවසායයන් විසින් පෙන්නුම් කරන ලද කාර්යයසාධනය ඉහත පත්කිරීම්වල සාධනීය බලපෑම වෙනුවෙන් සාක්ෂි දරන බව දිරිගන්වන සුළු කරුණකි.

විශේෂයෙන්ම ප්‍රධාන මහජන සේවා සපයන ලංකා සතොස, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැනි ආයතනවල පවතින විහිදී ගිය සේවා ජාලය හා ක්‍රියාවලීන් හා පද්ධති භාවිතයට ගනිමින්, කොවිඩ් 19 තත්ත්වය මධ්‍යයේ වුවද එම ආයතන මගින් සපයනු ලබන සේවාවන් බිඳ වැටීමකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීමට රජයට හැකි වී ඇත. ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ කොටස් හිමිකාරීත්ව අගය වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණ කිරීම ආරම්භ කර ඇත. මෙහිදී, රජයට අයත් නිශ්චල දේපල (Real Estate) වත්කම් නිසි ලෙස අධීක්ෂණය කිරීම සඳහා සෙලෙන්දිවා ආයෝජන සමාගම ස්ථාපිත කර ඇති අතර අධිවේගී මාර්ග කළමනාකරණය කිරීම සඳහාද සමාගමක් සංස්ථාපනය කිරීමට කටයුතු කෙරේ. ශක්තිමත් අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට සමගාමීව, ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලින් සමන්විත උපායමාර්ගික ව්‍යාපාර සැලසුම් ඉදිරිපත් කිරීමට රජය සතු ව්‍යවසායයන්ට මඟ පෙන්වීම ලබා දී ඇත. ස්ථාපිත කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන්හි දැනට පවතින බඳවා ගැනීමේ පරිපාටින්වල යෝග්‍යතාවය සමාලෝචනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගද ගනු ලැබේ.

පසුගිය මාස කිහිපය තුළ රජය සතු ව්‍යවසායයන්හි මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම ඇතුළු විවිධ සහායයන් රජය විසින් ලබා දී ඇත. ඒ අතරම, භාණ්ඩාගාරයේ අධීක්ෂණ යාන්ත්‍රණය නැවත නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අංක 02/2020 දරන 2020.10.26 දිනැති චක්‍රලේඛය මගින් රජය සතු ව්‍යවසායයන්ට බඳවා ගැනීම් සම්බන්ධයෙන් වඩා හොඳ නම්‍යතාවයක් සහ බඳවා ගැනීම් සම්බන්ධව තීරණ ගැනීමේ අයිතියක් රාජ්‍ය ව්‍යාපාරවලට පිරිනමා ඇත.

කොවිඩ්-19 වසංගතයෙන් අහිතකර බලපෑමක් ඇති වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති ණය සහන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී රජය සතු බැංකු විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද පහසුකම යටතේ, රජය සතු බැංකු එක්ව ගනුදෙනුකරුවන් ආසන්න වශයෙන් 27,553 ක් සඳහා රුපියල් බිලියන 46.7 ක සහන ණය ලබා දී ඇත. කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සම්බන්ධයෙන් රජයේ ක්‍රියාමාර්ග යට සහාය දැක්වීමේ දී ලංකා සතොස, රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව යන ආයතන විසින් විශේෂ කාර්යභාරයක් ඉටු කර ඇත.

### 3.2 රජය සතු ප්‍රධාන වාණිජමය ව්‍යාපාර පිළිබඳ සංක්ෂිප්ත සමාලෝචනය

**ලංකා බැංකුව**

අන්තර්ජාල බැංකුකරණයේ සහ ජංගම දුරකථන හරහා බැංකුකරණයේ ප්‍රබල ඩිජිටල් පැවැත්මක් සහිත ලංකා බැංකුව, රට වසාදමා තිබූ අවස්ථාවේදී තම ගනුදෙනුකරුවන්ට බැංකු ගනුදෙනු බාධාවකින් තොරව කරගෙන යාමේ පහසුකම සැලසීමට සමත් විය. කොවිඩ්-19 සහන පැකේජ හරහා 221,057 ක් පමණ වන ගනුදෙනුකරුවන් සඳහා ලංකා බැංකුව විසින් සහන ලබා දී ඇත.

2019 අවසන් වන විට රු. ට්‍රිලියන 2.4 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම, 2020 අගෝස්තු මස අවසන් වන විට රු. ට්‍රිලියන 2.8 ක් දක්වා සියයට 15 කින් වර්ධනය වී ඇත. 2020 අගෝස්තු මස අවසානය වන විට රු. ට්‍රිලියන 2.2 ක් වූ තැන්පතු ප්‍රමාණයක් කරා ළඟා වෙමින් රු. ට්‍රිලියන 2 ඉක්මවූ ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත් වීමට ලංකා බැංකුවට හැකි විය. 2020 මුල් මාස අට තුළ ලංකා බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 12.9 ක් වූ අතර, 2019 සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 18.1 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට එය සැලකිය යුතු පසුබෑමකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කොවිඩ්-19 සමයේ දී ලබාදුන් ණය සහන පළමු දිනයේම ගිණුම්ගත කිරීම මගින් සිදු වූ පාඩුව සහ තැන්පතුවල වර්ධනයට සමගාමීව පොලී වියදමෙහි සිදුවූ වැඩිවීමයි.

### මහජන බැංකුව

කොවිඩ්-19 වසංගතය මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර නගා සිටුවීම සඳහා මාස 6 ක කාලයක් සඳහා 20,213 ක් පමණ වන ව්‍යාපාරික ගනුදෙනුකරුවන් සඳහා රු. බිලියන 37 ක ණය සහන මහජන බැංකුව විසින් සපයා ඇත. මහජන බැංකුව විසින්, දේශීය ව්‍යවසායකයින් සහ කර්මාන්ත නංවාලීම සඳහා, මූල්‍යමය හා මූල්‍යමය නොවන පහසුකම් සැලසීමේ අරමුණෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව "Made in Sri Lanka" නමින් ණය ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

විවිධාංගීකරණය කරන ලද ණය ලබාදීම් මගින් ණය සැපයුම ප්‍රවර්ධනය කරගැනීම සහ බැංකුවේ දෙවන පෙළ ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සඳහා 2020 ජූලි මාසයේදී මහජන බැංකුව විසින් රුපියල් බිලියන 20 ක් වටිනා බාසල් III ස්ථර 2ට අනුකූල ලැයිස්තුගත නොකළ ශ්‍රේණිගත, ඇප රහිත, සහනදායී, නිදහස් කළ හැකි ණයකර සාර්ථකව නිකුත් කරන ලදී.

2020 පළමු මාස අට තුළ මහජන බැංකුවේ වත්කම් පදනම රු. ට්‍රිලියන 2 ක ඉක්මවූ අතර, රු. ට්‍රිලියන 2 කට වඩා වැඩි තැන්පතු පදනමක් සහිත මෙරට දෙවන බලපත්‍රලාභී වාණිජ බැංකුව බවට එම බැංකුව පත්විය. 2019 අවසන් වන විට රු. ට්‍රිලියන 1.5 ක් වූ මහජන බැංකුවේ තැන්පතු පදනම, 2020 අගෝස්තු මස අවසන් වන විට රු. ට්‍රිලියන 1.7 ක් දක්වා සියයට 11.3 කින් වර්ධනය වී ඇත. 2020 මුල් මාස අට තුළ බැංකුවේ ණය කළඹ රු. ට්‍රිලියන 1.7 ක් දක්වා සියයට 22.1 කින් ඉහළ ගොස් ඇත. 2019 සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 13.3 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ මහජන බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 6.3 ක් වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ හානිකරණ පිරිවැය සියයට 89 කින් වැඩිවීමයි.

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව

රටේ විශාලතම ඉතිරිකිරීමේ බැංකුව වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2020 අගෝස්තු මස අවසන් වන විට සිය ශාඛා ජාලය 258 දක්වා ශාඛා 2 කින් පුළුල් කර ගෙන ඇත. තවද, රට පුරා විහිදී පවතින තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල 4,692 ක මෙහෙයුම් ජාලයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුය.

ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල ආයෝජන වර්ධනය වීම හේතුවෙන් 2019 දෙසැම්බර් මස අවසානය වන විට රු. ට්‍රිලියන 1.2 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම, 2020 අගෝස්තු මස අවසන් වන විට රු. ට්‍රිලියන 1.3 ක් දක්වා සියයට 8.1 කින් වර්ධනය වී ඇත. මෙම වත්කම් වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ මුළු වත්කම්වලින් සියයට 91.3 ක ප්‍රමාණයක් වූ පාරිභෝගික තැන්පතු මගින් වන අතර 2019 අවසන් වන විට රු. බිලියන 1,016 ක් ලෙස පැවති පාරිභෝගික තැන්පතු 2020 මුල් මාස 08 තුළදී රු. බිලියන 1,156 ක් දක්වා සියයට 13.8 කින් වර්ධනය වීමයි. 2019 අවසන් වන විට රු. බිලියන 454 ක් ලෙස පැවති ණය හා අත්තිකාරම් 2020 පළමු මාස අට තුළ රු. බිලියන 466 ක් දක්වා සියයට 2.6 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කරයි. පසුගිය වසරේ සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 6.1 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2020 මුල් මාස අට තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 5.4 ක් දක්වා සියයට 13 කින් අඩුවී ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කොවිඩ්-19 වසංගතය මගින් සිදු කළ පොලී මත ඇති වූ අලාභ සහ හානිකරණ පිරිවැයවල සිදු වූ ඉහළ යාමයි.

### ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ 2020 අගෝස්තු මස අවසන් වන විට පසුගිය වසරේ අනුරූපී කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. මිලියන 162,033 ක් වූ ආදායම සියයට 2.3 කින් රු. මිලියන 158,295 ක් දක්වා පහළ ගොස් ඇති අතර රට වසා දැමූ කාල සීමාව තුළ කර්මාන්ත, පොදු අවශ්‍යතා සහ හෝටල් ක්ෂේත්‍රය සඳහා වූ ඉල්ලුම අඩු වීම මේ සඳහා මූලිකවම හේතු වී ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී සෘජු විදුලි උත්පාදන වියදම 2019 වසරේ අනුරූපි කාල සීමාව තුළ වාර්තා වූ රු. මිලියන 162,089 ට සාපේක්ෂව රු. මිලියන 125,334ක් දක්වා සියයට 22.7 කින් පහළගොස් ඇත. ඒ අනුව, ජලය: තාප (ඉන්ධන): තාප (ගල් අඟුරු): පුනර්ජනනීය බලශක්ති හා සුළඟ යන විදුලි උත්පාදන මිශ්‍රණය 2019 වසරේ අනුරූපී කාල සීමාව තුළ දී වාර්තා කළ 17:37:38:9 යන අනුපාතයට සාපේක්ෂව 2020 මුල් මාස අට තුළ 22:28:41:9 ලෙස හිතකර පරිදි වෙනස්වීම, 2019 වසරේ අනුරූපී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ විදුලි ඒකකයක් සඳහා වන වියදම කිලෝ වොට් පැයක් සඳහා රු. 23.61 ට සාපේක්ෂව 2020 වසරේ මුල් මාස අට තුළ දී කිලෝ වොට් පැයක් සඳහා රු. 20.63 ක් ලෙස පහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ අනුරූපී කාල සීමාව තුළ වාර්තා කළ රු. මිලියන 63,755 ක අලාභයට සාපේක්ෂව සමාලෝචිත කාලය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු. මිලියන 31,724 ක් දක්වා සියයට 50.2 කින් පමණ අඩු වී ඇත.

වගුව 3.1 : විදුලිබල උත්පාදන සංයුතිය සහ ධාරිතාවය

| | 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා (ඇස්තමේන්තුගත) | | |
|---|---|---|---|
| | | විදුලි උත්පාදනය | |
| | ස්ථාපිත ධාරිතාවය මෙ.වො. | සමස්ත උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස | ගි.වො. පැය |
| ජලවිදුලිය | 1,399 | 22% | 2,334 |
| තාප විදුලිය - ලංවිම (ඉන්ධන) | 654 | 10% | 1,069 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් - (ඉන්ධන) | 704 | 18% | 1,962 |
| තාපවිදුලිය - (ගල්අඟුරු) | 900 | 41% | 4,381 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති - සුළං සහ අනෙකුත් | 659 | 9% | 1,060 |
| **එකතුව** | **4,316** | **100%** | **10,806** |

*මූලාශ්‍ර : ලංකා විදුලිබල මණ්ඩලය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මගින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන් මූල්‍යමය සහනය (රු. බිලියන 48) හේතුවෙන් 2019 අනුරූපී කාල සීමාවට සාපේක්ෂව සමාලෝචිත කාල සීමාව තුළ දී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ස්වාධින විදුලිබල නිෂ්පාදකයන් හට ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරනු ලැබූ ගෙවීම් සියයට 41.2 කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, මෙම කාල සීමාව තුළ විදුලි බිල්පත් එකතු කිරීම සැලකිය යුතු ලෙස ප්‍රමාදයන් ඇතිවීම නිසා 2020 අගෝස්තු මස අවසන් වන විට බැංකු වෙත ගෙවීමට තිබූ ශේෂය 2019 වසරේ දෙසැම්බර් මස අවසන් වන විට පැවති රු. මිලියන 89,420 (ව්‍යාපෘති ණය හැර) ක ශේෂය 2020 පළමු මාස 08 අවසන් වන විට රු. මිලියන 103,792 කින් වර්ධනය වී ඇත.

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ විකුණුම් පරිමාව 2019 වසරේ අනුරූපී කාල පරිච්ඡේදයේ ලීටර් මිලියන 4,211 සමඟ සැසඳීමේ දී 2020 මුල් මාස අට තුළ ලීටර් මිලියන 3,367 දක්වා සියයට 20කින් පමණ පහත වැටී ඇත. එමෙන්ම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම රු. බිලියන 96 කින් පමණ අඩු වී ඇති අතර, විකුණුම් පිරිවැය රු. බිලියන 311 ක් දක්වා සියයට 22 කින් ද 2020 මුල් මාස 08 තුළ පහත ගොස් ඇත. මෙම සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට හැකි වුවද, සමස්ත කාර්යසාධනය, විනිමය අනුපාත උච්චාවචනය හා සබැදි විනිමය අනුපාත විචලනය සමඟ දැඩි සම්බන්ධතාවක් ඇති හෙයින්, 2020 වසරේ පළමු මාස අට තුළ දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත අලාභය රු.බිලියන 4.4 ක් විය.

බොරතෙල් බැරලයක පිරිවැය ඇමරිකානු ඩොලර් 43 ට වඩා අඩු මට්ටමක පැවති හෙයින්, 2020 මුල් මාස අට තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ආනයන වියදම ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1,126 ක් දක්වා පහත වැටී ඇත. රජය විසින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල ස්ථාපිත කිරීමත් සමඟ දේශීය වෙළෙඳපොළෙහි ඛනිජතෙල් නිෂ්පාදනයන් සඳහා ස්ථාවර මිලක් මට්ටමක් පවත්වා ගැනීම සඳහා ලෝක වෙළෙඳපොලේ ඉදිරියේදී ඇති විය හැකි ඉන්ධන මිල උච්චාවචනයන් මෙම අරමුදල මගින් අවශෝෂණය කිරීමට අපේක්ෂිතය.

කෙසේවෙතත්, දිගුකාලීනව පිරිවැය ආවරණ මිලකරණ ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන්, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සමුච්චිත අලාභය 2020 අගෝස්තු මස අවසන් වනවිට රු. බිලියන 341.6 ක් දක්වා ළඟා වී ආයතනයේ මෙහෙයුම්වලට හා ශේෂ පත්‍රයට දැඩි ලෙස බලපෑමක් ඇති කර ඇත. 2020 අගෝස්තු මස අවසානයේ වෙළෙඳ ණය ගැතියන් රු. බිලියන 159 කි. කෙසේවුවද, ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මගින් අරමුදල් ලබා දීම හේතුවෙන් රාජ්‍ය බැංකු සඳහා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් 2019 දෙසැම්බර් අග වන විට ගෙවීමට පැවති රු. බිලියන 566 ක ණය ප්‍රමාණය 2020 අගෝස්තු මස අවසන් වන විට රු. බිලියන 519 ක් දක්වා අඩු වී ඇත.

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2020 අවසන් වන විට ඉලක්කගත කර ඇති නල ජල ආවරණය, ආරක්ෂිත ජල සැපයුම් ආවරණය සහ මලාපවහන නල ආවරණය වන සියයට 52.1, සියයට 92.2 සහ සියයට 2.07 මේ වන විටත්

පිළිවෙළින් සියයට 60 ක් සියයට 91.7 ක් හා සියයට 3.3 ක මට්ටමක් වාර්තා කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පෙර වසරේ මුල් මාස 08 තුළ වාර්තා කළ රු. මිලියන 16,084 ක ආදායම 2020 වසරේ පළමු මාස 08 තුළ රු. මිලියන 16,824 ක් ලෙස වාර්තා කෙරේ. විකුණුම් පිරිවැය ආන්තිකව පහත වැටීම හේතු කොට ගෙන රු. මිලියන 7,693 ක දළ ලාභයක් වාර්තා කිරීමට මණ්ඩලයට හැකි වී ඇති අතර එය පෙර වසරේ අනුරූපී කාල සීමාව තුළ වාර්තා කළ අගයට වඩා සියයට 10.8 කින් ඉහළ යාමකි. මේ බව 2019 වසරේ අනුරූපී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. මිලියන 512 ක මෙහෙයුම් අලාභයට රු. මිලියන 179 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීම තුළින් ගම්‍ය වේ.

2020 මුල් මාස හත තුළ දී සපයන ලද සම්බන්ධතා සංඛ්‍යාව සියයට 4 ක වර්ධනයක් සහිතව මිලියන 2.48 ක් දක්වා වර්ධනය කර ගැනීමට මණ්ඩල සමත්ව ඇත. කෙසේ වුවද, එම මාස 07 ක කාල පරිච්ඡේදය තුළ ආදායම් නොලබන ජල ප්‍රතිශතයද සියයට 0.7 ක වර්ධනයක් සහිතව සියයට 24.91 ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද, නාගරික ජල ව්‍යාපෘතිවලින් සියයට 50 ක්, ග්‍රාමීය ජල ව්‍යාපෘතිවලින් සියයට 75 ක් සහ වකුගඩු නිදන්ගත රෝග අවමකිරීමේ ව්‍යාපෘතිවලින් සියයට සියයක් ආවරණය කිරීම සඳහා වූ එකඟ වූ මූල්‍යමය බැඳීම් ඉටු කිරීම සඳහා මෙම වසරේ මේ දක්වා මහා භාණ්ඩාගාරය විසින් රුපියල මිලියන 2,027 ක දායකත්වයක් ලබා දී ඇත.

**වගුව 3.2 : රජය සතු ව්‍යවසායයන්හි ලාභදායීත්වය**

රු. මිලියන

| | ආයතනය | 2018 | 2019(අ) | ලාභය/අලාභය 31.08.2020(අ) දිනට |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 33,416 | 29,685 | 12,881 |
| 2 | මහජන බැංකුව | 24,406 | 19,666 | 6,343 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැකුව | 7,941 | 10,462 | 5,449 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 480 | 465 | 189 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 629 | 774 | -788 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 2,103 | 1,344 | -575 |
| 7 | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 18,292 | 20,570 | 21,344 |
| 8 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 13,399 | 18,976 | 3,601 |
| 9 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 3,289 | 3,009 | 6,204 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 419 | 277 | 167 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 612 | 411 | -158 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -30,458 | -85,411 | -31,724 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | -106,143 | -11,835 | -4,417 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 7,534 | 15,777 | 7,483 |
| 15 | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | -517 | -1,177 | 179 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 10,458 | 15,222 | -688 |
| 17 | සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගම | -17,214 | -44,023 | -36,387 |
| 18 | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | 1,295 | 1,556 | -1,175 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,337 | -954 | -598 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 531 | 340 | -93 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 18 | 11 | -264 |
| 22 | සීමාසහිත මිල්කෝ පුද්ගලික සමාගම | -606 | -619 | -56.7* |

වගුව 3.2 : රජය සතු ව්‍යවසායයන්හි ලාභදායීත්වය *(සම්බන්ධිතයි...)*

රු. මිලියන

| | ආයතනය | 2018 | 2019(අ) | ලාභය/අලාභය 31.08.2020(අ) දිනට |
|---|---|---|---|---|
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | -589 | -510 | -69* |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -76 | -239 | -112 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -320 | -452 | -250 |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 211 | 120 | 161 |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | -35 | 89 | 178 |
| 28 | සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව | -7 | -53 | -1 |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 18 | 43 | -18.8* |
| 30 | සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 621 | 2,271 | -296 |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 16 | 28 | 29 |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 24 | 31 | -1 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,735 | 2,897 | 1,711 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,038 | 1,323 | 866 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 360 | 592 | 838 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 33 | 3 | -5 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 1,685 | 2,176 | 675 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 123 | -94 | 54 |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -622 | -597 | -420 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 190 | -467 | -330 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -20 | -29 | -12 |
| 42 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 22 | 123 | -68 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 422 | 317 | -119 |
| 44 | සීමාසහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | 88 | -29 | -34 |
| 45 | සීමාසහිත ලංකා සතොස | -2,250 | -1,781 | -1,021 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -406 | -169 | -82 |
| 47 | ලංකා ධීවර සංස්ථාව | 17 | -28 | -40* |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | 3 | 20 | -65* |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 39 | 120 | 31 |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 290 | 306 | 44 |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවෙලොපර්ස් ලංකා සමාගම | -126 | -361 | -15 |
| 52 | ලංකා සීනි සමාගම | 144 | -1,308 | 1,007 |
| | **එකතුව** | **-27,825** | **-1,132** | **-10,447.6** |

*මූලාශ්‍ර : රජය සතු වාණිජ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

* 31.07.2020 දිනට ලාභදායීත්වය

(අ) කෙටුම්පත්

### වගුව 3.3 : රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම

රු. මිලියන

| ආයතනය | 2016 | 2017 | 2018 | 2019 | 31.08.2020 දිනට |
|---|---|---|---|---|---|
| **අයබදු** | **92,338** | **50,447** | **37,230** | **22,833** | **5,081** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 12,026 | 3,865 | 500 | 2,000 | 1,000 |
| ලංකා බැංකුව | 18,000 | 12,000 | 4,500 | - | - |
| මහජන බැංකුව | 8,000 | 5,000 | 3,200 | 2,200 | 1,500 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ හා නියාමන කොමිෂන් සභාව | 28,000 | 22,800 | 21,850 | 8,950 | 2,000 |
| ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 10,000 | - | - | - | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 10 | 25 | - | - | - |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 88 | - | - | 169 | - |
| රාජ්‍ය දැව සංස්ථාව | 175 | 100 | 100 | 50 | - |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 65 | 45 | z 50 | - | - |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 2,500 | 2,100 | 2,750 | 3,268 | 500 |
| භූ විද්‍යා හා පතල් කාර්යාංශය | 900 | 1,500 | 1,700 | 2,300 | |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 175 | 100 | 25 | 25 | - |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | - | - | | | - |
| ලංකා විදුලිබල මණ්ඩලය | 8,000 | - | - | - | - |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 115 | 220 | 250 | 250 | - |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 550 | - | - | - | - |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | - | - | - | 52 | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 25 | - | 15 | 15 | - |
| මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය | 25 | 25 | 25 | 25 | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශය | 1,500 | 1,000 | 1,000 | 500 | - |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 768 | 800 | 800 | 800 | - |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 216 | 222 | - | - | - |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 200 | 160 | 165 | 200 | - |
| ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය | 1,000 | 185 | 200 | 650 | - |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | - | 300 | 100 | 50 | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | - | - | - | 200 | - |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ අධිකාරිය | - | - | - | 200 | - |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - | - | - | 900 | - |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | - | - | - | 29 | 81 |
| **අයබදු** | **15,821** | **3,550** | **4,598** | **5,024** | **2,407** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 60 | 60 | 60 |
| ලංකා බැංකුව | 346 | 346 | 346 | 346 | 346 |
| මහජන බැංකුව | 316 | 316 | 316 | 316 | 316 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 36 | 41 | 41 | - | - |
| ජාතික සංවර්ධන බැංකුව | 2 | 2 | 1 | 1 | 1 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | - | - | 86 | - | - |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 11,857 | 503 | 1,856 | 1,720 | 695 |
| ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 1,500 | 850 | 300 | 500 | - |

වගුව 3.3 : රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද අයහාර/ලාභාංශ ආදායම *(සම්බන්ධිතයි...)*

රු. මිලියන

| ආයතනය | 2016 | 2017 | 2018 | 2019 | 31.08.2020 දිනට |
|---|---|---|---|---|---|
| ලංකා ඛණිජ වැලි සමාගම | - | - | 35 | 130 | - |
| ලංකා පොස්පේට් සමාගම | - | 8 | 5 | 7 | - |
| ස්වාධීන රූපවාහිනී ජාලය | - | 10 | 12 | - | - |
| ලංකා ලේලන්ඩ් සමාගම | 34 | 35 | 45 | 13 | 2 |
| රක්නා ආරක්ෂක ලංකා සමාගම | - | - | 40 | 37 | - |
| ලංකා පොහොර සමාගම | 116 | 90 | 21 | 15 | - |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 25 | 12 | 20 | 10 | - |
| පරන්තන් කෙමිකල්ස් සමාගම | - | 8 | 11 | - | 10 |
| එස්.ටී.සී ජෙනරල් ට්‍රේඩින් සමාගම | 5 | - | - | - | - |
| ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 795 | 795 | 795 | 947 | 947 |
| ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 62 | 79 | 106 | 133 | - |
| ලංකා විදුලි පුද්ගලික සමාගම | 152 | 218 | 305 | 500 | - |
| ලංකා කර්මාන්ත වතු සමාගම | 47 | 55 | 78 | 82 | - |
| නිපුණතා සංවර්ධන අරමුදල | - | - | - | - | - |
| සිලෝන් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් | 12 | 12 | 19 | 23 | 30 |
| ලංකා ලොජිස්ටික්ස් ලිමිටඩ් | 5 | - | 1 | - | - |
| ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම | 438 | - | - | - | - |
| වැවිලි සමාගම් | 10 | 103 | 95 | 172 | - |
| වෙනත් | 3 | 7 | 4 | 12 | - |
| **එකතුව** | **108,159** | **53,997** | **41,828** | **27,857** | **7,488** |

*මූලාශ්‍ර : රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 04

# 2020-21 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක

## 2020-21 අයවැය ඇස්තමේන්තු සැකසීම සඳහා පදනම් වූ සාධක

2020-21 අයවැයෙහි සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය ඇස්තමේන්තු, අයවැය සකස්කරන අවස්ථාවේ පවත්නා උපකල්පන, විශ්ලේෂණ සහ කාර්ය මණ්ඩල විනිශ්චයන් මාලාවක් මත පදනම් වී ඇත. මෙමගින් දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය, විදේශ අංශයේ වර්ධනයන් හා සේවා වියුක්තිය වැනි සාර්ව ආර්ථික දර්ශකවල සහ ඇස්තමේන්තු වල සංවේදීතාව මෙන්ම ආදායම සහ වියදම් ඇස්තමේන්තු සඳහා භාවිතා කරන උපකල්පන වල විස්තර ද සපයනු ලබයි.

### දළ දේශීය නිෂ්පාදිතය

ලෝක ආර්ථිකයෙහි සිදු වූ පෙර නොවූ විරූ කඩා වැටීම හා එහි පසු බලපෑම් හේතුවෙන් දේශීය ආර්ථිකයට වූ බලපෑම සමගින් කොවිඩ්-19 වසංගතයෙන් ආර්ථික හා සමාජ ක්‍රියාකාරකම් කෙරෙහි ඇති කළ බලපෑම සමඟම 2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය මන්දග ාමී වී ඇත. තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයේ (ද. දේ. නි) වර්ධනය 2021 වසරේ දී සියයට 5.0 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2020 වසරේ දී වර්ධනය මන්දගාමී වුවද, සාර්ව ආර්ථික මූලධර්ම සහ රටේ දේශපාලන ස්ථාවරත්වය යථා තත්ත්වයට පත්වීමක් ඇති හෙයින් 2021 වසරේ දී ආර්ථිකය යළි වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. බදු ක්‍රමය සරල කිරීමත් සමඟ 2020 වසරේ දී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති සහනයන් හේතුවෙන් 2021 වසරේ දී සියයට 5.0 ක ආර්ථික වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මේ සඳහා තවදුරටත් සහාය වනු ඇති අතර, පාරිභෝගික මිල උද්ධමනය 2020-21 දී ඉලක්කගත සීමාවන් තුළ පවතිනු ඇත. 2021 වසරේ සිට කොළඹ වරාය නගරය, හම්බන්තොට කාර්මික කලාප ව්‍යාපෘතිය සහ එරාවූර් රෙදිපිළි උද්‍යානය ඇතුළු අනෙකුත් මහා පරිමාණ ව්‍යාපෘති සඳහා සෘජු විදේශ ආයෝජන ඉහළයාමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ ගෝලීය විශ්වාසය යළිත් වරක් තහවුරු වනු ඇත. ලෝක බැංකුවේ ව්‍යාපාර පහසු කිරීමේ 2021 වාර්තාවට අනුව, 2020 වසරේ දී ශ්‍රී ලංකාව ආර්ථිකය ශ්‍රේණිගත කිරීම්වල … වන ස්ථානය දක්වා ඉහළ ගොස් ඇති අතර ආර්ථිකය පිළිබඳ ගෝලීය විශ්වාසය ඉන් පිළිබිඹු කෙරේ. 2020-21 ඉදිරි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ ප්‍රතිපත්තිමය නිශ්චිතතාවය සහ දේශපාලන ස්ථාවරත්වය හේතුවෙන් දකුණු ආසියාවේ සහ ආසියානු කලාපයේ වැදගත් ස්ථානයක් ශ්‍රී ලංකාවට යළි හිමිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම් අංශයෙන් බලන කළ, පෞද්ගලික හා රජයේ අවසාන පරිභෝජන වියදම්, ශුද්ධ අපනයනය සහ දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 2021 වසරේ දී වැඩිවනු ඇතැයි අපේක්ෂිතය.

කෘෂිකාර්මික නිෂ්පාදන/ අපනයන යථා තත්ත්වයට පත් කිරීමට පැහැදිලි මඟ පෙන්වීම් සහිත ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සහ හිතකර කාලගුණික තත්ත්වයන් සමඟ කෘෂිකාර්මික අංශය එහි වර්ධන වේගය නැවත ලබා ගැනීමට බලාපොරොත්තු වේ. සෙසු ප්‍රධාන අංශ අතර නිෂ්පාදන කර්මාන්තයේ සහ ඉදිකිරීම් අංශයේ ඇති විය හැකි වර්ධනය පිළිබිඹු කරමින් කර්මාන්ත අංශය ද මැත හා මධ්‍යකාලීනව නව මාවතක ප්‍රවේශ වනු ඇත. දළ දේශීය නිෂ්පාදිතයට ඉහළ දායකත්වයක් සපයන සේවා අංශය ද තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ප්‍රවාහන, මූල්‍ය සේවා සහ දේපල වෙළෙඳාම් අංශයේ ධනාත්මක දායකත්වය ද සමගින් තවදුරටත් පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා අංශයෙහි පුළුල්වීම සඳහා රටෙහි අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශ උත්ප්‍රේරකයක් ලෙස කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### පාරිභෝගික මිල

වෙළෙඳපොළ නියාමනය මගින් සුලභතාවය සහ මධ්‍යස්ථ මිල තහවුරු කරමින්, දේශීය නිෂ්පාදන දිරිගැන්වීම, ආනයන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බදු, අවම සහ උපරිම මිල සීමා, සහතික කළ මිල සහ ආනයන සීමා කිරීම් ඇතුළුව වෙළඳ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ස්ථාවර කිරීමට රජය විසින් කඩිනම් පියවර ගෙන ඇත. මධ්‍යකාලීනව ඛනිජ තෙල් මිල ස්ථාවරව පවත්වාගැනීම සඳහා රජය විසින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල (FPSF) ක්‍රියාත්මක කරන ලදී. මෙම වර්ධනයන් ද සමඟ මුදල් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන්, උද්ධමනය 2021 වසරේ දී සියයට 4-6 ක් පමණ වන මධ්‍ය තනි අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මධ්‍යකාලීනව රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් වීම තුළින්, දේශීය සැපයුම් හා බෙදාහැරීමේ ජාලය ඉහල නැංවීම සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් ඉලක්කගත රාමුව තුළ උද්ධමනය පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

කාන්තාවන් සහ තරුණයින් වෙනුවෙන් රැකියා අවස්ථා සුලභ කිරීම සහ අධ්‍යාපනය මට්ටම් හා සේවා නියුක්ති මට්ටම අතර නොගැලපීම අඩු කිරීම සමඟ 2021 වසරේ දී සේවා වියුක්තිය සියයට 4.0 දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ. එමගින් වඩා හොඳ සේවා නියුක්තීන් සඳහා අධ්‍යාපනය පරිවර්තනය කිරීම, සෘජු විදේශ ආයෝජන රඳවා ගැනීම සහ නුපුහුණු ශ්‍රම සංක්‍රමණය අඩු කරන අතරම පුහුණු සංක්‍රමණ ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් 2021 සිට 2030 දක්වා "නිපුණතා සංවර්ධන දශකය" ලෙස ප්‍රකාශයට පත් කර ඇත. කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමග රටෙහි මාර්ගගත පද්ධති භාවිතය වැඩිවීම තුළින් අධ්‍යාපනයේ සහ සේවා නියුක්තියේ අනාගත පුළුල්වීම් වර්ධනයට හේතුවනු ඇත. ක්‍රියාකාරී ශ්‍රම බලකායට කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රධාන සාධකයක් වනු ඇත. එබැවින්, ළමා රැකවරණය සහ වෘත්තීය පුහුණුව ඇතුළු අනෙකුත් පහසුකම් සඳහා ප්‍රවේශයන් වැඩිදියුණු කෙරේ.

### විදේශ අංශය

ආනයන සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් අපනයන ඉහළයාම හේතුවෙන් ශ්‍රී ලංකාවෙහි විදේශ අංශය 2021 වසරේ දී වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් වෙළඳ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ දී ප්‍රවාහන සේවා

සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ ක්‍රියාකාරකම් පුළුල් වනු ඇත. ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීමත් සමඟ සංචාරක සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ යථා තත්ත්වයට පත් වනු ඇති බැවින් ජංගම ගිණුමෙහි හිඟය මධ්‍යකාලීනව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කිරීමත් සමඟ විදේශීය ආයෝජන ගලා ඒම යළිත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2020-21 කාලපරිච්ඡේදය තුළ ස්ථාවර විනිමය අනුපාතයන් අපේක්ෂා කෙරේ.

**මුදල් සමස්තයන්**

2021 වසරේ දී අපේක්ෂිත නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට අනුකූල වන පරිදි මුදල් සැපයුම පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය වැඩිදියුණු කිරීමත් සමඟම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තුළින් පෞද්ගලික අංශයේ භාවිතයට වෙළෙඳපොළට වැඩි සම්පත් ප්‍රමාණයක් එක් කෙරෙනු ඇත. එමගින් 2021 වසරේ දී අපේක්ෂිත ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇත.

**ආදායම**

ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කළ උපකල්පන ඇමුණුම III හි දක්වා ඇත.

**වියදම්**

වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට යොදාගත් උපකල්පන පහත සඳහන් වේ :

- රාජ්‍ය සේවයේ මිලියන 1.3 ක පමණ සේවක පිරිසක් සිටින අතර, ඔවුන්ට වාර්ෂිකව හිමිවන අනුමත වැටුප් වර්ධක හේතුවෙන් සිදුවන වාර්ෂික නාමික වැටුප් වැඩිවීම මත වැටුප් සහ වේතන වියදම පදනම් වී ඇත.
- 2020 සහ 2021 වසරේ පිළිවෙළින් විශ්‍රාම යාමට නියමිත විශ්‍රාමිකයින් 25,000 සහ 28,000 කගේ ආංශික බලපෑම සමඟ විශ්‍රාම වැටුප් ගෙවීම් ලබන විශ්‍රාමිකයින් සංඛ්‍යාව 659,000 ක් වනු ඇතැයි උපකල්පනය කර ඇත.
- අපේක්ෂිත උද්ධමනය පහත වැටීම හේතුවෙන් 2020 වසරේ දී අපේක්ෂිත දේශීය පොලී අනුපාතවලට අනුව පොලී ගෙවීම්වල සුළු පහළයාමක් සිදුවනු ඇත.
- මධ්‍යකාලීන අයවැය ඉලක්කයන් ළඟා කර ගැනීමට, උපයෝගිතා සේවා සහ සැපයුම් මත වන වියදම දැඩිව කළමනාකරණය කෙරේ.
- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ලබා දෙන මුදල් ප්‍රදානයට අමතරව පාසල් ළමුන් සහ ආබාධිත සෙබළුන් සඳහා ආධාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් කුටුම්භ සඳහා වන සහනාධාර අඛණ්ඩව ලබා දෙනු ඇත. කෘෂිකාර්මික ආධාර වැඩසටහන් සමඟ නොමිලේ ඖෂධ, දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන් අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණ සහ සුභසාධන යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
- සියළුම අංශ සඳහා තොරතුරු තාක්ෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.
- රාජ්‍ය ආයතන සහ සංස්ථා වෙත සිදුකරන පැවරුම් අපේක්ෂිත මට්ටමින් පවත්වා ගෙන යනු ලබන අතර, ඒවායේ කාර්යසාධනයෙහි ඉහළ දියුණුවක් අපේක්ෂා කෙරේ.
- ආර්ථික කටයුතු තුළ දී පෞද්ගලික අංශය උත්තේජනය කරන අතරම ප්‍රවාහන, ජල සැපයුම, අධ්‍යාපනය, සෞඛ්‍යය හා වෘත්තීය පුහුණු වැනි ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන මධ්‍යකාලීනව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4-6 අතර පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.
- රාජ්‍ය වියදම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ඵලදායී නොවන වියදම් සීමා කිරීම සඳහා දරන උත්සාහයන් ශක්තිමත් කරනු ඇත.
- සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී අයවැය ප්‍රතිපාදන උපයෝජනයේ සුමට ක්‍රියාකාරිත්වයට සහ ද්විකරණය වැළැක්වීමට විමධ්‍යගත ආයතන සහ රේඛීය අමාත්‍යාංශ සමඟ මනා අධීක්ෂණයකින් සහ සමීප සම්බන්ධතාවයකින් කටයුතු කෙරේ. රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම සඳහා මනාව කැප වූ පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කෙරේ.
- ක්‍රියාවලිය, සේවා සැපයීම සහ නීතියේ ආධිපත්‍යය අනුව ආයතනික සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත.

**ණය ගැනීම්**

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී සියයට 95.1 දක්වා ඉහළ නැගුණු රාජ්‍ය ණය, 2021 වසරේ දී සියයට 96.3 දක්වා තවදුරටත් ඉහළ යනු ඇත. මෙම ණය ප්‍රමාණය මධ්‍යකාලීනව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 75 දක්වා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස අඛණ්ඩව පහත හෙළීම තහවුරු කිරීම සඳහා දේශීය සහ විදේශීය ණයගැනීම්වල නිසි සංයෝජනයක් පවත්වාගෙන යනු ඇත. රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ක් දක්වා පුළුල් කිරීම, අයවැය වියදම් ලෙස සීමා කිරීම සහ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම යන ඉලක්ක සැපිරීමෙන් ණය අවම කිරීම සිදුකෙරේ. රජයේ මූල්‍ය අවශ්‍යතා අවම පිරිවැයකින් සපුරාලීම සහතික කිරීම සඳහා ණය කළමනාකරණයට අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත.

**ඇස්තමේන්තු වල සංවේදීතාවය**

ආර්ථික පුරෝකථන පහත සඳහන් අභියෝග මත සංවේදී වනු ඇත.

- වසර 2021 දී ගෝලීය ආර්ථිකය අපේක්ෂා වූවාට පෙර ඉතා ඉක්මනින් යථා තත්ත්වයට පත්වීමෙන් ජාත්‍යන්තර වශයෙන් ඛනිජ තෙල් සහ අනෙකුත් භාණ්ඩ වල මිල ගණන් වැඩි වූයේ නම්, ආනයන පිරිවැය, දේශීය පාරිභෝගික මිල ගණන්, නිෂ්පාදන පිරිවැය මෙන්ම අයවැය වියදම් කෙරෙහි ද අහිතකර ලෙස බලපානු ඇති නමුත්, ඒ හේතුවෙන් ඇති වන අපනයන වැඩිවීම වැනි හිතකර ප්‍රතිඵල.
- කොවිඩ්-19 වසංගතය පැතිර යාම හෝ වෙනත් සෞඛ්‍ය අවදානම්.
- දේශීය නිෂ්පාදනය, ජාත්‍යන්තර වෙළඳාම, දේශීය මිල සහ සමස්ත වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බාහිර කම්පන සඳහා ගැලපුම් පිරිවැය.
- ස්වභාවික විපත් සහ ඇතිවිය හැකි ජාත්‍යන්තර භූ-දේශපාලන අවිනිශ්චිතතාවයන් හා සම්බන්ධ අවදානම්.
- කෘෂිකර්මය, ජල විදුලිබල උත්පාදනය හා රාජ්‍ය අයවැය මත ඇතිවන අහිතකර බලපෑම් ඇති කළ හැකි අහිතකර කාලගුණික තත්ත්වයන්.
- පරිපාලනමය සහ ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධව අවහිරතාවයන්.
- මධ්‍යකාලීනව අපේක්ෂා කරන පරිවර්තනයන් සිදුකිරීමට පවතින සීමිත හැකියාව හේතුවෙන් විදේශ අරමුදල් මගින් සිදුකෙරෙන විශාල ව්‍යාපෘතිවලට සහ එමගින් ආයෝජන මට්ටම සහ ආර්ථික වර්ධනය කෙරෙහි ඇතිවන බලපෑම්.
- රාජ්‍ය මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවදානම්.
- ගෝලීය අසමතුලිතතාවයන් පහතවැටීම හේතුවෙන් අපේක්ෂිත ගෝලීය ආර්ථික වර්ධනයට වඩා අඩු අගයක් ගන්නා අතර එමගින් ශ්‍රී ලාංකික භාණ්ඩ හා සේවා සඳහා වන විදේශීය ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇති අතරම, එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී වීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් වල උච්චාවචනයන් සාර්ව ආර්ථික ස්ථායිතාව සහ වර්ධනයේ අපේක්ෂිත ඉලක්ක කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අතර, එමගින් රජයේ වියදම් හා ආදායම් කෙරෙහි ද ඇතිවන බලපෑම්.
- රාජ්‍ය අංශයේ සේවකයින්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් ආශ්‍රිත පුනරාවර්තන වියදම් වැඩිවීමේ ප්‍රවණතාවයන්.
- දුර්වල කාර්යසාධනයක් පිළිබිඹු කරන රජය සතු වාණිජ ව්‍යවසායයන්.

**භාණ්ඩාගාරය විසින් නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව - සැප්තැම්බර් 2020**

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 1 | මහජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 19,957.74 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 171,097.09 | |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 13,554.40 | |
| | | ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම | 11,000.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 3,410.59 | |
| | | වී අලෙවි මණ්ඩලය | 2,846.71 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 40,157.88 | |
| | | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 1,350.00 | |
| | | සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවය | 9,434.83 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම | 100.00 | |
| | | සීමාසහිත ලංකා සතොස | 1,000.00 | 273,909.23 |
| 2 | ලංකා බැංකුව | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 500.00 | |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 5,000.00 | |
| | | ලංකා ධීවර සංස්ථාව | 100.00 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 169,641.00 | |
| | | සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම | 30.00 | |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 835.00 | |
| | | ජනතා වතු සංවර්ධන මණ්ඩළය | 140.00 | |
| | | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකරණ ආයතනය | 8,600.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 58,299.96 | |
| | | නෝර්ත්සී ලිමිටඩ් | 80.00 | |
| | | වී අලෙවි මණ්ඩලය | 8,572.95 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 116,480.30 | |
| | | සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සේවය | 7,068.38 | |
| | | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | 1,000.00 | |
| | | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 200.00 | |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,400.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,189.88 | 381,137.47 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 5,000.00 | |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 35,201.41 | |
| | | සීමාසහිත ලක්ධනවි සමාගම | 2,992.00 | |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 16,239.48 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 68,621.43 | |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන සංස්ථාව | 3,500.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 | 134,324.31 |
| 4 | කොමර්ෂල් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1,929.61 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 5,948.81 | 7,878.42 |
| 5 | ඩී.එෆ්.සී.සී. බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,026.24 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 6,105.85 | 12,132.09 |
| 6 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | සීමාසහිත ලක්ධනවි සමාගම | 2,992.00 | 2,992.00 |
| 7 | චීනයේ එක්සිම් බැංකුව | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 16,710.58 | 16,710.58 |
| 8 | හැටන් නැෂනල් බැංකුව | සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 4,000.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 13,216.55 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 23,943.54 | 41,160.09 |
| 9 | හොංකොන් ඇන්ඩ් ෂැංග්හයි බැංකුව | සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 8,319.56 | |
| | | සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම | 30,440.13 | 38,759.69 |
| 10 | චීනයේ කර්මාන්තත්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 13,142.20 | 13,142.20 |
| 11 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය | සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 134,227.07 | 134,227.07 |
| 12 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 17,380.43 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 7,745.36 | 25,125.79 |
| 13 | ඉන්දියානු එක්සිම් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 48,385.38 | 48,385.38 |
| 14 | චීන සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 11,774.35 | 11,774.35 |
| 15 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 87,647.85 | 87,647.85 |
| 16 | සම්පත් බැංකුව | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 | 14,500.00 |
| 17 | ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුව AG | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 11,422.95 | 11,422.95 |
| 18 | අයි එන් ජී බැංකුව, නෙදර්ලන්තයේ එන්වී | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 18,726.39 | 18,726.39 |
| 19 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2,261.88 | 2,261.88 |
| 20 | සීමාසහිත චයිනා ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගම | ලංකා ඛනිජ තෙල් සංස්ථාව | 8,251.15 | 8,251.15 |
| 21 | ඩීබී භාරකරුවන් (හොංකොං) ලිමිටඩ් | සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවය | 32,985.75 | 32,985.75 |
| | එකතුව | | 1,317,454.65 | 1,317,454.65 |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

### වගුව 1 : මූලික අංශයන්හි වර්ධන අනුපාතය %

| | 2018 | 2019 | 2020 පළමු කාර්තුව දක්වා (අ) |
|---|---|---|---|
| ද.දේ.නි. | 3.3 | 2.3 | -1.6 |
| කෘෂිකර්මාන්තය | 6.5 | 0.6 | -5.6 |
| කර්මාන්ත | 1.2 | 2.7 | -7.8 |
| සේවා | 4.6 | 2.3 | 3.1 |
| උද්ධමනය - ද.දේ.නි. අවධමනකය (%) | 4.3 | 2.2 | 3.6 |
| සේවා නියුක්ති අනුපාතය (%) | 4.4 | 4.8 | 5.7 |

*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### වගුව 2: කෘෂිකාර්මික අංශයන්හි ක්‍රියාකාරිත්වය

| අංශය | 2018 | 2019 | 2020 (අ) කාර්තු 1 | 2020 (අ) කාර්තු 2 |
|---|---|---|---|---|
| තේ (කි. ග්‍රෑම් මිලියන) | 303. 80 | 300. 10 | 53. 20 | 75. 40 |
| වර්ධනය (%) | - 1. 00 | - 1. 20 | - 27. 40 | - 11. 10 |
| රබර් (කි. ග්‍රෑම් මිලියන) | 82. 60 | 74. 80 | 17. 90 | 19. 70 |
| වර්ධනය (%) | - 0. 60 | - 9. 50 | - 16. 60 | - 2. 90 |
| පොල් (ගෙඩි මිලියන) | 2623. 10 | 3085. 60 | 679. 30 | 688. 50 |
| වර්ධනය (%) | 7. 10 | 17. 60 | - 12. 60 | - 13. 10 |
| මත්ස්‍ය (මෙ. ටොන්)'000 | 527. 10 | 505. 80 | 118. 90 | 75. 80 |
| වර්ධනය (%) | - 0. 80 | - 4. 00 | - 10. 70 | - 37. 60 |
| | මහ | යල | මහ | |
| වී (මෙ.ටොන්)'000 | 3072. 60 | 1519. 40 | 3196. 70 | |

*මූලාශ්‍රය: ජනාලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### වගුව 3 : කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය

රු. මිලියන

| අංශය | 2018 | 2019 | 2020 (අ) කාර්තු 1 |
|---|---|---|---|
| ආහාරපාන හා දුම්කොළ නිෂ්පාදනය | 556, 140 | 574, 888 | 174, 434 |
| වර්ධන අනුපාතය | 4. 0 | 3. 4 | 2. 8 |
| රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 314, 442 | 326, 803 | 98, 723 |
| වර්ධන අනුපාතය | 3. 4 | 3. 9 | ( 13. 6) |
| රසායනික ද්‍රව්‍යසහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 96, 761 | 100, 511 | 21, 339 |
| වර්ධන අනුපාතය | 3. 4 | 3. 9 | ( 10. 1) |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 88, 147 | 83, 009 | 10, 447 |
| වර්ධන අනුපාතය | 2. 3 | ( 5. 8) | ( 11. 6) |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 85, 031 | 85, 341 | 21, 471 |
| වර්ධන අනුපාතය | 9. 3 | 0. 4 | ( 0. 6) |
| ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 100, 302 | 100, 797 | 30, 633 |
| වර්ධන අනුපාතය | 2. 4 | 0. 5 | ( 6. 7) |
| **කාර්මික අංශයේ එකතුව** | **2, 540, 315** | **2, 608, 211** | **679, 127** |
| **කාර්මික අංශයේ සමස්ත වර්ධනය** | **1. 2** | **2. 7** | **( 7. 8)** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

වගුව 4 : අපනයන කාර්යසාධනය: 2019-2020

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2019 ජන. - අගෝ. | 2020 ජන. - අගෝ. (අ) |
|---|---|---|
| **කෘෂිකාර්මික නිෂ්පාදන** | **1, 667** | **1, 516** |
| තේ | 915 | 806 |
| රබර් | 19 | 18 |
| පොල් නිෂ්පාදන | 232 | 222 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 502 | 471 |
| **කෘෂිකාර්මික නිෂ්පාදන** | **6, 330** | **4, 905** |
| රෙදිපිළි හා ඇඟළුම් | 3, 737 | 2, 853 |
| ඛනිජ තෙල් | 328 | 268 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 2, 266 | 1, 784 |
| **ඛනිජ අපනයන** | **21** | **14** |
| **අනෙකුත් අපනයන** | **11** | **9** |
| **මුළු අපනයන** | **8, 030** | **6, 445** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංක-ව*

*(අ) තාවකාලික*

වගුව 5 : ආනයන කාර්ය සාධනය 2019- 2020

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2019 ජන. - අගෝ. | 2020 ජන. - අගෝ.(අ) |
|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **2, 499** | **2, 300** |
| සහල් | 8 | 6 |
| සීනි | 125 | 162 |
| අනෙකුත් ආහාර නිෂ්පාදන | 784 | 855 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1, 582 | 1, 277 |
| **අතර මැදි භාණ්ඩ** | **7, 380** | **5, 692** |
| ඉන්ධන | 2, 577 | 1, 691 |
| තිරිඟු හා බඩ ඉරිඟු | 203 | 229 |
| පොහොර | 138 | 124 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1, 877 | 1, 457 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 2, 585 | 2, 190 |
| **ආයෝජන භාණ්ඩ** | **3, 002** | **2, 253** |
| **අනෙකුත් ආනයන** | **5** | **11** |
| **එකතුව** | **12, 886** | **10, 257** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*
*(අ) තාවකාලික*

**වගුව 6 : ගෙවුම් ශේෂය - 2020**

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2020 කාර්තු 1 (අ) | කාර්තු 2 (අ) | වාර්ෂික පුරෝකථන (ආ) |
|---|---|---|---|
| **වර්තන ගිණුමේ ශේෂය** | **-244.1** | **-548.4** | **-1,265.0** |
| **වෙළඳ ශේෂය** | **-1,853.0** | **-1,408.7** | **-5,555.0** |
| අපනයන | 2,649.7 | 1,763.1 | 10,245.0 |
| ආනයන | 4,502.7 | 3,171.9 | 15,800.0 |
| **සේවා (ශුද්ධ)** | **797.4** | **103.2** | **925.0** |
| ලැබීම් | 1,986.5 | 562.4 | 4,249.0 |
| ගෙවීම් | 1,189.1 | 459.2 | 3,324.0 |
| **ප්‍රා'ථමික ආදායම් (ශුද්ධ)** | **-578.8** | **-462.4** | **-2,287.0** |
| ප්‍රා'ථමික ආදායම්: බැර | 63.9 | 48.7 | 254.0 |
| ප්‍රා'ථමික ආදායම්: හර | 642.7 | 511.1 | 2,542.0 |
| **ද්විතීක ආදායම් (ශුද්ධ)** | 1,390.4 | 1,219.6 | 5,652.0 |
| ද්විතීක ආදායම්: බැර | 1,600.4 | 1,379.6 | ලැ.නො. |
| ද්විතීක ආදායම්: හර | 210.0 | 160.0 | ලැ.නො. |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **1.1** | **2.5** | **10.0** |
| ප්‍රාග්ධන ගිණුම :බැර | 8.7 | 7.2 | ලැ.නො. |
| ප්‍රාග්ධන ගිණුම : හර | 7.6 | 4.8 | ලැ.නො. |
| **වර්තන සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-243.0** | **-545.9** | **-1,255.0** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | -620.0 | 196.0 | -238.0 |
| **සෘජු ආයෝජන : වත්කම්** | 8.5 | 8.5 | ලැ.නො. |
| **සෘජු ආයෝජන : වගකීම්** | **122.3** | **114.6** | ලැ.නො. |
| **කළඹ ආයෝජන : වත්කම්** | **0.0** | **0.0** | ලැ.නො. |
| ණය සුරැකුම් | **0.0** | **0.0** | ලැ.නො. |
| **කළඹ ආයෝජන : වගකීම්** | **-364.4** | **-214.1** | ලැ.නො. |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | **-25.6** | **-82.7** | ලැ.නො. |
| ණය සුරැකුම් | -338.8 | -131.4 | ලැ.නො. |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **0.0** | **0.0** | ලැ.නො. |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | 432.4 | -294.1 | ලැ.නො. |
| විනිමය සහ තැන්පතු | 86.1 | -64.6 | ලැ.නො. |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | **35.1** | **23.7** | ලැ.නො. |
| අනෙකුත් ලැබීම් | **311.1** | **-253.2** | ලැ.නො. |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | 744.9 | -1,338.8 | ලැ.නො. |
| විනිමය සහ තැන්පතු | -194.6 | -441.4 | ලැ.නො. |
| ණය | 1,205.7 | -410.8 | ලැ.නො. |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | **-29.5** | **-540.5** | ලැ.නො. |
| අනෙකුත් ගෙවීම් | -236.7 | 53.9 | ලැ.නො. |
| විශේෂ ගැනුම් හිමිකම් | 0.0 | 0.0 | ලැ.නො. |
| **වත්කම් සංචිත** | -558.1 | -956.7 | ලැ.නො. |
| **ශුද්ධ වැරදි හා අත්හැරීම්** | -377.0 | 741.9 | ලැ.නො. |
| **සමස්ථ ශේෂය** | **143.3** | **-760.2** | **-1,493.0** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

**වගුව 7 : විදේශ සංචිත**

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2019 අවසන | 2020 - ජූනි | 2020 - ජූලි | 2020 - අගෝ. |
|---|---|---|---|---|
| මුළු විදේශ සංචිත | 10, 401. 9 | 9, 512. 5 | 10, 032. 4 | 10, 345. 3 |
| ආනයන ආවරණය කළ හැකි කාල සීමාව (මාස) | 6. 3 | 6. 3 | 6. 8 | 7. 2 |
| දළ නිල සංචිත | 7, 642. 4 | 6, 694. 6 | 7, 095. 8 | 7, 430. 1 |
| ආනයන ආවරණය කළ හැකි කාල සීමාව (මාස) | 4. 6 | 4. 5 | 4. 8 | 5. 1 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**වගුව 8 : ගෙවීමට ඇති විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණය**

ඇ.ඩො. මිලියන

| අයිතම | 2020 අගෝස්තු අවසාන (අ) |
|---|---|
| **ගෙවීමට ඇති සම්පූර්ණ ණය** | **39, 181. 24** |
| රජයේ විදේශ ණය (ආ) (ඇ) | 35, 333. 96 |
| ඩොලර් මත පදනම් වූ දේශීය ණය | **3, 847. 28** |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDBs) | 2, 552. 28 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (FCBUs) | 1, 295. 00 |

*මූලාශ්‍රය:* ශ්‍රී ලංකා මහ බැංකුව

*(අ) තාවකාලික*

*(ආ) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, විදේශ ව්‍යාපෘති ණය සහ ඒකාබද්ධ ණය, විදේශයන්හි ද භාණ්ඩාගාර බැඳුම්කර*

(ඇ) විදේශ විනිමය අනුපාතය-ඇ.ඩො.1 = 186. 1575 ( 2020. 08. 31)

**වගුව 9 : විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් නොපියවූ දේශීය ණය**

ඇ.ඩො. මිලියන

| | 2019 අවසානය | 2020 සැප්තැම්බර් අවසානය |
|---|---|---|
| **නොපියවූ ණය** | **4, 009. 37** | **3, 847. 28** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | 925. 00 | 1, 295. 00 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 3, 084. 37 | 2, 552. 28 |
| **ලැබීම් (ආ)** | **345. 22** | **420. 21** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | - | - |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක(අ) | 345. 22 | 420. 21 |
| **ගෙවීම් (ඇ)** | **621. 83** | **952. 30** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | - | - |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර(ආ) | 621. 83 | 952. 30 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) මෙම කාලපරිච්ඡේදයේදී ලැබීම් යනු නිකුත් කිරීම් වේ.*

*(ආ) මෙම කාලපරිච්ඡේදයේ ගෙවීම් යනු කල්පිරීම් වේ.*

**වගුව 10 : තෝරාගත් විදේශ විනිමය අනුපාතියන්ගේ විචලනය (ඇ.ඩොලරයට සාපේක්ෂව)**

| මුදල් ඒකක | අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) | |
|---|---|---|
| | **2018 අවසානය -2019 අවසානය** | **2019 අවසානය - 2020 සැප්තැම්බර්** |
| ශ්‍රී ලංකා රුපියල් | 0. 61 | - 2. 10 |
| ඉන්දියන් රුපියල් | - 1. 95 | - 3. 31 |
| බංගලාදේශ ටකා | - 1. 51 | 0. 11 |
| පාකිස්ථානු රුපියල් | - 9. 67 | - 6. 45 |
| සිංගප්පූරු ඩොලර් | 1. 40 | - 1. 51 |
| තායිලන්ත බාත් | 9. 07 | - 5. 75 |
| තායිවාන් ඩොලර් | 1. 91 | 3. 45 |
| ඉන්දුනීසියානු රුපියා | 4. 05 | - 6. 68 |
| පිලිපීන පෙසෝ | 3. 65 | 4. 67 |
| කොරියානු වොන් | - 3. 99 | - 0. 84 |
| ජපාන යෙන් | 1. 65 | 2. 80 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**වගුව 11 : ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්**

රු. බිලියන

| කාලපරිච්ඡේදය අවසානයේ | දළ පොත් අගය | ප්‍රති මිලදී ගැනීම් වලින් පසුව පොත් අගය |
|---|---|---|
| 2012 | 154. 0 | 163. 30 |
| 2013 | 3. 1 | 13. 30 |
| 2014 | 123. 5 | 3. 10 |
| 2015 | 104. 8 | 79. 10 |
| 2016 | 331. 40 | 330. 10 |
| 2017 | 9. 90 | 25. 60 |
| 2018 | 45. 80 | 274. 20 |
| 2019 | 74. 70 | 125. 30 |
| 2020 සැප්තැම්බර් අවසානය | 322. 10 | 361. 10 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

වගුව 12 : පුද්ගලික අංශය සඳහා වාණිජ බැංකු මගින් ලබා දී ඇති ණය සංයුතිය - 2020 ජුනි

| | ප්‍රමාණය (රු. මිලියන [අ]) | මුළු මුදලින් % ලෙස |
|---|---|---|
| **1. කෘෂිකාර්මික හා ධීවර** | **468, 657** | **7. 7** |
| *එයින් ...* | | |
| තේ | 94, 406 | 1. 6 |
| රබර් | 24, 253 | 0. 4 |
| පොල් | 26, 531 | 0. 4 |
| වී | 40, 637 | 0. 7 |
| එළවළු සහ පලතුරු වගා කිරීම සහ සුළු ආහාර භෝග | 26, 342 | 0. 4 |
| පශු සම්පත් සහ කිරි ගොවිතැන | 26, 899 | 0. 4 |
| ධීවර | 20, 681 | 0. 3 |
| **2. කර්මාන්ත** | **2, 487, 208** | **40. 9** |
| *එයින් ...* | | |
| ඉදිකිරීම් | 1, 231, 226 | 20. 2 |
| *එයින් ...* | | |
| ... පෞද්ගලික නිවාස මිලදී ගැනීම/ ඉදිකිරීම්/අළුත්වැඩියා කිරීම් | 573, 097 | 9. 4 |
| ... නිල නිවාසය | 87, 999 | 1. 4 |
| ආහාර හා පාන වර්ග | 147, 609 | 2. 4 |
| රෙදිපිළි හා ඇඟලුම් | 252, 119 | 4. 1 |
| දැව හා ලී බඩු ඇතුලත්ව දැව නිෂ්පාදන | 21, 410 | 0. 4 |
| කඩදාසි හා කඩදාසි නිෂ්පාදන | 18, 715 | 0. 3 |
| රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ඖෂධ සහ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 124, 393 | 2. 0 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 23, 707 | 0. 4 |
| මූලික ලෝහ නිෂ්පාදන | 46, 622 | 0. 8 |
| සකස් කල ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 166, 941 | 2. 7 |
| අනෙකුත් නිෂ්පාදන | 23, 429 | 0. 4 |
| **3. සේවා** | **1, 723, 867** | **28. 3** |
| *එයින් ...* | | |
| තොග සහ සිල්ලර වෙළඳාම | 478, 059 | 7. 9 |
| සංචාරක කර්මාන්තය | 252, 306 | 4. 1 |
| මූල්‍ය සහ ව්‍යාපාර සේවා | 370, 358 | 6. 1 |
| ප්‍රවාහනය | 89, 205 | 1. 5 |
| සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය | 62, 799 | 1. 0 |
| මුද්‍රණ සහ ප්‍රකාශන | 26, 564 | 0. 4 |
| අධ්‍යාපන | 14, 981 | 0. 2 |
| සෞඛ්‍ය | 55, 535 | 0. 9 |
| නාවික ගුවන් හා සැපයුම් සහ භාණ්ඩ නිෂ්පාදනය | 22, 419 | 0. 4 |
| **4. පුද්ගල ණය සහ අත්තිකාරම්** | **1, 405, 232** | **23. 1** |
| *එයින් ...* | | |
| කල්පවතින පාරිභෝගික භාණ්ඩ | 223, 718 | 3. 7 |
| උකස් | 220, 940 | 3. 6 |
| ණය කාඩ්පත් | 126, 170 | 2. 1 |
| පුද්ගල අධ්‍යාපනය | 9, 141 | 0. 2 |
| පෞද්ගලික සනීපාරක්ෂාව | 3, 210 | 0. 1 |
| **එකතුව** | **6, 084, 964** | **100. 0** |

*මූලාශ්‍රය:ලංකා බැංකුව*

(අ) තාවකාලික

වගුව 13 : **පොලී අනුපාතවල වෙනස්වීම් 2019- 2020**

| පොලී අනුපාතය | 2019 ජුලි අවසානය | 2019 දෙසැම්බර් අවසානය | 2020 මාර්තු අවසානය | 2020 ජූනි අවසානය | 2020 සැප්. අවසානය |
|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය පොලී අනුපාතය** | | | | | |
| ප්‍රති මිලදී ගැනීම් අනුපාතය | 7. 50 | 7. 00 | 6. 25 | 5. 50 | 4. 50 |
| ප්‍රති විකුණුම් අනුපාතය | 8. 50 | 8. 00 | 7. 25 | 6. 50 | 5. 50 |
| **බර තැබූ සාමාන්‍ය අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතය (AWCMR)** | 7. 70 | 7. 45 | 6. 75 | 5. 52 | 4. 53 |
| **බර තැබූ සාමාන්‍ය විවට වෙළඳපොල වෙන්දේසි අනුපාත (ප්‍රති මිලදී ගැනීම්)** | 7. 67 | 7. 51 | 6. 76 | - | - |
| **බර තැබූ සාමාන්‍ය විවට වෙළඳපොල වෙන්දේසි අනුපාත (ප්‍රති විකුණුම්)** | - | 7. 50 | 6. 76 | 5. 88 | - |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | | | |
| දින - 91 | 7. 85 | 7. 51 | 7. 00 | 5. 50 | 4. 51 |
| දින - 182 | 7. 94 | 8. 02 | 7. 25 | 5. 53 | 4. 64 |
| දින -364 | 8. 21 | 8. 45 | 7. 50 | 5. 66 | 4. 89 |
| **ණය දීමේ අනුපාතය** | | | | | |
| බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය (AWPR) (සතිපතා) | 10. 89 | 9. 74 | 9. 24 | 8. 48 | 6. 19 |
| බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය (AWPR) (මාසික) | 10. 93 | 10. 00 | 9. 35 | 8. 78 | 6. 42 |
| බර තැබූ සාමාන්‍ය ණයදීමේ අනුපාතය (AWLR) | 14. 22 | 13. 59 | 13. 22 | 12. 64 | 11. 21 |
| **තැන්පතු අනුපාතය** | | | | | |
| බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR) | 8. 88 | 8. 20 | 7. 90 | 7. 38 | 6. 44 |
| බර තැබූ සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතය | 10. 97 | 10. 05 | 9. 65 | 9. 00 | 7. 90 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

### 2020-21 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන

2020 ඇස්තමේන්තුව සඳහා වන ආදායම් උපකල්පනI 2020 අගෝස්තු දක්වා එකතු කරන ලද සත්‍ය ආදායම මත සහ කොවිඩ්-19 හි බලපෑම ඇතුළු නැගී එන ප්‍රවණතා මත පදනම් වී ඇත. රාජ්‍යයන් පුරා පැතිරෙන කොවිඩ්-19 සමග උපකල්පන වඩාත් තීරණාත්මක බවට පත් වී ඇත. කොවිඩ්-19 හි බලපෑම, රටේ බදු ක්‍රමය සහ ආර්ථික සහ ආදායම් ක්‍රියාකාරිත්වය පිළිබඳ කාර්ය මණ්ඩලයන්ගේ සුදුසු විනිශ්චය අනුව 2021 වසර සඳහා වන ආදායම් ප්‍රක්ෂේපන ආර්ථික ප්‍රවණතා පදනම් වී ඇත.

පුළුල් උපකල්පන පහත පරිදි වේ.

- ලොව පුරා කොවිඩ්-19 වසංගත තත්වයේ බලපෑම මත දේශීය හා බාහිර ක්‍රියාකාරකම් සඳහා පීඩනය වැඩි කරමින් 2020 දී ආර්ථිකය සියයට 1.5 ක ප්‍රතිශතයකින් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- නව දේශපාලන ස්ථාවරත්වයෙන් වැඩි දියුණු වූ ආයෝජකයින්ගේ සහ පාරිභෝගික විශ්වාසය සමඟින් ඇති වූ රජයේ සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ පාලක පියවරයන්හි පහසුව සමග 2021 දී ආර්ථිකය සියයට 5.0 ක් දක්වා විභව නිමැවුම් මට්ටම කරා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ප්‍රමුඛ යටිතල පහසුකම් සංවර්ධනයත් තුළින් ගෘහස්ථ කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි වීම මගින් ඉහළ ආදායමක් හා වැඩි රැකියාවන් ප්‍රමාණයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන අතර එය ආර්ථිකයේ ඵලදායී ධාරිතාව ඉහළ නංවනු ඇත.

- 2020 සහ 2021 දී පාරිභෝගික මිල උද්ධමනය මැද තනි අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2020 දී විරැකියා අනුපාතය සියයට 5.0 ක පමණ ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කරන අතර 2021 දී එය සියයට 4.0 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- අගය එකතු කළ විවිධාංගීකෘත නිෂ්පාදන සමග අපනයන අංශය පුළුල් කිරීම සඳහා රජය දක්වන කැපවීම මගින් විදේශ වෙළඳ පරතරය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, වෙළඳ ආතතීන්, මූල්‍ය තත්වයන් සහ කොවිඩ්-19 පැතිරීම නිසා ඇතිවන ගෝලීය ආර්ථික අවදානම් විදේශ අංශය උඩු යටිකුරු කරයි.

- විශේෂයෙන් එක්සත් ජනපදය හා ඉන්දියාව වැනි ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ විශාල විදේශ ඉල්ලුම සමඟ අපනයනවල වර්ධනය අඛණ්ඩව ඉදිරියට යනු ඇතැයි අපේක්ෂා කරන අතර දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල වේගවත් දියුණුවක් සඳහා ද උපකාරී වේ.

- ඉහළ අපනයන වර්ධනයට සහ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයෝජන සහ අතරමැදි භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් සමඟ ආනයන සාපේක්ෂව ඉහළ වර්ධනයක් වාර්තා කරනු ඇත.

- ඉහළ විදේශ සංචිතයක් රට තුල පවත්වා ගනිමින් ස්ථාවර විනිමය අනුපාතයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ.

- අඩු පොලී අනුපාතයට අනුරූපව ඇති වන දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රබල දියුණුව හේතුවෙන් දේශීය ඉල්ලුම වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2021 දී මුදල් සැපයුමේ වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.6 ක් පමණ අපේක්ෂිත නාමික වර්ධනය සමග අනුකූල මට්ටමින් පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

- විශාල බදු පරිපාලන ඒකකය (LTA), ඉහළ ආයතනික ඒකකය (UCU), මධ්‍යම ආයතනික ඒකකය (MCU) සහ ප්‍රාදේශීය ආයතනික ඒකකය (RCU) වැනි බදු ගෙවන්නන්ගේ කොටස් කරණ මට්ටම් හඳුන්වාදීම මගින් බදු ආදායම වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

- විශේෂයෙන්ම ඩිජිටල්කරණය, ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සහ සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතිය (ERMS) වැනි ක්‍රමයෙන් ස්ථාපිත බදු ක්‍රම හඳුන්වාදීම රටෙහි අපේක්ෂිත ආදායම උත්පාදනය කිරීමට උපකාරී වනු ඇත.

- ආනයන හා අපනයන යන දෙකම සඳහා රේගු නිෂ්කාශන ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම පාරිභෝගික තෘප්තිය සහ ආදායම වැඩි කිරීමට උපකාරී වේ. ශ්‍රී ලංකා රේගුවේ රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) ආනයනකරුවන් සහ අපනයනකරුවන් යන දෙපාර්ශවයටම

වැඩි දියුණු කළ සේවාවක් සැපයීමට සහ රජයේ ආදායම වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) රජයේ සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කරනු ඇත.

කොවිඩ්-19 ආශ්‍රිත උපකල්පන

- පොකුරු නිර්මාණය වීම මගින් කොවිඩ් -19 පැතිරීම මැඩපැවත්වීම සිදු වෙතැයි අපේක්ෂා කෙරේ.
- නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥා පනතේ (553 වන අධිකාරය) විධිවිධාන අනුව පනවා ඇති සීමාවන් සහ සමාජ දුරස්ථභාවය පවත්වාගැනීම, නිවසේ සිට වැඩ කිරීම ඇතුළු වැළැක්වීමේ පියවර මේ සඳහා එන්නතක් සොයා ගන්නා තෙක් අඛණ්ඩව පවතී.
- ජාත්‍යන්තර සංචාරක මෙහෙයුම් අඩුවනු ඇතැයි අපේක්ෂා කරන අතර 2021 දී ක්‍රමයෙන් සංචාරක කර්මාන්තය යතා තත්ත්වයට පත් වීම සිදුවනු ඇත.
- 2020 දී විදේශ රැකියා පහත බසිනු ඇතැයි බලාපොරොත්තු වන අතර ඉන් අනතුරුව ක්‍රමික වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

**වගුව 1 : මෝටර් රථ වාහන සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ව්‍යුහය (2020.09.30 දිනට)**

| අයිතමය/ එන්ජින් ධාරිතාවය | | අනුපාතය |
|---|---|---|
| **(i) මෝටර් කාර් - පෙට්‍රල්** | | |
| සිලින්ඩර ධාරිතාවය | 1000 ට අඩු | ට රු. 1,650,000/- හෝ ඝන සෙන්ටිමීරයකට රු. 2,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 1000 - 1300 | ඝන සෙන්ටිමීරයකට රු. 3,200/- |
| සිලින්ඩර ධාරිතාවය | 1300 - 1500 | ඝන සෙන්ටිමීරයකට රු. 3,700/- |
| සිලින්ඩර ධාරිතාවය | 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 4,250/- |
| සිලින්ඩර ධාරිතාවය | 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 5,300/- |
| සිලින්ඩර ධාරිතාවය | 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 6,350/- |
| සිලින්ඩර ධාරිතාවය | 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 7,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |
| සිලින්ඩර ධාරිතාව | 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 11,000/- |
| **(ii) මොටර් කාර් - ඩීසල්** | | |
| සිලින්ඩර ධාරිතාවය | 1500 ට අඩු | ඝන සෙන්ටිමීරයකට රු. 4,600/- |
| සිලින්ඩර ධාරිතාවය | 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 5,750/- |
| සිලින්ඩර ධාරිතාවය | 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 6,900/- |
| සිලින්ඩර ධාරිතාවය | 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 11,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 12,000/- |
| **(iii) මෝටර් කාර් - දෙමුහුන් - පෙට්‍රල්** | | |
| සිලින්ඩර ධාරිතාවය | 1000 ට අඩු | ඒකකයකට රු. 1,500,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 1000 - 1300 | ඝන සෙන්ටිමීරයකට රු. 2,300/- |
| සිලින්ඩර ධාරිතාවය | 1300 - 1500 | ඝන සෙන්ටිමීරයකට රු. 2,850/- |
| සිලින්ඩර ධාරිතාවය | 1500 - 1600 | ඝන සෙන්ටිමීරයකට රු. 4,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 1600 - 1800 | ඝන සෙන්ටිමීරයකට රු. 5,200/- |
| සිලින්ඩර ධාරිතාවය | 1800 - 2000 | ඝන සෙන්ටිමීරයකට රු. 5,700/- |
| සිලින්ඩර ධාරිතාවය | 2000 - 2500 | ඝන සෙන්ටිමීරයකට රු. 6,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2500 - 2750 | ඝන සෙන්ටිමීරයකට රු. 7,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 2750 - 3000 | ඝන සෙන්ටිමීරයකට රු. 8,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 3000 - 4000 | ඝන සෙන්ටිමීරයකට රු. 9,000/- |
| සිලින්ඩර ධාරිතාවය | 4000 ට වැඩි | ඝන සෙන්ටිමීරයකට රු. 10,000/- |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 2 : දුම්වැටි සඳහා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) ව්‍යුහය (2020.09.30 දිනට)**

රුපියල් /1000 කට

| | |
|---|---|
| දුම්වැටි 1 ක දි මි.මී. 60 නොඉක්මවන | 13, 360 |
| දුම්වැටි 1 ක දි මි.මී. 60 ඉක්මවන එහෙත් මි.මී.67 නොඉක්මවන | 22, 300 |
| දුම්වැටි 1 ක දි මි.මී. 67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන | 37, 650 |
| දුම්වැටි 1 ක දි මි.මී. 72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන | 43, 100 |
| දුම්වැටි 1 ක දි මි.මී. 84 ඉක්මවන | 48, 350 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 3 : ඛනිජ තෙල් සඳහා වන නිෂ්පාදන බදු අනුපාත ව්‍යුහය (2020. 09. 30)**

| අයිතමය | ලීටරයට රු. |
|---|---|
| පෙට්‍රල් | 27. 00 |
| ඩීසල් - ඔටෝ | 6. 00 |
| ඩීසල් - සුපර් | 13. 00 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 4 : සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු ව්‍යුහය (2020.09.30 දිනට)**

| වර්ගීකරණය | බදු අනුපාතය (රු.) |
|---|---|
| **මත්පැන්** | |
| මොලැසස්, තල්, පොල් සහ පදම් කළ අරක්කු (මධ්‍යසාර සෑම ලීටරයකටම) | 4,050 |
| මෙරට සෑදූ විදේශීය මත්පැන් (මධ්‍යසාර සෑම ලීටරයකටම) | 4,150 |
| ධාන්‍ය මත්පැන් ( මධ්‍යසාර සෑම ලීටරයකටම) | 3,200 |
| තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් පැලෑටියකින් ගන්නා ස්වාභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තළින් නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් මධ්‍යසාර ( මධ්‍යසාර සෑම ලීටරයකටම) | 3,200 |
| **එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමු ද්‍රව්‍ය** | |
| පොල් රා (තොග ලීටරයක් සඳහා) | 5 |
| මොලැසස් (තොග කි. ගෑමයක් සඳහා) | 10 |
| ආසවනය මගින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සහල් (තොග කි. ගෑමයක් සඳහා) | 10 |
| ආසවනය මගින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන ඉරිඟු (තොග කි. ගෑමයක් සඳහා) | 10 |
| ආසවනය මගින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන පළතුරු (තොග කි. ගෑමයක් සඳහා) | 10 |
| **විදේශ මත්පැන්** | |
| ආනයනික ධාන්‍ය මත්පැන් (බියර්) (තොග ලීටරයක් සඳහා) | 135 |
| ආනයනික වයින් (තොග ලීටරයක් සඳහා) | 230 |
| අනෙකුත් ආනයනික විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් හා වයින් හැර)(තොග ලීටරයක් සඳහා) | 650 |
| පානීය නොවන ස්ප්‍රිතු (තොග ලීටරයක් සඳහා) | |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 5 : වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද (2020. 09. 30)**

| අයිතමය | අනුපාතය |
|---|---|
| සාමාන්‍ය අනුපාතය | 10. 0% |
| සහනදායී අනුපාතය | 7. 5% 5. 0% 2. 5% |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 6 : එකතු කළ අගය මත බදු (VAT)**

| අනුපාතය | අයිතමය |
|---|---|
| ශුන්‍ය අනුපාතය | අපනයන භාණ්ඩ |
| සම්මත අනුපාතය (15%) | පොදු අයිතම |
| නිදහස් කිරීම් | එකතු කළ අගය මත බදු පනතේ ගෙවීමෙන් නිදහස් ලේඛණයේ සඳහන කර ඇති භාණ්ඩ හා සේවා |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 7 : ආනයන රේගු බදු ව්‍යුහය (2020. 09. 30 දිනට)**

| අයිතමය | අනුපාතය |
|---|---|
| මූලික අමුද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර | ශුන්‍ය |
| අර්ධ නිමි අයිතම සහ අතර මැදි භාණ්ඩ | 15% |
| නිමි භාණ්ඩ සහ සුඛෝපභෝගී භාණ්ඩ | 30% |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 8 : බදු කුලී ආදායම**

| අයිතමය | 2018 | 2019 (තාවකාලික) | 2020 (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|
| රජයේ ගොඩනැගිලි සහ නිවාස මත බදු කුලී | 964 | 1, 069 | 1, 100 |
| රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම් | 1, 907 | 1, 837 | 1, 500 |
| ඉඩම් සහ අනෙකුත් බදු කුලී | 55 | 111 | 100 |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී | 873 | 754 | 1, 500 |
| අනෙකුත් | 1, 792 | 956 | 8, 800 |
| **මුළු බදු කුලී ආදායම** | **5, 591** | **4, 727** | **13, 000** |

**වගුව 9 : ගාස්තු සහ අයකිරීම්**

| | 2018 | 2019 (තාවකාලික) | 2020 (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|
| රජයේ මුද්‍රණාලය විසින් කරනු ලබන සේවා සඳහා අයකිරීම් | 866 | 1, 118 | 1, 000 |
| ගමන් බලපත්‍ර,වීසා සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු | 17, 258 | 14, 054 | 8, 000 |
| විභාග සහ අනෙකුත් ගාස්තු | 287 | 325 | 300 |
| මෝටර් රථ පනත යටතේ ගාස්තු සහ අනෙකුත් ලැබීම් | 10, 433 | 10, 289 | 7, 500 |
| අනෙකුත් විවිධ මූලාශ්‍රයන්ගෙන් ලැබෙන මුදල් | 31, 692 | 32, 032 | 24, 500 |
| **එකතුව** | **60, 536** | **57, 818** | **41, 300** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

වගුව 10 : **විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත**

කි. ග්‍රෑමයට රු.

| | අයිතමය | 2019 සැප්. අවසානයට | 2020 සැප්. අවසානයට |
|---|---|---|---|
| 1 | හාල්මැස්සන් | 1 | 1 |
| 2 | අල | 50 | 55 |
| 3 | රතුළූනු | 25 | 50 |
| 4 | බී - ළූනු | 40 | 50 |
| 5 | සුදු ළූනු | 40 | 50 |
| 6 | වටානා - සම්පූර්ණ | 5 | 5 |
| | වටානා - පියලි කළ | 8 | 10 |
| 7 | කඩල - සම්පූර්ණ | 2 | 5 |
| | කඩල - පියලි කළ | 5 | 10 |
| 8 | මුංඇට | 40 | 40 |
| 9 | මයිසූර් පරිප්පු - සම්පූර්ණ | 2 | 5 |
| | මයිසූර් පරිප්පු - පියළි කළ | 7 | 10 |
| 10 | මිරිස් - නොඇඹරූ හෝ කුඩු නොකළ | 25 | 100 |
| | මිරිස් - ඇඹරූ හෝ කුඩු කළ | 125 | 125 |
| 11 | ටින් මාළු | 50 | 100 |
| 12 | සුදු සීනි | 32 ( සුදු) | |
| | දුඹුරු සීනි | 35 ( දුඹුරු) | 50 |
| 13 | උඳු- සම්පූර්ණ | 200 | 200 |
| | උඳු - පොත්ත රහිත | - | 300 |
| 14 | කව්පි | 70 | 70 |
| 15 | කුරක්කන් | 70 | 70 |
| | මෙනේරි/ අනෙකුත් | 70 | 70 |
| 16 | උඹලකඩ | 102 | 102 |
| 17 | කරවල | 52 | 52 |
| 18 | නැවුම් දොඩම් | 80 | 125 |
| 19 | නැවුම් මිදි | 130 | 200 |
| 20 | නැවුම් ඇපල් | 60 | 100 |
| 21 | කොත්තමල්ලි - නොඇඹරූ හෝ කුඩු නොකළ | 26 | 26 |
| | කොත්තමල්ලි - ඇඹරූ හෝ කුඩු කළ | 52 | 52 |
| 22 | සූදුරු | 162 | 162 |
| 23 | මහදුරු | 162 | 162 |
| 24 | කහ - නොඇඹරූ හෝ කුඩු නොකළ | 102 | 102 |
| | කහ - ඇඹරූ හෝ කුඩු කළ | 360 | 360 |
| 25 | උළුහාල් | 50 | 50 |
| 26 | කුරක්කන් පිටි | 150 | 150 |
| 27 | උඳු පිටි | 200 | 325 |
| 28 | රටකජු | 112 | 220 |
| 29 | අබ ඇට | 62 | 62 |
| 30 | පාම් තෙල්/එලවළුතෙල් - පිරිපහදු නොකළ | 175 | 250 |
| | පාම් ඔලෙයින් | 180 | 255 |
| | පාම් තෙල් - පිරිපහදු කළ | 200 | 275 |
| | එලවළුතෙල් - පිරිපහදු කළ | 195 | 275 |
| | පාම් මද තෙල් | 195 | 250 |
| | පාම් මද ඉවත් කළ තෙල් | 210 | 275 |
| | පොල්තෙල් - පිරිපහදු නොකළ | 195 | 150 ( බදු නිදහස්- 25) |
| | පොල්තෙල් - පිරිපහදු කළ | 195 | 175 ( බදු නිදහස් - 25) |
| 31 | මාළු | 10 % හෝ රු. 100 | 10 % හෝ රු. 150 |
| 32 | මැකරල් | 6 | 6 |
| | ජැක්/හොර්ස් මැකරල් | - | 6 |
| 33 | යෝගට් | 625 | 800 |

| | | | |
|---|---|---|---|
| 34 | බටර් | 880 | 880 |
| 35 | මාගරීන් මේදය 80% වැඩි | 215 | 650 |
| | මාගරීන් අනෙකුත් | 315 | 650 |
| 36 | ලූණු | 40 | 40 |
| 37 | රටඉඳි | 80 | 100 |
| 38 | වියලි මිදි | 230 | 200 |
| 39 | මැංගුස්ටින් | 200 | 200 |
| 40 | වියලි දොඩම් | 200 | 125 |
| 41 | පෙයාර්ස් | 175 | 220 |
| 42 | චෙරි | 250 | 315 |
| 43 | ප්ලම්ස් සහ ස්ලෝස් | 200 | 250 |
| 44 | කිවි පළතුරු | 175 | 175 |
| 45 | දෙළුම් (වෙනත්) | 200 | 200 |
| 46 | පෙරන් ගාන ලද/පිටි කරන ලද කේජු | 200 | 200 |
| 47 | බඩ ඉරිඟු | 10 | 25 |
| 48 | මුහුණු ආවරණ | - | 1 |
| 49 | ක්ලෙමන්ටයින්ස් - නැවුම් | - | 120 |
| 50 | ක්ලෙමන්ටයින්ස් -වියලි | - | 250 |
| 51 | අනෙකුත් (සිට්රස්) පළතුරු - නැවුම් | - | 120 |
| 52 | අනෙකුත් (සිට්රස්) පළතුරු - වියලි | - | 250 |
| 53 | ග්‍රේප් පෘට් - නැවුම් | - | 285 |
| 54 | ග්‍රේප් පෘට්-වියළි | - | 300 |
| 55 | දෙහි - නැවුම් | - | 350 |
| 56 | දෙහි - වියළි | - | 400 |
| 57 | අනෙකුත් (සිට්රස්) පළතුරු - නැවුම් | - | 300 |
| 58 | අනෙකුත් (සිට්රස්) පළතුරු - වියලි | - | 375 |
| 59 | වීසස් | - | 350 |
| 60 | ඇප්‍රිකට් | - | 350 |
| 61 | චෙරි - ඇඹුල් | - | 330 |
| 62 | පීච්ස් සහ නෙක්ටරීන් | - | 310 |
| 63 | එලවළු මේදය සහ තෙල් | - | 600 ( බදු නිදහස් රු. 440) |
| 64 | මාගරින් - දියර | - | 600 ( බදු නිදහස් රු. 400) |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

වගුව 11 : රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම සහ 2020 වර්ෂය සඳහා ඇස්තමේන්තුව

රු. මිලියන

| | | 2018 | 2019 | සංශෝධිත ඇස්තමේන්තුව 2020 |
|---|---|---|---|---|
| | **අයබදු** | **37, 230** | **22, 833** | **30, 961** |
| 1 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 500 | 2, 000 | 1, 500 |
| 2 | ලංකා බැංකුව | 4, 500 | - | 3, 403 |
| 3 | මහජන බැංකුව | 3, 200 | 2, 200 | 4, 500 |
| 4 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | | 169 | 198 |
| 5 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | - | - |
| 6 | විදුලි සංදේශ හා නියාමන කොමිසම | 21, 850 | 8, 950 | 16, 000 |
| 7 | රාජ්‍ය දැව සංස්ථාව | 100 | 50 | 50 |
| 8 | ජාතික රක්ෂණ භාර අරමුදල | 2, 750 | 3, 268 | 3, 000 |
| 9 | භූ විද්‍යා හා පතල් කාර්යාංශය | 1, 700 | 2, 300 | 310 |
| 10 | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 25 | 25 | 15 |
| 11 | ආයෝජන මණ්ඩලය | 250 | 250 | 1, 000 |
| 12 | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 800 | 800 | 100 |
| 13 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 50 | - | 50 |
| 14 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | | - | 100 |
| 15 | ජාතික ලොතරැයි මණ්ඩලය | - | - | - |
| 16 | ලංකා විදුලිබල මණ්ඩලය | - | - | - |
| 17 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 15 | 15 | 50 |
| 18 | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය | 25 | 25 | 25 |
| 19 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශය | - | 200 | - |
| 20 | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 1, 000 | 500 | - |
| 21 | ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | - | | - |
| 21 | ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය | 200 | 650 | 200 |
| 22 | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 100 | 50 | - |
| 23 | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 165 | 200 | 200 |
| 24 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ අධිකාරිය | - | 200 | 100 |
| 25 | ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය | - | - | - |
| 26 | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | - | - | - |
| 27 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - | 900 | - |
| 28 | ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය | - | 29 | 160 |
| 29 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | - | | - |
| 30 | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම | - | 53 | - |
| | **අයබදු** | **4, 598** | **5, 024** | **4, 918** |
| 1 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB Fund Management Ltd) | 60 | 60 | 60 |
| 2 | ලංකා බැංකුව (Financial Accounting Unit) | 346 | 346 | 347 |
| 3 | මහජන බැංකුව (Restructuring Bond) | 316 | 316 | 317 |
| 4 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 41 | - | - |
| 5 | ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | - |
| 6 | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | 86 | - | - |
| 7 | කොමර්ෂල් බැංකුව | | 0 | - |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1, 856 | 1, 720 | 2, 000 |
| 9 | ගුවන්තොටුපල සහ ගුවන් සේවා සමාගම | 300 | 500 | 100 |
| 10 | ලංකා ඛණිජ වැලි සමාගම | 35 | 130 | 220 |
| 11 | ලංකා පොස්පේට් සමාගම | 5 | 7 | 5 |
| 12 | ස්වාධීන රූපවාහිනී ජාලය | 12 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 13 | ලංකා ලේලන්ඩ් සමාගම | 45 | 13 | - |
| 14 | රක්නා ආරක්ෂක ලංකා සමාගම | 40 | 37 | 30 |
| 15 | මාන්තායි සෝල්ට් සමාගම | | - | 10 |
| 16 | ලංකා පොහොර සමාගම | 21 | 15 | 32 |
| 17 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 20 | 10 | 10 |
| 18 | පරන්තන් කෙමිකල්ස් සමාගම | 11 | - | 10 |
| 19 | කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | - | - | - |
| 20 | එස්.ටී.සී ජෙනරල් ට්‍රේඩින් සමාගම | - | 5 | 23 |
| 21 | කුරුණෑගල වැවිලි සමාගම | - | 128 | 28 |
| 22 | හලාවත වැවිලි සමාගම | 30 | - | 20 |
| 23 | නමුණුකුල වැවිලි සමාගම | 47 | 28 | 20 |
| 24 | ඇල්පිටිය වැවිලි සමාගම | 18 | 17 | 9 |
| 25 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 795 | 947 | 947 |
| 26 | ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 106 | 133 | 135 |
| 27 | ලංකා විදුලි පුද්ගලික සමාගම | 305 | 501 | 450 |
| 28 | ලංකා කර්මාන්ත වතු සමාගම | 78 | 82 | 55 |
| 29 | නිපුණතා සංවර්ධන අරමුදල | - | - | 9 |
| 30 | සිලෝන් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් | 19 | 23 | 30 |
| 31 | ලංකා සීනි සමාගම | - | - | - |
| 32 | ලංකා ලොජිස්ටික් ලිමිටඩ් | 1 | - | - |
| 33 | ලංකා ත්‍රිපෝෂ සමාගම | - | - | 50 |
| 34 | වෙනත් | 3 | 6 | 1 |
| 35 | ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම | - | | - |
| | **එකතුව** | **41, 828** | **27, 857** | **35, 879** |

*මූලාශ්‍ර : රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*